බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 42

අභිධර්මපිටකයෙහි

02 වන ග්‍රන්ථය

විභඞ්ගප්පකරණ

ප්‍රථම භාගය

ලඞ්කාබෞද්ධ මණ්ඩලයේ ආරාධනයෙන්

ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයේ

සම්මතය පරිදි

පණ්ඩිත, ලබුගම ලඞ්කානන්ද අනුනායක ස්ථවිරයන් වහන්සේ

හා

පණ්ඩිත, කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ

විසින් කරන ලද

පාඨශෝධනය හා සිංහල පරිවර්තනයෙන්

යුක්ත යි.

බු. ව. 2550

ක්‍රි. ව. 2006

Buddha Jayanti Tripitaka Series, Volume 42

The Second Book in the

Abhidhamma-Pitaka

2

VIBHANGAPPAKARANA (I)

With the Sinhala translation by

The Venerable Pandita Labugama Lankānanda Thera
Anunāyaka of the Kōtte Sri Kalyānī Sāmaggrīdharma Mahāsangha Sabhā
Vice Principal of Pravacanōdaya Pirivena, Molligoda, Wādduwa
&
The Venerable Pandita Karahampitigoda Sumanasāra Thera
Mākadawara Vihāra, Hingula

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ මහා ධර්ම දානමය පුණ්‍යකර්මය

“අපාරුතා තේසං අමතස්ස ද්වාරා
යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං”

“කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී”

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල ‘සද්ධා’ නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව (“සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං”) මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !
බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !
ලෝ සත්නට සෙත් වේවා !

"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"
(*යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය*)

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය
මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ
සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද
පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,
සමින්ද රණසිංහ.
2009.06.28

අභිධම්මපිටකෙ

විභඞ්ගප්පකරණං

පඨමො භාගො

අභිධර්මපිටකයෙහි

විභඞ්ගප්‍රකරණය

ප්‍රථම භාගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො ම බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 22 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:22 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

පටුන

CONTENTS

සංස්කාරක නිවේදනය ... ... xxi–xxii

ත්‍රිපිටකසම්පාදකමණ්ඩලය xxiii

සංක්ෂේපනය ... ... xxv-xxxii

සඞ්කේත නිරූපණය – ABBREVIATIONS xxxiii

පාළි හෝඩිය – PALI ALPHABET xxxiv

විෂය සූචි ... ... xxxv-xxxvi

පෙළ හා පරිවර්තනය 2–401

විශේෂපදානුක්‍රමණිකා 403–408

සංස්කාරක නිවේදනය

ත්‍රිපිටක පාළියෙහි අභිධර්ම සප්තප්‍රකරණයට අයත් ග්‍රන්ථයන් අතුරෙහි **විභඞ්ගප්පකරණය** දෙවැනි ග්‍රන්ථය යි. මෙය **ඛන්ධවිභඞ්ගය** ආදි කොට, ධම්මහදයවිභඞ්ගය අවසන් කොට ඇති අටළොස් විභඞ්ගයෙකින් යුක්ත වෙයි. **බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි** විභඞ්ගප්පකරණය 42, 43 වැනි ග්‍රන්ථවශයෙන් පළවන්නේය. එයින් "ඛන්ධවිභඞ්ගය" පටන් "ඉද්ධිපාදවිභඞ්ගය" අවසන් කොට ඇති විභඞ්ග නවය මෙහි ප්‍රථමභාගය වේ.

ලඞ්කා බෞද්ධමණ්ඩලය විසින් ආරාධිත වැ මේ ප්‍රථමභාගය කටුකුරුන්දේ ශ්‍රී දේවානන්ද නායක ස්ථවිරපාදයන් වහන්සේ විසින් සිංහලයෙන් අනුවාද කරන ලද්දේය. එහෙත් ඒ අනුවාදය ත්‍රිපිටක පරිවර්තන සංස්කාරකමණ්ඩලයෙන් යළි පාඨශොධන සහිත කොට විභඞ්ගප්පකරණය මුළුල්ල සිංහලයෙන් පරිවර්තන කළ මැනැවැයි අප වෙත පැවැරිණ. මහනුවර පත්තිරිප්පුවේ රාජකීය පුස්තකාලයට අයත් පුස්කොළපොත ද, පැල්මඩුල්ලේ පුරාණවිහාරස්ථානයෙහි පුස්කොළපොත ද, සිංහල අක්ෂරයෙන් මුද්‍රණය වූ පොත් දෙකක් ද, එංගලන්තයේ පාළිපොත් සමාගම මගින් මුද්‍රණය කරවනලද පොත ද, සියම්රට තායාක්ෂරයෙන් මුද්‍රිත විභඞ්ගප්පකරණය හා බුරුමරට ඡට්ඨසඞ්ගීතියෙන් ශෝධිත වැ මුද්‍රණය වූ විභඞ්ගප්‍රකරණය ද ඇසුරු කරමින් විභඞ්ගප්පකරණයෙහි පාඨශෝධනය හා සම්පූර්ණ සිංහල පරිවර්තනය ද නිමහම් කරන ලද්දේ ය. මෙහි පාඨශොධනයේ දී ලක්දිවැ මහාවිහාරාන්වයාගත ආචාර්‍යසම්ප්‍රදායෙහි පැවැති විභඞ්ගප්පකරණ වාචනාමාර්ගය නගාගැනීමට අපගේ ප්‍රයත්නය වූ බව ප්‍රකාශ කරම්හ.

මේ අධිකාරයෙහි ලා ධර්ම-විනයෙහි හා ඉතිහාස පුරාවිද්‍යා තර්ක-න්‍යායාදි ශාස්ත්‍රාන්තරයෙහි බැසගත් බුද්ධිප්‍රභා ඇති රාජකීය පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ මුල සිට මැ සහාය වූහ. මෙහි ඇතැම් තැනෙක් ඒ ස්ථවිරයන්ගේ මැ පරිවර්තන වෙයි. තව ද, මෙහි ලා ත්‍රිපිටක සංස්කාරකමණ්ඩලයෙහි ප්‍රධාන සම්පාදක ව සිටි දිවඞ්ගත සිරි වජිරඤාණ නාහිමිපාණන් වහන්සේගේ උපස්ථම්භය ලැබුණුබව ද පවසම්හ.

මුද්‍රණ අවස්ථාවට පැමිණි වර්තමාන ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ සභාපති තැන්පත් අහංගමැ 'විද්‍යාචන්ද්‍ර' පරිවෙණාධිපති පණ්ඩිත කෝදගොඩ සිරි ඤාණාලෝකාභිධාන දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායකස්ථවිරයන් වහන්සේ යැ, 'විද්‍යෝදය' මහපිරුවෙන්හි උප පරිවෙණාධිපති භාවොපගත ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, පණ්ඩිත රද්දූල්ලේ සිරි පඤ්ඤාලෝකාභිධාන අනුනායකස්ථවිරයන් වහන්සේ යැ එ මැ පිරුවෙන්හි ආචාර්‍යභාවොපගත ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, පණ්ඩිත වේඩරුවේ සිරි අනොමදස්සාභිධාන නායකස්ථවිරයන් වහන්සේ යැ

සහ කීර්තිධර මහතෙර වරුන්ගේ ආගමඥනයෙහි නිපුණබව ග්‍රන්ථශොධන-සංස්කරණ කාර්‍යයෙහි ලා අතිශයින් වහල්විය. කොළඹ දිශාවේ ප්‍රධාන සඞ්ඝනායක පණ්ඩිත දෙරගමුවේ ධම්මපාල සථවිරයන් වහන්සේගෙන් ත්‍රිපිටක මණ්ඩලයට ලැබෙන සහාය කෘතඥතාපූර්වකව සඳහන් කළ යුතුය.

තවද ශ්‍රී ලඞ්කා ජනරජයේ ගරු අග්‍රාමාත්‍යවර සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ ත්‍රිපිටක මුද්‍රණකාර්‍යයෙහි ලා දක්වන බලවත් ප්‍රසාදය ද, ගරු සංස්කෘතික අමාත්‍ය ඇස්. ඇස්. කුලතිලක මැතිතුමාණන් හා අමාත්‍යාංශයෙහි ලේකම් හේමසිරි ප්‍රේමවර්ධන මහතාණන් හා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් පී. බී. වේරගොඩ මහතාණන් ගෙන් ලැබෙන පිටුවහල ද අනුස්මරණීය වෙයි. සංස්කෘතික අධ්‍යක්ෂ ඩොනල්ඩ් අබේසිංහ මහතාණන් හා ශ්‍රී ලංකා සංස්කෘතික මණ්ඩලයේ සාහිත්‍ය සංවර්ධන නිලධාරී කේ. ජී. අමරදාස මහතාණන් ප්‍රමුඛ සංස්කෘතික නිලධාරීන් මේ සඳහා දක්වන උද්‍යොගය ප්‍රශංසනීය වෙයි.

රාජ්‍යය පිළිබඳ අපරිමිත කාර්‍යභාරයෙන් සම්බාධ ව ඇති රජයේ මුද්‍රණාලයෙහි අධිපති ඇල්. ඩබ්ලිව්. පී. පීරිස් මහතාණන් ත්‍රිපිටක මුද්‍රණ කාර්‍යාංශයකුදු ඇති කොට ත්‍රිපිටකග්‍රන්ථ මුද්‍රණය සඳහා දෙන අනුබලය හා එම සේවක මහතුන් ඉතා භක්තිමත් ව මුද්‍රණකාර්‍යයෙහි නියුක්තව සිටීම ද බෞද්ධලෝකයාගේ ප්‍රශංසාවට කාරණ වෙයි. එසේම ත්‍රිපිටකකාර්‍යාලය පිහිටි කොළඹ මහානායකවාරිකාරාමයෙහි නියුක්ත ඇම්. ඒ. ආර්. සමරසිංහ මහතාගෙන් ත්‍රිපිටකමණ්ඩලයට රැදෙවෙහි ලැබෙන සාහාය්‍යය ද අනුස්මරණීය වේ.

සදේවක ලෝකයාට වැඩදායක වූ අතිපරිශුද්ධ පර්‍යාප්ති ධර්මය ව්‍යාප්ත කිරීමෙහි යත්න දරන මෙ හැම සුදීහු ද, ත්‍රිපිටක සිංහල පරිවර්තනය සඳහා නන් අයුරින් සහාය දුන් හැම පින්වත්හු ද ධර්මදානමය කුශල බලයෙන් සුඛභාගී වෙත්වයි ආශංසනය කරම්හ.

මෙවගට ශාසනොදයකාරී,

ලබුගම ලඞ්කානන්ද
ත්‍රිපිටකමණ්ඩලයේ ප්‍රධාන සම්පාදක

1975 වෙසක් පුර පසළොස්වක
ත්‍රිපිටකකාර්‍යාලය,
මහානායකවාරිකාරාමය,
115, විජේරාමමාවත,
කොළඹ - 7.

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

උපදේශක :

අග්ගමහාපණ්ඩිත, බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

සභාපති :

අහංගම විද්‍යාචන්ද්‍රපරිවේණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, කෝදා-ගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණලංකායෙහි ප්‍රධාන සංඝනායකස්ථවිරයන් වහන්සේ.

ප්‍රධාන සම්පාදක :

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය, ත්‍රිපිටක වාගීශ්වර, ලබුගම ශ්‍රී ලංකානන්ද—කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සංඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

සම්පාදක :

දෙමටගොඩ ධර්මදූතාශ්‍රමවිද්‍යාලයාධිපති, පණ්ඩිත, පරවාහැර සිරි පඤ්ඤානන්ද (බී. ඒ. ලණ්ඩන්)—කොළඹ නවකෝරළයෙහි ප්‍රධාන සංඝ නායක ස්ථවිරයන් වහන්සේ.

කිරුළපන පූර්වාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, පණ්ඩිත, රද්දූල්ලේ ශ්‍රී ප්‍රඥාලෝක,—කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසංඝ සභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, පණ්ඩිත, වේඩරුවේ ශ්‍රී අනවමදර්ශී නායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ—මාකඩවරවිහාරාධිවාසී, පණ්ඩිත, කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

ලේඛකාධිකාරී :

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝකවිහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල—කොළඹදිශායෙහි ප්‍රධාන සංඝ නායක ස්ථවිරයන් වහන්සේ.

සංඥපනය

අප බුදුන් වදළ තෙවළා බුදුවදන්හි ඇතුළු වැ සිටුනා ප්‍රඥසන්දීපක අනෙකනය ශතසහස්‍රයෙන් ප්‍රතිමණ්ඩිත වූ අභිධර්මපිටකයෙහි සප්තප්‍රකරණයන් අතුරෙහි දෙවැන්න විභඞ්ගප්‍රකරණ නම් වෙයි. මෙහි ලා අභිධර්මය පිළිබඳ වැ කිවමනා දැ බුද්ධජයන්තී ග්‍රන්ථමාලායෙහි ධම්මසඞ්ගණිප්‍රකරණයෙහි ලා කියනලද වන බැවින් දැන් විභඞ්ග ප්‍රකරණය පිළිබඳ වැ වෙසෙසා කිවයුතු දැ පමණක් සැකෙවින් දක්වනුලැබේ.

' විභඞ්ග ' නම් ' විභාග ' යි. සුත්තන්තභාජනිය යැ අභිධම්මභාජනිය යැ පඤ්හ පුච්ඡක යැ යන තුන් නයින් ස්කන්ධාදි ධර්මවිභාග කොට දක්වන බැවින් මේ ' විභඞ්ග ' නමුදු නානා ප්‍රභේදයෙන් භින්න වූ අර්ථයන් ප්‍රකාරයෙන් කියනුලබන හෙයින් ප්‍රකරණ නමුදු වෙයි. මෙහි වාචනාමාර්ගය දම්සෙනෙවි සැරියුත් මහරහතුන් වහන්සේ ප්‍රභව කොට ඇත්තේ යැ. සම්බුදුරදුන් වදළ දහම් නය ගෙන ' ධර්මසඞ්ග්‍රහ ' කෙරෙමින් පන්සියක් අතැවැසියනට ' ධම්මසඞ්ගණි ' ප්‍රකරණය දෙසූ සැරියුත් තෙරණුවෝ යළි ස්කන්ධාදි ' ධර්මවිභාග ' කෙරෙමින් විභඞ්ගප්‍රකරණය දෙසූහ.

පරිච්ඡෙද : මේ ප්‍රකරණයෙහි අටළොස් විභඞ්ගයෙක් වෙයි : ඛන්ධවිභඞ්ග යැ ආයතනවිභඞ්ග යැ ධාතුවිභඞ්ග යැ සච්චවිභඞ්ග යැ ඉන්ද්‍රියවිභඞ්ග යැ පච්චයාකාරවිභඞ්ග යැ සතිපට්ඨානවිභඞ්ග යැ සම්මප්පධානවිභඞ්ග යැ ඉද්ධිපාදවිභඞ්ග යැ බොජ්ඣඞ්ගවිභඞ්ග යැ මග්ගවිභඞ්ග යැ ඣානවිභඞ්ග යැ අප්පමඤ්ඤවිභඞ්ග යැ සික්ඛාපදවිභඞ්ග යැ පටිසම්භිද විභඞ්ග යැ ඤාණවිභඞ්ග යැ ඛුද්දකවත්ථුවිභඞ්ග යැ ධම්මහදයවිභඞ්ග යැ කියා යි.

ඛන්ධවිභඞ්ග : මෙහි පඤ්චස්කන්ධයෝ සුත්තන්තභාජනිය යැ අභිධම්මභාජනිය යැ පඤ්හපුච්ඡක යැ යන තුන් නයින් විභාග කරනලදහ. සුත්තන්තභාජනියෙහි ලා පඤ්ච ස්කන්ධයෝ අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න, අධ්‍යාත්ම, බාහිර, ඖදරික, සූක්ෂ්ම, හීන, ප්‍රණීත, දූර, සන්තික යන එකොළොස් අයුරින් විභක්ත වෙති.

අභිධම්මභාජනියෙහි ලා රූපස්කන්ධයාගේ උද්දෙස පමණක් දක්වනලද්දේ යැ. එහි නිද්දෙස ධම්සඟුණු රූපකාණ්ඩයෙහි විස්තර කරනලද අයුරින් මෙහිදු ගතයුතු වෙයි. උද්දෙසයෙහි එකවිධරූප පටන් කොට ඒකාදශවිධරූප තෙක් රූපධර්මයන් සඞ්ග්‍රහ කොට මාතෘකා තබනලද යැ. එහි ඒකකමාතෘකායෙහි උද්දිෂ්ටපද තෙසාලිසෙකි. ඔවුනතුරෙහි පශ්චිමපදත්‍රය මාතෘකාමුක්ත වෙයි. සෙසු සාලිස් පදයෝ මාතෘකාගතයෝ යි. එක්සිය සතරක් පමණ වූ ද්විකමාතෘකා අතුරෙන් තුදුස් ප්‍රකීර්ණකද්විකයන් ද, එක්සියතුනක් පමණ වූ ත්‍රිකමාතෘකා අතුරෙන් ප්‍රකීර්ණකත්‍රික තුනක් ද, දෙවිසි චතුෂ්කමාතෘකා අතුරෙන් ආදි චතුෂ්ක සතර ද දක්වා නයමුඛ දී අවශෙෂමාතෘකා පෙය්‍යාලමුඛයෙන් සංක්ෂිප්ත කරන ලද යැ. එ හැම ධම්සඟුණු රූපකාණ්ඩයෙහි විස්තෘත අයුරින් මෙහිදු ගතයුතු වෙයි. පඤ්චකය පටන් කොට එකාදශකය තෙක් අමිශ්‍රමාතෘකා තබනලදි.

වෙදනාස්කන්ධනිද්දෙසයෙහි දුකමූලක යැ තිකමූලක යැ උභතොවඩ්ඪක යැ බහුවිධ යැ යි මහාවාර සතරෙක් වෙයි. එහි ත්‍රිකමාතෘකා ගෙන ද්විකමාතෘකායෙහි බහා කළ දේශනා දුකමූලක නම. ද්විකමාතෘකා ගෙන ත්‍රිකමාතෘකායෙහි බහා කළ දේශනා තිකමූලක නම. ද්විකත්‍රිකමාතෘකා දෙපසින් වඩා කළ දේශනා උභතොවඩ්ඪක නම. අවසානයෙහි සප්තවිධ යැ චතුර්විංශද්විධ යැ ත්‍රිංශද්විධ යැ බහුවිධ යැ යන සතර අයුරෙකින් දක්වනලද්දේ බහුවිධවාර නම්.

ද්විකමූලකයෙහි යථායෝග විසින් ලැබෙන පනස් ද්විකධර්මයක් ගෙන එක් එක් ද්විකය හා සමග ත්‍රිකමාතෘකායෙහි වෙදනාත්‍රික යැ ප්‍රීතිත්‍රික යැ සනිදර්ශනත්‍රික යැ යන අලභ්‍යමාන තුන් ත්‍රිකයන් හැරපියා අවශේෂ එකුන්විසි ත්‍රිකධර්මයන් වෙන වෙන යොද දුතියදුකපට්ඨතිකයෝගවාර ආදි විසින් නවසියපනස් වාරයෙක් කියනලද. එ හැම පාළියෙහි නයමුඛ දී හකුළා කියනලද යැ. නයානුසාරයෙන් විස්තර දතයුතු.

ත්‍රිකමූලකයෙහි ලභ්‍යමාන එකුන්විසි ත්‍රිකධර්මයන් ගෙන එක් එක් ත්‍රිකය හා සමග ලභ්‍යමාන පනස් ද්විකධර්මයන් වෙන වෙන යොද පට්ඨත්තිකදුතියදුකයොගවාර ආදි විසින් නවසියපනස් වාරයෙක් කියනලද. එයිදු පාළියෙහි නයමුඛ දී හකුළා කියනලදි. විස්තරවිභාග නයානුසාරයෙන් දතයුතු.

උභතොවඩ්ඪකයෙහි යථායෝග විසින් ලැබෙන එකුන්විසි ද්විකධර්මයන් ලභ්‍යමාන සේ එකුන්විසි ත්‍රිකධර්මයන් හා සමග යොද දුතියදුකපට්ඨතිකයොගවාර ආදි විසින් එකුන් විසි වාරයෙක් කියනලදි.

බහුවිධවාරයාගේ සප්තවිධනිර්දේශයෙහි එකුන්විසි ත්‍රිකධර්මයන් හා සමග සතර භූමි යොද එකුන්විසි වාරයෙක් කියනලද යැ. චතුර්විංශද්විධ නිර්දේශයෙහි දු බහුවිධ නිර්දේශයෙහි දු එකුන්විසි ත්‍රිකයන්ගේ වශයෙන් එකුන්විසි වාරප්‍රභෙද වෙයි. ත්‍රිංශද්විධ වාර එකෙකි. මෙසෙයින් බහුවිධනිර්දේශයෙහි අටපනස් වාරයෙක් වෙයි. මෙසේ වේදනාස්කන්ධනිර්දේශයෙහි සියු මහාවාරයෙහි එක්දහස් නවසිය සත්සැත්තෑ වාරයෙක් වෙ. සංඥාස්කන්ධ, සංස්කාරස්කන්ධ, විඥානස්කන්ධ පිළිබඳ විස්තරවිභාග ද යථායොග වශයෙන් වෙදනාස්කන්ධයෙහි කී නයින් මැ දත්තේ යි.

පඤ්හපුච්ඡකයෙහි පඤ්චස්කන්ධයන් දෙවිසි ත්‍රිකමාතෘකායෙහි දු එක්සිය දෙකක් ප්‍රභෙද වූ ද්විකමාතෘකායෙහි දු ලා ප්‍රශ්න කොට ඒ ඒ ස්කන්ධයන්ගේ කුශලාකුශල අව්‍යාකෘතාදි භාවයෝ ලැබෙන සේ නභා දක්වන ලදහ.

ආයතනවිභඞ්ග : මෙහි දෙළොස් ආයතනයෝ සුත්තන්තභාජනිය යැ අභිධම්ම භාජනිය යැ පඤ්හපුච්ඡක යැ යන තුන් නයින් විභාග කරන ලදහ. විභාගනය ඛන්ධ විභඞ්ගයෙහි මෙනි.

ධාතුවිභඞ්ග : මෙහි අටළොස් ධාතුහු සුත්තන්තභාජනිය යැ අභිධම්මභාජනිය යැ පඤ්හපුච්ඡක යැ යන තුන් නයින් විභාග කරනලදහ. සූත්‍රාන්තයෙහි අටළොස් ධාතු අනෙකෙක, අභිධර්මයෙහි අටළොස් ධාතු අනෙ‍කෙකි. සූත්‍රාන්තභාජනියෙහි අටළොස් ධාතු තුන් ෂට්කයෙකැ ලා සඞ්ගෘහීත වෙයි. එහි පඨවීධාතු ,ආපෝධාතු, තේජෝධාතු, වායෝධාතු, ආකාසධාතු, විඤ්ඤාණධාතු එක් ෂට්කයෙක. සුඛධාතු, දුක්ඛධාතු, සොමනස්සධාතු, දොමනස්සධාතු, උපෙක්ඛාධාතු, අවිජ්ජාධාතු එක් ෂට්කයෙක. කාම ධාතු, ව්‍යාපාදධාතු, විහිංසාධාතු, නෙක්ඛම්මධාතු, අව්‍යාපාදධාතු, අවිහිංසාධාතු එක් ෂට්කයෙකි.

අභිධම්මභාජනියෙහි චක්ඛුධාතු, රූපධාතු, චක්ඛුවිඤ්ඤාණධාතු, සොතධාතු, සද්ද ධාතු, සොතවිඤ්ඤාණධාතු, ඝානධාතු, ගන්ධධාතු, ඝානවිඤ්ඤාණධාතු, ජිව්හාධාතු, රසධාතු, ජිව්හාවිඤ්ඤාණධාතු, කායධාතු, ඵොට්ඨබ්බධාතු, කායවිඤ්ඤාණධාතු, මනොධාතු, ධම්මධාතු, මනොවිඤ්ඤාණධාතු යන මොහු අටළොස් ධාතුහු වෙත්. මෙහි දු විභාග නය ඛන්ධවිභඞ්ගයෙහි මෙනි.

පඤ්හපුච්ඡකයෙහි කුශලාදිභාවය ද ඛන්ධවිභඞ්ගයෙහි කී නයින් මැ දතයුතු. ධම්මධාතු හා මනොවිඤ්ඤාණධාතු හා මෙදෙක චාතුර්භූමක වූවාහු ලෞකිකලොකොත්තර විසින් මිශ්‍ර වැ කියනලදහ. අවශේෂ සොළොස් ධාතුහු කාමාවචර වෙත්.

සච්චවිභඞ්ග : මෙහි සතර සත්‍යයෝ සුත්තන්තභාජනිය යැ අභිධම්මභාජනිය යැ පඤ්හපුච්ඡක යැ යන තුන් නයින් විභක්ත වෙති. සුත්තන්තභාජනියයෙහි ලා ' සතර ආර්‍යසත්‍යයෝ ' යි සප්‍රදෙශ කොට ගෙන උද්දෙස නිද්දෙස විසින් දක්වනලදහ. අභිධම්ම

භාජනියෙහි ලා ' සතර සත්‍යයෝ ' යි නිෂ්ප්‍රදේශ කොට ගෙන විභාග කරනලදහ. ' ආර්‍ය්‍ය සත්‍යයෝ ' යි සප්‍රදේශ කොට කී කල්හි අවශෙෂ ක්ලේශයෝ ද අවශෙෂ කුශල ධර්මයෝ ද සාස්‍රව තුන් කුශලමූලයෝ ද අවශෙෂ සාස්‍රව කුශලධර්මයෝ ද සඞ්ග්‍රහ නො වෙති. දුක්ඛසමුදය හුදෙක් තෘෂ්ණාහෙතුයෙන් මැ වන්නෙ නො වෙයි. යථොක්ත ක්ලෙශාදීහු ද එයට ප්‍රත්‍යය වෙති. එහෙයිනි නිෂ්ප්‍රදෙශ කොට කියනලද්දේ.

සත්‍යනිර්දෙශයෙහි ලා පළමු දුඃඛසත්‍යය නිර්දේශ නො කොට දුඃඛසමුදයසත්‍යය පඤ්චප්‍රකාරයෙකින් නිර්දිෂ්ට යැ. දුඃඛසමුදය නිර්දිෂ්ට කල්හි දුඃඛ නිර්දෙශ පහසු වන හෙයිනි. නිරොධසත්‍යය ද පඤ්චප්‍රකාර සමුදයාගේ ප්‍රහාණ වශයෙන් පස් අයුරෙකින් දක්වන ලද යැ. මාර්ගසත්‍යය පඨමජ්ඣානික සොතාපත්ති මාර්ගයාගේ වශයෙන් ධම්ම සඟුණු පෙළෙහි විභාග කළ දේශනානයෙහි මුඛමාත්‍රයක් දක්වමින් නිර්දිෂ්ට යැ. විස්තර විභාග ධම්මසඟුණුයෙහි ආ සෙයින් දතයුතු.

මෙහි අට්ඨඞ්ගිකවාර යැ පඤ්චඞ්ගිකවාර යැ සබ්බසඞ්ගාහිකවාර යැ යි මහාවාර තුනෙකි. අට්ඨඞ්ගිකවාරයෙහි අෂ්ටාඞ්ගමාර්ගප්‍රතිපද ද පඤ්චඞ්ගිකවාරයෙහි පඤ්චාඞ්ග මාර්ගප්‍රතිපද ද සබ්බසඞ්ගාහිකවාරයෙහි පරොපණ්ණාස සම්ප්‍රයුක්තධර්මප්‍රතිපද ද දක්වන ලදහ. මෙසෙයින් මේ අභිධම්මභාජනිය ත්‍රිවිධ මහාවාරයෙකින් පසළොස් කොට්ඨාස යෙකින් සැටදහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූයේ වෙයි. පඤ්හපුච්ඡකයෙහි කුශලාදි විභාගය ඛන්ධවිභඞ්ගයෙහි කී නයින් දතයුතු.

ඉන්ද්‍රියවිභඞ්ග : මෙහි දෙවිසි ඉන්ද්‍රියධර්මයෝ විභාග කොට දක්වනලදහ. අභිධර්මයෙහි සෙයින් සූත්‍රාන්තයෙහි මේ දෙවිසි ඉන්ද්‍රියයන් පිළිවෙළින් නො එන බැවින් ඉන්ද්‍රියවිභඞ්ගයෙහි සුත්තන්තභාජනිය නො ලැබෙයි. අභිධම්මභාජනිය පඤ්හ පුච්ඡක යන දෙනය පමණක් මෙහි ලැබෙයි. නිද්දෙසවාරයෙහි සැකෙවින් නිර්දිෂ්ට ඉන්ද්‍රියයන්ගේ විස්තරවිභාග ධම්මසඟුණු පදභාජනියෙහි ආ සෙයින් ගතයුතු. මෙහි ඉන්ද්‍රිය යන් සර්වසඞ්ග්‍රාහක බැවින් විරියින්ද්‍රිය සමාධින්ද්‍රිය නිද්දෙසාදියෙහි සම්මාවායාම මිච්ඡා වායාම සම්මාසමාධි මිච්ඡාසමාධි ආදී විසින් නිර්දේශ නො වෙයි. දෙවිසි ඉන්ද්‍රියයන් අතුරෙහි චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය, ඉත්ථි, පුරිස, සුඛ, දුක්ඛ, දොමනස්ස යන ඉන්ද්‍රියයෝ දසදෙන ලෞකික යැ කාමාවචර යි. මනින්ද්‍රිය යැ ජීවිතින්ද්‍රිය යැ උපෙක්ඛින්ද්‍රිය යැ සද්ධින්ද්‍රිය යැ විරියින්ද්‍රිය යැ සතින්ද්‍රිය යැ සමාධින්ද්‍රිය යැ පඤ්ඤින්ද්‍රිය යැ යන අටදෙන චාතුර්භූමක වූවාහු ලෞකිකලෝකොත්තර මිශ්‍ර වෙති. සොමනස්සින්ද්‍රිය කාමාවචර රූපාවචර ලෝකොත්තර විසින් භූමිත්‍රයපර්‍ය්‍යාපන්න වූයේ ලෞකික ලෝකෝත්තර මිශ්‍ර වෙයි. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය යැ අඤ්ඤින්ද්‍රිය යැ අඤ්ඤාතා වින්ද්‍රිය යැ යන තුන් ඉන්ද්‍රියයෝ ලොකොත්තර මැ වෙත්.

පච්චයාකාරවිභඞ්ග : මෙහි ද්වාදශාඞ්ග ප්‍රතීත්‍යසමුත්පාදධර්මයෝ සුත්තන්ත භාජනිය යැ අභිධම්මභාජනිය යැ යන දෙනයින් විභාග වෙති. පඤ්හපුච්ඡක නය මෙහි නො ලැබෙයි. සුත්තන්තභාජනියෙහි ලා ප්‍රත්‍යයාකාරධර්මයෝ උද්දෙස නිද්දෙස විසින් දක්වනලදහ. එහි ප්‍රත්‍යයවිභාග නානාචිත්ත වශයෙනි.

අභිධම්මභාජනියෙහි ලා එකචිත්තක්ඛණික ප්‍රත්‍යයාකාරය දක්වනලද යැ. එහෙයින් සුත්තන්තභාජනියෙහි මෙන් ' අවිජ්ජාපච්චයා සඞ්ඛාරා ' යි බහුවචනනිර්දෙශ නො කොට ' අවිජ්ජාපච්චයා සඞ්ඛාරො ' යි මාතෘකා තබනලදි.

මාතෘකායෙහි මූලපද නවයෙකි : අවිජ්ජා යැ සඞ්ඛාර යැ විඤ්ඤාණ යැ නාම යැ ඡට්ඨායතන යැ ඵස්ස යැ වෙදනා යැ තණ්හා යැ උපාදන යැ කියා යි. මේ නව මූලපද යෙන් අවිජ්ජාදික යැ සඞ්ඛාරාදික යැ විඤ්ඤාණාදික යැ නාමාදික යැ ඡට්ඨායතනාදික යැ ඵස්සාදික යැ වෙදනාදික යැ තණ්හාදික යැ උපාදනාදික යැ යි නව නයෙක් වෙයි. එක් එක් නයෙහි ප්‍රත්‍යයචතුෂ්ක යැ හේතුචතුෂ්ක යැ සම්ප්‍රයුක්තචතුෂ්ක යැ අන්‍යොන්‍ය චතුෂ්ක යැ යි සතර සතර චතුෂ්කයෝ වෙති. එක් එක් චතුෂ්කයෙක් වාර සතරෙකැ සඞ්ගෘහීත වෙයි. මෙසේ නව නයෙහි එක්සිය සියුසාළිස් වාරයෙක් වෙයි.

නයමාතෘකායෙහි අවිජ්ජාමූලක නය පමණක් සපුරා දක්වන ලද්දේ යැ. සඞ්ඛාර මූලකාදිය නාමමාත්‍රයෙන් නිර්දිෂ්ට වෙයි. එ ද අවිජ්ජාමූලක නයානුසාරයෙන් දතයුතු යැ. භවපදයෙහි අවිද්‍යා සඞ්ග්‍රහ වන බැවිනුදු ජාතිජරාමරණ ඇතුළු වන බැවිනුදු කිවයුතු අපූර්වයක් නැති හෙයින් භවමූලක ජාතිජරාමරණමූලක නය නො කියන ලදී.

ප්‍රත්‍යයාකාරනිර්දේශ අකුශලනිර්දෙශ යැ කුශලනිර්දේශ යැ අව්‍යාකෘතනිර්දේශ යැ අවිජ්ජාමූලක කුශලනිර්දේශ යැ කුශලමූලක විපාකනිර්දේශ යැ අකුශලමූලක විපාක නිර්දේශ යැ යි ෂට්ප්‍රකාර වෙයි. නිර්දේශයෙහි ලා චිත්තුප්පාදකාණ්ඩයෙහි මෙන් පළමු කුශලවිභාග නො කොට ' අවිජ්ජාපච්චයා සඞ්ඛාරො ' යි නයමාතෘකායෙහි නික්ෂිප්ත පරිපාටිය අනුව අකුශල විභාගය පළමු කොට කියන ලදී.

අකුශලනිර්දේශ : මෙහි ප්‍රථම අකුශලචිත්තයෙහි ලා සතර චතුෂ්ක ෂොඩශවාර ප්‍රභේද ඇති අවිජ්ජාමූලක නය ප්‍රකාශිත යැ. පාළියෙහි සංක්ෂිප්ත කොට කියන ලද සංස්කාරමූලකාදි සෙසු නය ද මෙ පරිදි මැ දතයුතු. මෙසේ ප්‍රථම අකුශලචිත්තයෙහි නව නයෙක්, සතිස් චතුෂ්කයෙක්, එක්සියසියුසාලිස් වාරයෙක් වෙයි. අවශෙෂ අකුශල චිත්තයන්හි දු මෙතෙක් මැ විභාග වෙයි. මෙහි සෙසු අකුශලචිත්තයන් අතුරෙහි දෘෂ්ටි විප්‍රයුක්තයෙහි තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදන නො ලැබෙයි. එහි ' අධිමොක්ෂ ' යෙදෙයි. දොමනස්සසහගතයෙහි වෙදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණා නො ලැබෙයි. එහි ' පටිඝ ' යෙදෙයි. උපාදනස්ථානයෙහි ' අධිමොක්ෂ ' යෙදෙයි. විචිකිත්සාසම්ප්‍රයුක්තයෙහි ' අධිමොක්ෂ ' ද නො යෙදෙයි. එහි තෘෂ්ණාස්ථානයෙහි විචිකිත්සායෙන් පදපූරණ කරනලද යැ. උපාදානස්ථානය ඌන වෙයි. ඖද්ධත්‍යසම්ප්‍රයුක්තයෙහි තෘෂ්ණා ස්ථානයෙහි ' ඖද්ධත්‍ය ' ද උපාදනස්ථානයෙහි ' අධිමොක්ෂ ' ද යෙදෙයි. විචිකිත්සා සම්ප්‍රයුක්තයෙහි උපාදනමූලක නය නො ලැබෙයි. එහෙයින් එහි අට නයෙක්, දෙතිස් චතුෂ්කයෙක්, එක්සිය අටවිසි වාරයෙක් වේ.

කුශලනිර්දෙශ : අකුශලවිභාගයෙහි දී පළමු මාතෘකා තබා පසුව නිර්දේශ කරනලදී. කුශලවිභාගයෙහි දී මාතෘකා නො තබා මැ නිර්දේශ කරනලදී. කුශලයෙහි අර්පණානානාත්ව ඇති හෙයින් සාධාරණ විසින් මාතෘකා තැබිය නො හෙයි. ලෞකික කුශලයෙහි " එවමෙතස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති " යි අර්පණා වෙයි. ලොකොත්තර කුශලයෙහි " එවමෙතෙසං ධම්මානං සමුදයො හොති " යි අර්පණා වෙයි. මෙහි ලා අකුශලයනට අවිද්‍යාව මෙන් කුශලයනට කුශල ප්‍රත්‍යය වෙයි. එහෙයින් මැ අවිජ්ජාමූලකනයස්ථානයෙහි කුශලමූලකනය ලැබෙයි. මෙහි තණ්හා උපාදන නො ලැබෙන බැවින් තෘෂ්ණාස්ථානයෙහි ' ප්‍රසාද ' ද උපාදනස්ථානයෙහි ' අධිමොක්ෂ ' ද යෙදේ. විභාගනය අකුශල නිර්දෙශයෙහි මෙන් දතයුතු.

අව්‍යාකෘතනිර්දෙශ : මෙහි අවිජ්ජාමූලකනය නො ලැබෙයි. චක්ඛුවිඤ්ඤාණාදි අහේතුකවිපාකයෙහි තෘෂ්ණා උපාදන ස්ථාන නො යෙදෙයි. සහේතුකවිපාකයෙහි තෘෂ්ණාස්ථානයෙහි ' ප්‍රසාද ' යෙදෙයි. කුශලාකුශල අහේතුකවිපාක අතුරෙහි ද්විපඤ්ච විඤ්ඤාණයෙහි සඞ්ඛාර, විඤ්ඤාණ, නාම, ඡට්ඨායතන, ඵස්ස, වෙදනා මූලක නය සයෙක් ලැබෙයි. අවශෙෂ අහෙතුකචිත්තයන්හි අධිමොක්ෂමූලකය හා සමග නය සතෙක් ලැබෙයි. සහෙතුකවිපාකයෙහි ප්‍රසාදමූලකය හා සමග අට නයෙක් ලැබේ.

අවිජ්ජාමූලක කුශලනිර්දේශයත් කුශලමූලක විපාකනිර්දේශයත් අකුශලමූලක විපාකනිර්දෙශයත් උපනිශ්‍රයප්‍රත්‍යය සඳහා කියනලදී. මෙහි ප්‍රත්‍යයචතුෂ්කය මිස සෙසු චතුෂ්කයෝ නො ලැබෙත්.

තවද මේ නානානයසහස්‍රප්‍රතිමණ්ඩිත වූ ප්‍රත්‍යයාකාරධර්මාවබෝධය ලාමක වූ හීන සත්ත්වයන් විසින් නොකළ හැක්ක. කෘතාධිකාර වූ නිපුණ බුද්ධිඇතියන් විසිනුදු ප්‍රත්‍යයාකාරඥනප්‍රභෙදය සඳහා හැමකල්හි පය්‍ර්‍යාප්තිශ්‍රවණය චින්තනය ප්‍රතිපත්තික්‍රමය යන මෙහි ස්මෘතිමත් ව උත්සාහ කටයුත්තේ ය. එයින් කියනලදි අටුවායෙහි :

'' පරියත්තිසවනචින්තන—පටිපත්තික්කමවිවජ්ජිතානං ච

යස්මා ඤණපභෙදෙ—න කදචිපි හොති එතස්මිං

පරියත්තිසවනචින්තන—පටිපත්තික්කමතො සද ධීරො

තත්ථ කයිරා න හඤ්ඤං—කරණීයතරං තතො අත්ථි '' යි.

ත්‍රිපිටකධාරී කුශාග්‍රබුද්ධිමත් බුද්ධඝොෂාචාරීන් විසිනුදු ප්‍රත්‍යයාකාරවර්ණනාවට පැමිණ මහසයුරට බැසගත්තකු සෙයින් ප්‍රතිෂ්ඨා නො ලබන බව ද, එහෙත් නානාදෙශනානය මණ්ඩිත වූ තෙවළාබුදුවදන් සසුන ද නොසිඳැපවත්නා පෙර ඇදුරන් පැවැසූ මඟ ද ඇසුරු කොට ප්‍රත්‍යයාකාරවර්ණනා කරනබව ද පැවසූ සේ සැලැකියයුතු ය.

සතිපට්ඨානවිභඞ්ග : මෙහි සතර සතිපට්ඨාන ධර්මයෝ සුත්තන්තභාජනිය යැ අභිධම්මභාජනිය යැ පඤ්හපුච්ඡක යැ යන තුන් නයින් විභාග වෙති. සුත්තන්තභාජනියෙහි ලා සතර සතිපට්ඨාන ධර්මයෝ අධ්‍යාත්ම වශයෙන් ද බාහිර වශයෙන් ද අධ්‍යාත්ම බාහිර වශයෙන් ද විභාග කරනලදහ. කායානුපස්සනායෙන් රූපස්කන්ධපරිග්‍රහ ද වෙදනානුපස්සනායෙන් වෙදනාස්කන්ධපරිග්‍රහ ද චිත්තානුපස්සනායෙන් විඥනස්කන්ධ පරිග්‍රහ ද ධම්මානුපස්සනායෙන් සංඥස්කන්ධ සංස්කාරස්කන්ධ පරිග්‍රහ ද කියන ලද වෙත්. අභිධම්මභාජනිය ලොකුත්තරසතිපට්ඨානවශයෙන් දේශිත යැ. එහි ලා ධම්මසඞ්ගණි යෙහි විභාග කොට දක්වනලද දෙශනා නයෙහි මුඛමාත්‍රය දක්වනලදි. විස්තර විභාග ධම්මසඞ්ගණි නයානුසාරයෙන් ගතයුතු. සුත්තන්තභාජනියෙහි ලා ලෞකික ලොකොත්තර මිශ්‍ර සතිපට්ඨානයෝ කියනලදහ. අභිධම්මභාජනියෙහි ද පඤ්හපුච්ඡක යෙහි ද ලෝකෝත්තර සතිපට්ඨානයෝ මැ කියනලදහ.

සම්මප්පධානවිභඞ්ග : මෙහි සතර සම්‍යක්ප්‍රධානයෝ සුත්තන්තභාජනිය, අභිධම්ම භාජනිය, පඤ්හපුච්ඡක යන තුන් නයින් විභක්ත වෙති. සුත්තන්තභාජනියෙහි ලෞකික ලොකොත්තර මිශ්‍ර සම්‍යක්ප්‍රධානයෝ කියනලදහ. අභිධම්මභාජනියෙහි ද පඤ්හපුච්ඡක යෙහි ද ලොකොත්තර සම්‍යක්ප්‍රධානයෝ මැ කියනලදහ. අභිධම්මභාජනියෙහි දක්වන ලද්දේ නයමුඛමාත්‍රයෙකි. විස්තර විභාග ධම්මසඞ්ගණි අනුසාරයෙන් දතයුතු වේ.

ඉද්ධිපාද විභඞ්ග : මෙහි සතර ඍද්ධිපාදයෝ තුන් නයින් විභාග කොට දක්වන ලදහ. ' ඉද්ධි ' නම් ඡන්දදිය අධිපති කොට ප්‍රතිලබ්ධ උපචාරධ්‍යානාදි ධර්ම යි. උපචාරධ්‍යානාදි කුශලචිත්තසම්ප්‍රයුක්ත ඡන්දසමාධිපධානසඞ්ඛාරයනට ප්‍රතිෂ්ඨා වූ සතර අරූපස්කන්ධාදි අවශේෂ චිත්තචෛතසික ධර්මරාශිය ' ඉද්ධිපාද ' නම් වෙයි. ප්‍රතිලබ්ධ ධර්ම ඉද්ධි යැ, එයට පූර්වභාගය ' ඉද්ධිපාද ' නම් වෙයි. ප්‍රථමධ්‍යානය ඉද්ධි යැ, එහි පරිකර්ම ' ඉද්ධිපාද ' නම් වෙයි. සෙසු ධ්‍යාන මාර්ග ආදියෙහි ද මෙසේ දතයුතු. මෙහි සුත්තන්ත භාජනියෙහි ලා ලෞකිකලොකොත්තර මිශ්‍ර ඉද්ධිපාද කියනලද යැ. අභිධම්මභාජනි යෙහි ලා ලොකොත්තර ඉද්ධිපාද මැ කියනලදි.

බොජ්ඣඞ්ගවිභඞ්ග : මෙහි සප්තබොධ්‍යඞ්ගධර්මයෝ සුත්තන්තභාජනිය, අභිධම්ම භාජනිය, පඤ්හපුච්ඡක යන තුන් නයින් විභාග වෙති. සුත්තන්තභාජනිය නයත්‍රයෙකින් යුක්ත වෙයි. ප්‍රථම නය පූර්වභාග විදර්ශනා වශයෙන් කථිත යැ. ද්විතීය නයෙහි අධ්‍යාත්ම බාහිර වශයෙන් තුදුස් බොධ්‍යඞ්ගයෙක් කියනලද යැ. තෘතීය නය භාවනා වශයෙන් දක්වනලදි. අභිධම්මභාජනියෙහි නය සතරෙකි : සප්තබොධ්‍යඞ්ගයන් එකට ගෙන ප්‍රශ්න නභා විභාග කිරීම එක් නයෙක. වෙන වෙන ගෙන විභාග කිරීම එක් නයෙකි. යළි එ දෙක කුශල විසින් ද විපාක විසින් දැයි ද්විවිධ වෙයි. මෙසෙයින් නය

සතරෙක් වේ. සුත්තන්තභාජනියෙහි ප්‍රථම නයෙහි ලෞකික බොධ්‍යඞ්ගයෝ ද ද්විතීය තෘතීය දෙනයෙහි ලෞකික ලොකොත්තර මිශ්‍ර බොධ්‍යඞ්ගයෝ ද කියනලදහ. අභිධම්ම භාජනියෙහි ද පඤ්හපුච්ඡකයෙහි ද ලොකොත්තර බොධ්‍යඞ්ගයෝ මැ කියනලදහ.

මාර්ගවිභඞ්ග : මෙහි මාර්ගාඞ්ගයෝ සුත්තන්තභාජනිය, අභිධම්මභාජනිය, පඤ්හ පුච්ඡක යන තුන් නයින් විභාග වෙති. යළි සුත්තන්තභාජනිය දෙනයෙකින් විභක්ත වෙයි. පළමු නය සච්චවිභඞ්ගයෙහි දුක්ඛනිරොධගාමිනීපටිපදනිද්දෙසයෙහි කියනලද සේ යැ. දෙවැන්න භාවනා වශයෙන් දක්වන ලදි. අභිධම්මභාජනියෙහි ලොකොත්තර මාර්ග කියනලද යැ. එහි අට්ඨඞ්ගිකවාර යැ පඤ්චඞ්ගිකවාර යැ යි වාර දෙකෙකි. අට්ඨඞ්ගිකවාරය මාර්ගාඞ්ගයන් එකට ගෙන ප්‍රශ්න නඟා විසර්ජන කරන ලද්දේ යැ. පඤ්චඞ්ගිකවාරයෙහි මාර්ගාඞ්ගයන් එකට ගෙන ප්‍රශ්න නඟා විසර්ජන ද වෙයි, වෙන වෙන ප්‍රශ්න නඟා විසර්ජන ද වෙයි. යළි කුශල වශයෙන් ද කුශලවිපාක වශයෙන් ද විභාග වෙයි. 'පඤ්චාඞ්ගිකමාර්ග' යි කිව ද ලොකොත්තරමාර්ගය අෂ්ටාඞ්ගික මැ වෙයි. වාචා කම්මන්ත ආජීව යන මේ අඞ්ගයන් මාර්ගභාවනාවට පූර්වභාගයෙහි සුපරිශුද්ධ බැවින් මෙහි නො කියනලද යැ. සුත්තන්තභාජනියෙහි " අරියො අට්ඨඞ්ගිකො මග්ගො " යි 'ආර්‍ය්‍ය' පදයෙන් වෙසෙසා කියනලද යැ. අභිධම්මභාජනියෙහි 'අරියො' යි නො වෙසෙසා " අට්ඨඞ්ගිකො මග්ගො " යි කියන ලදි. 'ආර්‍ය්‍ය' යි නො කිව ද අෂ්ටාඞ්ගමාර්ගය ආර්‍ය්‍ය ම වෙයි. සුත්තන්තභාජනියෙහි 'ලෞකික ලොකොත්තර මිශ්‍ර මාර්ගාඞ්ගයෝ කියනලදහ. අභිධම්මභාජනියෙහි ද පඤ්හපුච්ඡකයෙහි ද ලොකොත්තරමාර්ගාඞ්ගයෝ මැ දක්වනලදහ.

ඣානවිභඞ්ග : මෙහි සතර ධ්‍යානයෝ තුන් නයින් විභාග වෙති. සුත්තන්ත භාජනියෙහි ලා පළමු කොට සකල සූත්‍රාන්තභාජනියට මැ මාතෘකා තබා නික්ඛිත්ත මාතෘකායෙහි පිළිවෙළින් පදභාජනිය කෙරෙමින් නිද්දෙස කියනලදි. එහි ලා චතුපාරිසුද්ධිසීලය ද ධ්‍යානභාවනාවට උපකාරකධර්මයෝ ද ඒ ධර්මයන්ගේ අපරිහානිය පිණිස හා කර්මස්ථාන විස්මෘති නො වන පිණිස ස්මෘතිසම්ප්‍රජන්‍යසමායොගය ද භාවනානුරූප සේනාසන පරිග්‍රහ ද ධ්‍යානානුරූප ඊර්‍ය්‍යාපථ ද ධ්‍යානභාවනාරම්භය ද ධ්‍යානප්‍රත්‍යනීක ධර්මප්‍රහාණය ද සියලු ධ්‍යානයන්ගේ උත්පත්තික්‍රම ද දක්වනලදහ. අභිධම්මභාජනියෙහි ලා ධම්මසඞ්ගණි චිත්තුප්පාදකාණ්ඩයෙහි ආ නයින් පෙළ තබා කුශල විපාක ක්‍රියා විසින් විභාග නය දක්වනලදි. විස්තරවිභාග ධම්මසඞ්ගණියෙහි කී නයින් දතයුතු. සුත්තන්ත භාජනියෙහි ද අභිධම්මභාජනියෙහි ද පඤ්හපුච්ඡකයෙහි ද ලෞකිකලොකොත්තර මිශ්‍ර වූ මැ ධ්‍යානයෝ කියනලදහ.

අප්පමඤ්ඤාවිභඞ්ග : මෙහි සතර අප්‍රමාණ්‍යයෝ සුත්තන්තභාජනියාදි තුන් නයින් විභක්ත වෙති. සුත්තන්තභාජනියෙහි පළමු මාතෘකා තබා අනතුරු වැ නික්ඛිත්තමාතෘකා යෙහි පදභාජනිය සැකෙවින් දක්විණ. විස්තරවිභාග චිත්තුප්පාදකාණ්ඩයෙහි කී අයුරු යි. අභිධම්මභාජනියෙහි කුශල විසිනුදු විපාක විසිනුදු ක්‍රියා විසිනුදු විභාග නය සැකෙවින් දක්වන ලද යැ. විස්තරවිභාග චිත්තුප්පාදකාණ්ඩයෙහි ආ සෙයින් දතයුතු. නයත්‍රයෙහි මැ ලෞකික අප්‍රමාණ්‍යයෝ මැ කියන ලදහ.

සික්ඛාපදවිභඞ්ග : මෙහි පඤ්චශික්ෂාපද අභිධම්මභාජනිය, පඤ්හපුච්ඡක යන දෙනයින් විභාග කොට දක්වනලද යැ. පළමු මාතෘකානික්ෂෙප ද ඉක්බිති පදභාජනිය ද වෙයි. පදභාජනිය නයත්‍රයෙකින් සමන්විත වෙයි. ප්‍රථමනයෙහි විරතිශික්ෂා දක්වනලද වෙයි. ද්විතීය නයෙහි චෙතනා ද තෘතීය නයෙහි චෙතනාසම්ප්‍රයුක්ත පරොපණ්ණාස ධර්මයෝ ද ශික්ෂාත්වයෙන් දක්වන ලදහ. මොහු අෂ්ටකාමාවචර කුශලචිත්තයාගේ වශයෙන් විභාග කරනලද වෙති. යළි චාතුර්භූමක කුශලධර්ම ද ශික්ෂිතව්‍යභාවයෙන්

ශික්ෂායෙහි ලා ගෙන එහි විභාගනය සැකෙවින් දක්වනලද්දේ යැ. විස්තර විභාග ධම්මසඞ්ගණී අනුසාරයෙන් දතයුතු වෙයි. මෙහි අභිධම්මභාජනියෙහි දු පඤ්හපුච්ඡක යෙහි දු ලෞකික වූ මැ ශික්ෂාපදයෝ කියනලදහ.

පටිසම්භිදාවිභඞ්ග : මෙහි සතර ප්‍රතිසංවිද්ධර්මයෝ නයත්‍රයෙන් විභාග වෙති. සුත්තන්තභාජනියෙහි සත්‍යවාර යැ හෙතුවාර යැ ධර්මවාර යැ ප්‍රත්‍යයාකාරවාර යැ පර්‍ය්‍යාප්තිවාර යැ යි විභාගවාර පසෙක් වෙයි. අභිධම්මභාජනියෙහි කුශලාකුශල විපාක ක්‍රියා වීයින් වාර සතරෙක් වෙයි. විපාක හා ක්‍රියා හා මෙදෙක අර්ථප්‍රතිසංවිදයෙහි සඞ්ගෘහීත වන බැවින් විපාකක්‍රියාවාරයෙහි ධර්මප්‍රතිසංවිද හැර සෙසු තුන් ප්‍රති සංවිදවෝ යෙදෙති. මෙහි පාළිය නයමුඛමාත්‍රයක් දක්වා සංක්ෂිප්ත කරනලද ය. විස්තරවිභාග චිත්තුප්පාදකාණ්ඩයෙහි කී නයින් ගතයුතු වෙයි. මෙහි අර්ථප්‍රතිසංවිද ලෞකික ද ලොකොත්තර ද වෙයි. අවශෙෂ තුන් ප්‍රතිසංවිද්ධර්මයෝ ලෞකික වෙත්.

ඤාණවිභඞ්ග : මෙහි ඒකවිධඥානවස්තුයෙහි පටන් දශවිධඥානවස්තු තෙක් දශපරිච්ඡෙද යෙකින් මාතෘකා තබා නික්ෂිප්ත පදනුක්‍රමයෙන් නිද්දෙස කරනලද යැ. ඔවුනතුරෙහි එකකමාතෘකායෙහි අටසැත්තෑ පදයෙක් වෙයි. ද්විකමාතෘකායෙහි පන්තිස්ද්විකයෙක. ත්‍රිකමාතෘකායෙහි අටාසූ ත්‍රිකයෙක. චතුෂ්කමාතෘකායෙහි එක්විසි චතුෂ්කයෙක. පඤ්චකමාතෘකායෙහි පඤ්චක දෙකෙක. ෂට්කමාතෘකායෙහි එක් ෂට්කයෙක. සප්තක මාතෘකායෙහි එකොළොස් සප්තකයෙක. අෂ්ටකමාතෘකායෙහි එක් අෂ්ටකයෙක. නවකමාතෘකායෙහි එක් නවකයෙක. දශකමාතෘකායෙහි එක් මැ දශකයෙකි. මෙහැම නිද්දෙසයෙහි ලා විභාග කොට දක්වනුලැබෙ.

ඛුද්දකවත්ථුවිභඞ්ග : මෙහි ක්ලෙශධර්මයෝ විභාග වෙති. නානාප්‍රකාරක්ලෙශ ධර්මයන් එකොළොස් අයුරෙකින් සඞ්ග්‍රහ කොට මාතෘකා තබා යළි උද්දිෂ්ටපදනුක්‍රම යෙන් නිර්දෙශ කරනලද යැ. එහි ඒකකමාතෘකායෙහි පටන් දශකමාතෘකා තෙක් පිළිවෙළින් පරිච්ඡෙද දශයෙක් ද අවසානයෙහි තණ්හාවිචරිත දූයි එකොළොස් පරිච්ඡෙද යෙක් වෙයි. ඒකකමාතෘකා තෙසැත්තැවෙක් වෙයි. ද්විකමාතෘකා අටළොසෙක. ත්‍රිකමාතෘකා පන්තිසෙක. චතුෂ්කමාතෘකා තුදුසෙක. පඤ්චකමාතෘකා පසළොසෙක ෂට්කමාතෘකා තුදුසෙක. සප්තකමාතෘකා සතෙක. අෂ්ටකමාතෘකා අටෙක. නවක මාතෘකා නවයෙක. දශකමාතෘකා සතෙක. අෂ්ටාදශකමාතෘකා සයෙකි. මෙසේ අටසියක් ක්ලෙශධර්මයන් මාතෘකා කොට තබා එහැම නිද්දෙසයෙහි ලා විභාග කොට දක්වන ලදි.

ධම්මහදයවිභඞ්ග : මෙහි ස්කන්ධාදි ද්වාදශ ධර්ම කෙනෙක් විභාග වෙති. විභාගවාර දශයෙකි. ප්‍රථමවාරය සබ්බසඞ්ගාහිකවාර නම් වෙයි. එහි ස්කන්ධ, ආයතන, ධාතු, සත්‍ය, ඉන්ද්‍රිය, හෙතු, ආහාර, ස්පර්ශ, වෙදනා, සංඥා, චෙතනා, චිත්ත යන ද්වාදශසඞ්ග්‍රහයෝ වෙති. ද්විතීයවාරයෙහි ලා කාමධාතු ආදියෙහි යථොක්තධර්මයන්ගේ උත්පත්ති හා අනුත්පත්ති දක්වෙයි. තෘතීයවාරයෙහි ලා කාමධාතු ආදියෙහි ස්කන්ධාදීන්ගේ පර්‍ය්‍යා පන්න–අපර්‍ය්‍යාපන්න භාවය දැක්වෙයි. චතුර්ථවාරයෙහි ලා තුන් භූමියෙහි උත්පත්ති ක්ෂණයෙහි ස්කන්ධාදීන්ගේ විද්‍යමාන–අවිද්‍යමානභාවය දක්වෙයි. පඤ්චමවාරය ඒ ධර්මයන් භූම්‍යන්තර වශයෙන් දක්වයි. ෂෂ්ඨවාරය ඒ ඒ ගතියෙහි උත්පාදකකර්ම හා ආයුෂ්ප්‍රමාණ දක්වයි. සප්තමවාරයෙහි ස්කන්ධාදිධර්මයන්ගේ අභිඤ්ඤෙය්‍යාදි භාවය දක්වෙයි. අෂ්ටමවාරයෙහි ඔවුන්ගේ සාරම්මණ–අනාරම්මණ භාවය දක්වෙයි. නවම වාරයෙහි ස්කන්ධාදි ධර්මයෝ දෘෂ්ටශ්‍රැතාදි වශයෙන් සඞ්ග්‍රහ කරනලද වෙති. දශම වාරයෙහි ස්කන්ධාදී ධර්මයන්ගේ කුශලත්‍රිකාදි සඞ්ග්‍රහය දක්වේ.

ග්‍රන්ථප්‍රමාණ : උක්තප්‍රකාර අටළොස් පරිච්ඡෙදයෙකින් සමන්විත වූ විභඞ්ග ප්‍රකරණය ධාවනාමාර්ගයෙහි ආ පමණින් ඛන්ධවිභඞ්ග පස් බණවරෙකින් ද ආයතන විභඞ්ග සාතිරෙක බණවරෙකින් ද ධාතුවිභඞ්ග දෙබණවරෙකින් ද සච්චවිභඞ්ග දෙබණ වරෙකින් ද ඉන්ද්‍රියවිභඞ්ග සාතිරෙක බණවරෙකින් ද පච්චයාකාරවිභඞ්ග බණවර සයෙකින් ද සතිපට්ඨාන, සම්මප්පධාන, ඉද්ධිපාද, බොජ්ඣඞ්ග, මග්ගවිභඞ්ග සාතිරෙක බණවර බැවින් ද ඣානවිභඞ්ග දෙබණවරෙකින් ද අප්පමඤ්ඤා, සික්ඛාපද, පටිසම්භිද විභඞ්ග සාතිරෙක බණවර බැවින් ද ඤාණවිභඞ්ග, ඛුද්දකවිභඞ්ග තුන් බණවර බැවින් ද ධම්මහදයවිභඞ්ග දෙබණවරෙකින් ද ' යි පන්තිස් බණවරෙකින් පරිමිත වූයේ යි.

විභඞ්ගප්පකරණඅනුවාදය : ලඞ්කාබෞද්ධමණ්ඩලය මගින් පත්කරනලද ත්‍රිපිටක මණ්ඩලය විසින් සම්මත වූයේ ත්‍රිපිටකපාළිය සිංහල අනුවාදයක් සහිත කොට ප්‍රකාශයට පමුණුවාලීම යැ. එහෙයින් විභඞ්ගප්පකරණය වැනි විවිධ නයගහනයෙන් ගම්භීර වූ සුනිපුණ ධර්මවිභාග ඇති ප්‍රකරණයක් පවා අර්ථව්‍යාඛ්‍යානයෙන් විවරණ කිරීමට අවසර යෙක් නොවීය. එහෙත් දුර්ගමස්ථානයෙහි වරහන් තුළ අතිරෙක අර්ථ යෙදීමෙන් ද, කිසි තැනෙක අටුවාගත පර්‍ය්‍යාය අර්ථ දක්වීමෙන් ද බෙහෙවින් අභිධර්ම පාරිභාෂික ශබ්දයනට ප්‍රමුඛස්ථානය දෙමින් ස්වභාෂාරීතිය ද නොපිරිහෙළා මේ විභඞ්ගානුවාදය සම්පාදනය වී ඇතිබව සැලකියයුතුය. මෙසේ විභඞ්ගප්පකරණ ප්‍රථමභාගය ප්‍රකාශයට පමුණුවාලීමෙන් මේ උදරතර සත්කාර්‍ය්‍යයෙහි සහාය වූ ත්‍රිපිටකසංස්කාරකමණ්ඩලය ශ්‍රීලඞ්කාජනරජයේ සංස්කෘතිකඅධිකාරිය හා රජයේ මුද්‍රණාංශය ඇතුළු හැම සුධීහු ප්‍රශංසාහර්යෝ යි.

සියලු සත්ත්වයෝ නිදුක්වෙත්වා.

කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිර.

1975 වෙසක්,
ත්‍රිපිටක කාර්‍ය්‍යාලය,
මහානායක චාරිකාරාමය,
115, විජේරාම මාවත,
කොළඹ – 7.

සඞ්කෙත නිරූපණය

ABBREVIATIONS

සිමු — සිංහලාක්ෂර මුද්‍රිත විභඞ්ගප්‍රකරණය.

සිමු² සිරිමු — ශ්‍රීපාද ත්‍රිපිටක මුද්‍රණය.

මනුප — (මහනුවර පත්තිරිප්පුව) රජකීය පුස්තකාලය -

පැවි — පැල්මඩුල්ල විහාරයට අයත් පුස්කොළපොත.

මඡසං — මරම්මඡට්ඨසඞ්ගීති පොත්ථක.

ස්‍යා — තායිලන්තයෙහි මුද්‍රිත - විභඞ්ගප්‍රකරණය.

PTS — PALI TEXT SOCIETY VIBHANGAPPAKARANA

THE PALI ALPHABET

IN SINHALA CHARACTERS.

VOWELS

අ a   ආ ā   ඉ i   ඊ ī   උ u   ඌ ū   එ ē   ඔ ō

CONSONANTS

ක ka   ඛ kha   ග ga   ඝ gha   ඞ ṅa
ච ca   ඡ cha   ජ ja   ඣ jha   ඤ ña
ට ṭa   ඨ ṭha   ඩ ḍa   ඪ ḍha   ණ ṇa
ත ta   ථ tha   ද da   ධ dha   න na
ප pa   ඵ pha   බ ba   භ bha   ම ma
ය ya   ර ra   ල la   ව va   ස sa   හ ha   ළ ḷa   අං aṃ

ක ka   කා kā   කි ki   කී kī   කු ku   කූ kū   කෙ kē   කො kō
ඛ kha   ඛා khā   ඛි khi   ඛී khī   ඛු khu   ඛූ khū   ඛෙ khē   ඛො khō
ග ga   ගා gā   ගි gi   ගී gī   ගු gu   ගූ gū   ගෙ gē   ගො gō

Conjunct - Consonants

ක්ක kka
ක්ඛ kkha
ක්‍ය kya
ක්‍රි kri
ක්ව kva
ඛ්‍ය khya
ඛ්ව khva
ග්ග gga
ග්ඝ ggha
ඞ්ක ṅka
ග්‍ර gra
ඞ්ඛ ṅkha
ඞ්ග ṅga
ඞ්ඝ ṅgha
ච්ච cca
ච්ඡ ccha
ජ්ජ jja
ජ්ඣ jjha

ඤ්ඤ ñña
ණ්හ ṇha
ඤ්ච ñca
ඤ්ඡ ñcha
ඤ්ජ, ඦ ñja
ඤ්ඣ ñjha
ට්ට ṭṭa
ට්ඨ, ට‍්ඨ ṭṭha
ඩ්ඩ ḍḍa
ඩ්ඪ ḍḍha
ණ්ණ ṇṇa
ණ්ට ṇṭa
ණ්ඨ ṇṭha
ණ්ඩ, ඬ ṇḍa
ණ්හ ṇha
ත්ත tta
ත්ථ ttha
ත්ව tva

ත්‍ර tra
ද්ද dda
ද්ධ ddha
ද්‍ර dra
ද්ව, ද්ව dva
ධ්ව dhva
න්ත nta
න්ථ ntha
න්ද nda
න්ධ ndha
න්න nna
න්හ nha
ප්ප ppa
ප්ඵ ppha
බ්බ bba
බ්භ bbha
බ්‍ර bra
ම්ප mpa

ම්ඵ mpha
ම්බ, ඹ mba
ම්භ mbha
ම්ම mma
ම්හ mha
ය්‍ය yya
ය්හ yha
ල්ල lla
ල්‍ය lya
ල්හ lha
ව්හ wha
ස්ස ssa
ස්ම sma
ස්ව sva
හ්ම hma
හ්ව hva
ළ්හ ḷha

ා ā   ි i   ී ī   ු ු u   ූ ූ ū   ෙ e   ො ō

විභඞ්ගප්පකරණ - පඨමභාග

විෂය සූචි

		පිට්ඨඞ්කං
1.	**ඛන්ධවිභඞ්ගො**	**2 - 122**
1.	සුත්තන්තභාජනියං	2 - 20
2.	අභිධම්මභාජනියං	22 - 104
3.	රූපක්ඛන්ධො	22 - 24
4.	වෙදනාක්ඛන්ධො	26 - 46
5.	සඤ්ඤාක්ඛන්ධො	46 - 64
6.	සඞ්ඛාරක්ඛන්ධො	66 - 86
7.	විඤ්ඤාණක්ඛන්ධො	86 - 104
8.	පඤ්හපුච්ඡකං	104 - 122
2.	**ආයතනවිභඞ්ගො**	**124 - 148**
1.	සුත්තන්තභාජනියං	124
2.	අභිධම්මභාජනියං	124 - 132
3.	පඤ්හපුච්ඡකං	132 - 148
3.	**ධාතුවිභඞ්ගො**	**150 - 180**
1.	සුත්තන්තභාජනියං	150 - 158
2.	අභිධම්මභාජනියං	158 - 162
3.	පඤ්හපුච්ඡකං	162 - 180
4.	**සච්චවිභඞ්ගො**	**182 - 218**
1.	සුත්තන්තභාජනියං	182 - 192
2.	අභිධම්මභාජනියං	194 - 202
3.	පඤ්හපුච්ඡකං	202 - 218
5.	**ඉන්ද්‍රියවිභඞ්ගො**	**220 - 242**
1.	අභිධම්මභාජනියං	220 - 224
2.	පඤ්හපුච්ඡකං	224 - 242

		පිට්ඨඞ්කො
6.	**පටිච්චසමුප්පාදවිභඞ්ගො**	**244 - 338**
1.	සුත්තන්තභාජනීයං	244 - 248
2.	අභිධම්මභාජනීයං	248 - 338
3.	මාතිකා	348 - 256
4.	පච්චයචතුක්කං	256 - 264
5.	හෙතුචතුක්කං	264 - 270
6.	සම්පයුත්තචතුක්කං	272 - 278
7.	අඤ්ඤමඤ්ඤචතුක්කං	278 - 288
8.	අකුසලනිද්දෙසො	288 - 294
9.	කුසලනිද්දෙසො	294 - 302
10.	අව්‍යාකතනිද්දෙසො	302 - 322
11.	අවිජ්ජාමූලකකුසලනිද්දෙසො ...	322 - 326
12.	කුසලමූලකවිපාකනිද්දෙසො ...	326 - 334
13.	අකුසලමූලකවිපාකනිද්දෙසො ...	334 - 338
7.	**සතිපට්ඨානවිභඞ්ගො**	**340 - 366**
1.	සුත්තන්තභාජනීයං	340 - 356
	කායානුපස්සනා නිද්දෙසො	340 - 344
	වෙදනානුපස්සනා නිද්දෙසො ...	344 - 346
	චිත්තානුපස්සනා නිද්දෙසො ...	346 - 350
	ධම්මානුපස්සනා නිද්දෙසො	350 - 356
2.	අභිධම්මභාජනීයං	356 - 360
3.	පඤ්හාපුච්ඡකං	360 - 366
8.	**සම්මප්පධානවිභඞ්ගො**	**368 - 382**
1.	සුත්තන්තභාජනීයං	368 - 372
2.	අභිධම්මභාජනීයං	372 - 376
3.	පඤ්හාපුච්ඡකං	376 - 382
9.	**ඉද්ධිපාදවිභඞ්ගො**	**384 - 400**
1.	සුත්තන්තභාජනීයං	384 - 388
2.	අභිධම්මභාජනීයං	390 - 394
3.	පඤ්හාපුච්ඡකං	396 - 400

අභිධම්මපිටකෙ

විභඞ්ගප්පකරණං

පඨමො භාගො

2—ඊ 503 (8/73)

අභිධම්මපිටකෙ

විභඞ්ගප්පකරණං

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

1. ඛන්ධවිභඞ්ගො

1. පඤ්චක්ඛන්ධා: රූපක්ඛන්ධො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො.

2. තත්ථ කතමො රූපක්ඛන්ධො:

යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා තදෙකජ්ඣං අභිසඤ්ඤූහිත්වා අභිසඞ්ඛිපිත්වා, අයං වුච්චති රූපක්ඛන්ධො.

3. තත්ථ කතමං රූපං අතීතං:

යං රූපං අතීතං නිරුද්ධං විගතං විපරිණතං අත්ථඞ්ගතං අබ්භත්ථංගතං උප්පජ්ජිත්වා විගතං අතීතං අතීතංසෙන සඞ්ගහිතං චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං, ඉදං වුච්චති රූපං අතීතං.

4. තත්ථ කතමං රූපං අනාගතං:

යං රූපං අජාතං අභූතං අසඤ්ජාතං අනිබ්බත්තං අනභිනිබ්බත්තං අපාතුභූතං අනුප්පන්නං අසමුප්පන්නං අනුට්ඨිතං අසමුට්ඨිතං අනාගතං අනාගතංසෙන සඞ්ගහිතං චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං, ඉදං වුච්චති රූපං අනාගතං.

5. තත්ථ කතමං රූපං පච්චුප්පන්නං:

යං රූපං ජාතං භූතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං උප්පන්නං සමුප්පන්නං උට්ඨිතං සමුට්ඨිතං පච්චුප්පන්නං පච්චුප්පන්නංසෙන සඞ්ගහිතං චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං, ඉදං වුච්චති රූපං පච්චුප්පන්නං.

6. තත්ථ කතමං රූපං අජ්ඣත්තං:

යං රූපං තෙසං තෙසං සත්තානං අජ්ඣත්තං පච්චත්තං නියකං[1] පාටිපුග්ගලිකං උපාදින්නං[2] චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහා-භූතානං උපාදාය රූපං, ඉදං වුච්චති රූපං අජ්ඣත්තං.

---

1. නියතං – සීමු, 2. උපාදිණ්ණං – PTS.

අභිධර්මපිටකයෙහි

විභඞ්ග පෙළ

ඒ භගවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා!

1. ස්කන්ධ විභඞ්ගය

1. ස්කන්ධ පසෙකි: රූපස්කන්ධ යැ වේදනාස්කන්ධ යැ සංඥාස්කන්ධ යැ සංස්කාරස්කන්ධ යැ විඥානස්කන්ධ යි.

2. එහි රූපස්කන්ධය කවරෙ යත්:

ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි දූර වේවයි ළඟ වේවයි අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වූ යම් කිසි රූපයෙක් වේ ද, එ හැම රූපය එක්පරිද්දෙකින් කැටි කොට හකුළුවා ගෙන මේ රූපස්කන්ධ යයි කියනු ලැබේ.

3. එහි අතීතරූපය කවරෙ යත්:

(භව වශයෙන් හෝ ක්ෂණවශයෙන් හෝ) ඉක්ම ගිය නිරුද්ධ වූ වෙන් වැ ගියා වූ පෙරළීමට ගියා වූ අස්තයට ගියා වූ වෙසෙසින් අස්තයට ගියා වූ ඉපද වෙන් වැ ගියා වූ ඉක්ම ගියා වූ අතීතාංශයෙන් සඞ්ග්‍රහයට ගියා වූ යම් රූපයෙක් වේ ද, සතර මහාභූතයෝ ද, සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද යන මේ ' අතීතරූප ' යි කියනු ලැබේ.

4. එහි අනාගතරූපය කවරෙ යත්:

(භව වශයෙන් හෝ ක්ෂණවශයෙන් හෝ) නො හටගත් නො වූ ප්‍රත්‍යයසමවාය යෙන් නූපන් නො නිපන් වෙසෙසින් නො නිපන් නො පහළ වූ නූපන් ප්‍රත්‍යයසමවාය යෙන් නූපන් නො නැඟුණු ප්‍රත්‍යයසමවායයෙන් නො නැඟුණු අනාගත වූ අනාගතාංශ යෙන් සඞ්ගෘහීත වූ යම් රූපයෙක් වේ ද, සතර මහාභූතයෝ ද, සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද යන මේ ' අනාගතරූප ' යි කියනු ලැබේ.

5. එහි ප්‍රත්‍යුත්පන්නරූපය කවරෙ යත්:

හටගත් උපන් ප්‍රත්‍යයසමවායයෙහි උපන් නිපන් වෙසෙසින් නිපන් පහළ වූ උපන් ප්‍රත්‍යයසමවායයෙහි උපන් නැඟුණු ප්‍රත්‍යය සමවායයෙන් නැඟුණු වර්තමාන වූ වර්තමානාංශයෙන් සඞ්ගෘහීත වූ යම් රූපයෙක් වේ ද, සතර මහාභූතයෝ ද, සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද යන මේ ' ප්‍රත්‍යුත්පන්න රූප ' යි කියනු ලැබේ.

6. එහි ආධ්‍යාත්මිකරූපය කවරෙ යත්:

ඒ ඒ සත්ත්වයන්ගේ තමතමන් අයත්, තමතමන් කෙරෙහි වූ, ස්වකීය වූ පුද්ගලයකු පාසා පවත්නා වූ උපාදින්න වූ යම් රූපයෙක් වේ ද, සතර මහාභූතයෝ ද, සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද යන මේ ' ආධ්‍යාත්මිකරූප ' යි කියනු ලැබේ.

7. තත්ථ කතමං රූපං බහිද්ධා:

යං රූපං තෙසං තෙසං පරසත්තානං පරපුග්ගලානං අජ්ඣත්තං පච්චත්තං නියකං පාටිපුග්ගලිකං උපාදින්නං චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං, ඉදං වුච්චති රූපං බහිද්ධා.

8. තත්ථ කතමං රූපං ඔළාරිකං:

චක්ඛායතනං රූපායතනං සොතායතනං සද්දායතනං ඝානායතනං ගන්ධායතනං ජිව්හායතනං රසායතනං කායායතනං ඵොට්ඨබ්බායතනං, ඉදං වුච්චති රූපං ඔළාරිකං.

9. තත්ථ කතමං රූපං සුඛුමං:

ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති ආකාසධාතු ආපොධාතු රූපස්ස ලහුතා රූපස්ස මුදුතා රූපස්ස කම්මඤ්ඤතා රූපස්ස උපචයො රූපස්ස සන්තති රූපස්ස ජරතා රූපස්ස අනිච්චතා කබළිඞ්කාරො[1] ආහාරො, ඉදං වුච්චති රූපං සුඛුමං.

10. තත්ථ කතමං රූපං හීනං:

යං රූපං තෙසං තෙසං සත්තානං උඤ්ඤාතං අවඤ්ඤාතං හීළිතං පරිභූතං අචිත්තීකතං හීනං හීනමතං හීනසම්මතං අනිට්ඨං අකන්තං අමනාපං රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා, ඉදං වුච්චති රූපං හීනං.

11. තත්ථ කතමං රූපං පණීතං:

යං රූපං තෙසං තෙසං සත්තානං අනුඤ්ඤාතං අනවඤ්ඤාතං අහීළිතං අපරිභූතං චිත්තීකතං පණීතං පණීතමතං පණීතසම්මතං ඉට්ඨං කන්තං මනාපං රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා, ඉදං වුච්චති රූපං පණීතං, තං තං වා පන රූපං උපාදායුපාදාය රූපං හීනං පණීතං දට්ඨබ්බං.

12. තත්ථ කතමං රූපං දූරෙ:

ඉත්ථින්ද්‍රියං -පෙ- කබළිඞ්කාරො[1] ආහාරො; යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං අනාසන්නෙ අනුපකට්ඨෙ දූරෙ අසන්තිකෙ, ඉදං වුච්චති රූපං දූරෙ.

13. තත්ථ කතමං රූපං සන්තිකෙ:

චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං, යං වා පනඤ්ඤම්පි අත්ථි රූපං ආසන්නෙ උපකට්ඨෙ අවිදූරෙ සන්තිකෙ, ඉදං වුච්චති රූපං සන්තිකෙ. තං තං වා පන රූපං උපාදායුපාදාය රූපං දූරෙ සන්තිකෙ දට්ඨබ්බං.

14. තත්ථ කතමො වෙදනාක්ඛන්ධො:

යා කාචි වෙදනා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තා වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යා දූරෙ සන්තිකෙ වා, තදෙකජ්ඣං අභිසඤ්ඤූහිත්වා අභිසඞ්ඛිපිත්වා, අයං වුච්චති වෙදනාක්ඛන්ධො.

---

1. කබළීකාරො - මජසං.

7. එහි බාහිරරූපය කවරේ යත් :

ඒ ඒ පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ අධ්‍යාත්ම වූ තමතමන් කෙරෙහි වූ ස්වකීය වූ පුහුලකු පාසා පවත්නා වූ උපාදින්න වූ යම් රූපයෙක් වේ ද, සතර මහාභූතයෝ ද, සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද යන මේ ' බාහිර රූප ' යි කියනු ලැබේ.

8. එහි ඖදරිකරූපය කවරේ යත් :

චක්ෂුරායතන යැ රූපායතන යැ ශ්‍රොත්‍රායතන යැ ශබ්දයතන යැ ඝ්‍රාණායතන යැ ගන්ධායතන යැ ජිහ්වායතන යැ රසායතන යැ කායායතන යැ ස්ප්‍රෂ්ටව්‍යායතන යැ යන මේ ' ඖදරිකරූප ' යි කියනු ලැබේ.

9. එහි සූක්ෂ්මරූපය කවරේ යත් :

ස්ත්‍රීන්ද්‍රිය යැ පුරුෂෙන්ද්‍රිය යැ ජීවිතෙන්ද්‍රිය යැ කායවිඥප්ති යැ වාග්විඥප්ති යැ ආකාශධාතු යැ අබ්ධාතු යැ රූපයාගේ ලඝුත්ව යැ රූපයාගේ මෘදුත්ව යැ රූපයාගේ කර්මණ්‍යත්ව යැ රූපයාගේ උපචය යැ රූපයාගේ සන්තති යැ රූපයාගේ ජරතා යැ රූපයාගේ අනිත්‍යතා යැ කවලීකාරාහාර යැ යන මේ ' සූක්ෂ්මරූප ' යි කියනු ලැබේ.

10. එහි හීනරූපය කවරේ යත් :

ඒ ඒ සත්ත්වයන් විසින් අවමන් කරන ලද ලාමක වශයෙන් සලකනලද බැහැර කළ පරිභව කළ නො ගරු කළ හීන වූ හීන යයි සලකනලද හීන යයි සම්මත වූ අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ යම් රූපයෙක් වේ ද, එබඳු වූ රූපයෝ යැ ශබ්දයෝ යැ ගන්ධයෝ යැ රසයෝ යැ ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ යන මේ ' හීනරූප ' යි කියනු ලැබේ.

11. එහි ප්‍රණීතරූපය කවරේ යත් :

ඒ ඒ සත්ත්වයන් විසින් අවමන් නො කරනලද ලාමක වශයෙන් නො සිතන ලද බැහැර නො කළ පරිභව නො කළ ගරු කළ ප්‍රණීත වූ ප්‍රණීත යයි සලකන ලද ප්‍රණීත යයි සම්මත වූ ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන යම් රූපයෙක් වේ ද, එබඳු වූ රූපයෝ යැ ශබ්දයෝ යැ ගන්ධයෝ යැ රසයෝ යැ ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ යන මේ ' ප්‍රණීතරූප ' යි කියනු ලැබේ. තවද ඒ ඒ රූපය නිසා හීනප්‍රණීතරූපය දතයුතු යි.

12. එහි දූරෙරූපය කවරේ යත් :

ස්ත්‍රීන්ද්‍රිය යැ . . . කවලීකාරාහාර යැ, තවද අනාසන්නයෙහි බැහැර දුරැ නො ළඟ වූ අන්‍ය වූ ද යම් රූපයෙක් ඇද්ද, මේ ' දූරෙරූප ' යි කියනු ලැබේ.

13. එහි සන්තිකෙරූපය කවරේ යත් :

චක්ෂුරායතන යැ . . . ස්ප්‍රෂ්ටව්‍යායතන යැ තවද ආසන්නයෙහි සමීපයෙහි නුදුරෙහි ළඟ වූ අන්‍ය වූ ත් යම් රූපයෙක් ඇද්ද, මේ ' සන්තිකෙරූප ' යි කියනු ලැබේ. තවද ඒ ඒ රූපය නිසා දූරෙ සන්තිකෙ රූපය දතයුතු.

14. එහි වෙදනාස්කන්ධය කවරේ යත් :

අධ්‍යාත්ම වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ යම්කිසි වෙදනාවක් වේ ද, දුරැ වූ හෝ ළඟැ වූ හෝ යම් වෙදනාවකුත් වේ ද, ඒ සියල්ල එක් අයුරෙකින් කැටි කොට හකුළුවා මේ ' වෙදනාස්කන්ධ ' යි කියනු ලැබේ.

15. තත්‍ථ කතමා වෙදනා අතීතා:

යා වෙදනා අතීතා නිරුද්ධා විගතා විපරිණතා අත්‍ථඞ්ගතා අබ්භත්‍ථං ගතා උප්පජ්ජිත්‍වා විගතා අතීතා අතීතංසෙන සඞ්ගහිතා සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා, අයං වුච්චති වෙදනා අතීතා.

16. තත්‍ථ කතමා වෙදනා අනාගතා:

යා වෙදනා අජාතා අභූතා අසඤ්ජාතා අනිබ්බත්තා අනභිනිබ්බත්තා අපාතුභූතා අනුප්පන්නා අසමුප්පන්නා අනුට්ඨිතා අසමුට්ඨිතා අනාගතා අනාගතංසෙන සඞ්ගහිතා සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා, අයං වුච්චති වෙදනා අනාගතා.

17. තත්‍ථ කතමා වෙදනා පච්චුප්පන්නා:

යා වෙදනා ජාතා භූතා සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතා උප්පන්නා සමුප්පන්නා උට්ඨිතා සමුට්ඨිතා පච්චුප්පන්නා පච්චුප්පන්නංසෙන සඞ්ගහිතා සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා, අයං වුච්චති වෙදනා පච්චුප්පන්නා.

18. තත්‍ථ කතමා වෙදනා අජ්ඣත්තා:

යා වෙදනා තෙසං තෙසං සත්තානං අජ්ඣත්තං පච්චත්තං නියකා පාටිපුග්ගලිකා උපාදින්නා සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා, අයං වුච්චති වෙදනා අජ්ඣත්තා.

19. තත්‍ථ කතමා වෙදනා බහිද්ධා:

යා වෙදනා තෙසං තෙසං පරසත්තානං පරපුග්ගලානං අජ්ඣත්තං පච්චත්තං නියකා පාටිපුග්ගලිකා උපාදින්නා සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා, අයං වුච්චති වෙදනා බහිද්ධා.

20. තත්‍ථ කතමා වෙදනා ඔළාරිකා සුඛුමා:

අකුසලා වෙදනා ඔළාරිකා, කුසලාබ්‍යාකතා වෙදනා සුඛුමා, කුසලාකුසලා වෙදනා ඔළාරිකා, අබ්‍යාකතා වෙදනා සුඛුමා, දුක්ඛා වෙදනා ඔළාරිකා, සුඛා ච අදුක්ඛමසුඛා ච වෙදනා සුඛුමා, සුඛදුක්ඛා වෙදනා ඔළාරිකා, අදුක්ඛමසුඛා වෙදනා සුඛුමා, අසමාපන්නස්ස වෙදනා ඔළාරිකා, සමාපන්නස්ස වෙදනා සුඛුමා, සාසවා වෙදනා ඔළාරිකා, අනාසවා වෙදනා සුඛුමා, තං තං වා පන වෙදනං උපාදායුපාදාය වෙදනා ඔළාරිකා සුඛුමා දට්ඨබ්බා.

21. තත්‍ථ කතමා වෙදනා හීනා පණීතා:

අකුසලා වෙදනා හීනා, කුසලාබ්‍යාකතා වෙදනා පණීතා, කුසලාකුසලා වෙදනා හීනා, අබ්‍යාකතා වෙදනා පණීතා, දුක්ඛාවෙදනා හීනා, සුඛා ච අදුක්ඛමසුඛා ච වෙදනා පණීතා, සුඛදුක්ඛා වෙදනා හීනා, අදුක්ඛමසුඛා වෙදනා පණීතා, අසමාපන්නස්ස වෙදනා හීනා, සමාපන්නස්ස වෙදනා පණීතා, සාසවා වෙදනා හීනා, අනාසවා වෙදනා පණීතා, තං තං වා පන වෙදනං උපාදායුපාදාය වෙදනා හීනා පණීතා දට්ඨබ්බා.

15. එහි අතීතවෙදනා කවර යත් :

ඉක්ම ගියා වූ නිරුද්ධ වූ පහ වැ ගියා වූ විපරිණත වූ අස්තයට ගියා වූ වෙසෙසින් අස්තයට ගියා වූ ඉපද පහ වැ ගියා වූ අතීත වූ අතීතාංශයෙන් සඞ්ගෘහීත වූ යම් වෙදනාවක් වේ ද, එබඳු වූ සුඛවෙදනා යැ දුඃඛවෙදනා යැ උපෙක්ෂා වෙදනා යැ යන මේ ' අතීතවෙදනා ' යි කියනු ලැබෙ.

16. එහි අනාගතවෙදනා කවර යත් :

නො හටගත් නො වූ ප්‍රත්‍යයසමවායයෙන් නූපන් නො නිපන් වෙසෙසින් නො නිපන් නො පහළ වූ නූපන් ප්‍රත්‍යයසමවායයෙන් නූපන් අනුත්ථිත වූ අසමුත්ථිත වූ අනාගත වූ අනාගතාංශයෙන් සඞ්ගෘහීත වූ යම් වෙදනාවක් වේ ද, එබඳු වූ සුඛවෙදනා යැ දුඃඛවෙදනා යැ උපෙක්ෂාවෙදනා යැ යන මේ ' අනාගත වෙදනා ' යි කියනු ලැබෙ.

17. එහි ප්‍රත්‍යුත්පන්නවෙදනා කවර යත් :

හටගත් උපන් ප්‍රත්‍යයසමවායයෙන් උපන් නිපන් වෙසෙසින් නිපන් පහළ වූ උත්පන්න වූ සමුත්පන්න වූ උත්ථිත වූ සමුත්ථිත වූ ප්‍රත්‍යුත්පන්න වූ ප්‍රත්‍යුත්පන්නාංශයෙන් සඞ්ගෘහීත වූ යම් වෙදනාවක් වේ ද එබඳු වූ සුඛවෙදනා යැ දුඃඛවෙදනා යැ උපෙක්ෂා වෙදනා යැ යන මේ ' ප්‍රත්‍යුත්පන්නවෙදනා ' යි කියනු ලැබෙ.

18. එහි අධ්‍යාත්මවෙදනා කවර යත් :

ඒ ඒ සත්ත්වයන්ගේ තමතමන් අයත් වූ තමතමන් කෙරෙහි වූ ස්වකීය වූ එක් එක් පුද්ගලයා සතු වූ ශරීරස්ථ වූ යම් වෙදනාවක් වේ ද එබඳු වූ සුවවෙදනා යැ දුක්වෙදනා යැ නො දුක් නො සුව වෙදනා යැ යන මේ ' අධ්‍යාත්ම වෙදනා ' යි කියනු ලැබෙ.

19. එහි බාහිරවෙදනා කවර යත් :

ඒ ඒ පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ අධ්‍යාත්ම වූ ප්‍රත්‍යාත්ම වූ ස්වකීය වූ ප්‍රාතිපුද්ගලික (වෙන වෙන පුහුලන් සතු) වූ උපාදින්න වූ යම් වෙදනාවක් වේ ද, එබඳු වූ සුඛවෙදනා යැ දුඃඛවෙදනා යැ උපෙක්ෂා වෙදනාය යන මේ ' බාහිරවෙදනා' යි කියනු ලැබෙ.

20. එහි ඖදරික–සූක්ෂ්මවෙදනා කවර යත් :

අකුශලවෙදනාව ඖදරික යැ කුශල–අව්‍යාකෘතවෙදනා සූක්ෂ්ම යි. කුශල–අකුශල වෙදනා ඖදරික යැ අව්‍යාකෘතවෙදනාව සූක්ෂ්ම යි. දුඃඛවෙදනාව ඖදරික යැ සුඛ වූ ද අදුඃඛමසුඛ වූ ද වෙදනා සූක්ෂ්ම යි. සුඛ–දුඃඛවෙදනා ඖදරික යැ අදුඃඛමසුඛවෙදනාව සූක්ෂ්ම යි. සමවත් නො සමවන්හුගේ වෙදනාව ඖදරික යැ සමවත් සමවන්හුගේ වෙදනාව සූක්ෂ්ම යි. ආස්‍රව සහිත වෙදනාව ඖදරික යැ ආස්‍රව රහිත වෙදනාව සූක්ෂ්ම යි. තවද ඒ ඒ වෙදනාව නිසා වෙදනාව ඖදරිකසූක්ෂ්ම යයි දතයුතු.

21. එහි හීන–ප්‍රණීතවෙදනා කවර යත් :

අකුශලවෙදනාව හීන යැ කුශල–අව්‍යාකෘතවෙදනා ප්‍රණීත යි. කුශල–අකුශල වෙදනා හීන යැ අව්‍යාකෘතවෙදනාව ප්‍රණීත යි. දුඃඛවෙදනාව හීන යැ සුඛ වූ ද අදුඃඛමසුඛ වූ ද වෙදනා ප්‍රණීත යි. සුඛ–දුඃඛවෙදනා හීන යැ අදුඃඛමසුඛවෙදනාව ප්‍රණීත යි. සමවත් නො සමවන්හුගේ වෙදනාව හීන යැ සමවත් සමවන්හුගේ වෙදනාව ප්‍රණීත යි. ආස්‍රව සහිත වෙදනාව හීන යැ ආස්‍රව රහිත වෙදනාව ප්‍රණීත යි. තවද ඒ ඒ වෙදනාව නිසා හීන–ප්‍රණීතවෙදනා දතයුතු.

22. තත්ථ කතමා වෙදනා දූරෙ:

අකුසලා වෙදනා කුසලාබ්‍යාකතාහි වෙදනාහි දූරෙ, කුසලාබ්‍යාකතා වෙදනා අකුසලාය වෙදනාය දූරෙ, කුසලා වෙදනා අකුසලාබ්‍යාකතාහි වෙදනාහි දූරෙ, අකුසලාබ්‍යාකතා වෙදනා කුසලාය වෙදනාය දූරෙ, අබ්‍යාකතා වෙදනා කුසලාකුසලාහි වෙදනාහි දූරෙ, කුසලාකුසලා වෙදනා අබ්‍යාකතාය වෙදනාය දූරෙ, දුක්ඛා වෙදනා සුඛාය ච අදුක්ඛමසුඛාය ච වෙදනාහි දූරෙ, සුඛා ච අදුක්ඛමසුඛා ච වෙදනා දුක්ඛාය වෙදනාය දූරෙ, සුඛා වෙදනා දුක්ඛාය ච අදුක්ඛමසුඛාය ච වෙදනාහි දූරෙ, දුක්ඛා ච අදුක්ඛමසුඛා ච වෙදනා සුඛාය වෙදනාය දූරෙ, අදුක්ඛමසුඛා වෙදනා සුඛදුක්ඛාහි වෙදනාහි දූරෙ, සුඛදුක්ඛා වෙදනා අදුක්ඛමසුඛාය වෙදනාය දූරෙ, අසමාපන්නස්ස වෙදනා සමාපන්නස්ස වෙදනාය දූරෙ, සමාපන්නස්ස වෙදනා අසමාපන්නස්ස වෙදනාය දූරෙ, සාසවා වෙදනා අනාසවාය වෙදනාය දූරෙ, අනාසවා වෙදනා සාසවාය වෙදනාය දූරෙ, අයං වුච්චති වෙදනා දූරෙ.

23. තත්ථ කතමා වෙදනා සන්තිකෙ:

අකුසලා වෙදනා අකුසලාය වෙදනාය සන්තිකෙ, කුසලා වෙදනා කුසලාය වෙදනාය සන්තිකෙ, අබ්‍යාකතා වෙදනා අබ්‍යාකතාය වෙදනාය සන්තිකෙ, දුක්ඛා වෙදනා දුක්ඛාය වෙදනාය සන්තිකෙ, සුඛා වෙදනා සුඛාය වෙදනාය සන්තිකෙ, අදුක්ඛමසුඛා වෙදනා අදුක්ඛමසුඛාය වෙදනාය සන්තිකෙ, අසමාපන්නස්ස වෙදනා අසමාපන්නස්ස වෙදනාය සන්තිකෙ, සමාපන්නස්ස වෙදනා සමාපන්නස්ස වෙදනාය සන්තිකෙ, සාසවා වෙදනා සාසවාය වෙදනාය සන්තිකෙ, අනාසවා වෙදනා අනාසවාය වෙදනාය සන්තිකෙ, අයං වුච්චති වෙදනා සන්තිකෙ. තං තං වා පන වෙදනං උපාදායුපාදාය වෙදනා දූරෙ සන්තිකෙ දට්ඨබ්බා.

24. තත්ථ කතමො සඤ්ඤාක්ඛන්ධො:

යා කාචි සඤ්ඤා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තා වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යා දූරෙ සන්තිකෙ වා තදෙකජ්ඣං අභිසඤ්ඤූහිත්වා අභිසඞ්ඛිපිත්වා, අයං වුච්චති සඤ්ඤාක්ඛන්ධො.

25. තත්ථ කතමා සඤ්ඤා අතීතා:

යා සඤ්ඤා අතීතා නිරුද්ධා විගතා විපරිණතා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා උප්පජ්ජිත්වා විගතා අතීතා අතීතංසෙන සඞ්ගහිතා චක්ඛුසම්ඵස්සජා සඤ්ඤා සොතසම්ඵස්සජා සඤ්ඤා ඝානසම්ඵස්සජා සඤ්ඤා ජිව්හාසම්ඵස්සජා සඤ්ඤා කායසම්ඵස්සජා සඤ්ඤා මනොසම්ඵස්සජා සඤ්ඤා, අයං වුච්චති සඤ්ඤා අතීතා.

26. තත්ථ කතමා සඤ්ඤා අනාගතා:

යා සඤ්ඤා අජාතා අභූතා අසඤ්ජාතා අනිබ්බත්තා අනභිනිබ්බත්තා අපාතුභූතා අනුප්පන්නා අසමුප්පන්නා අනුට්ඨිතා අසමුට්ඨිතා අනාගතා අනාගතංසෙන සඞ්ගහිතා චක්ඛුසම්ඵස්සජා සඤ්ඤා සොතසම්ඵස්සජා සඤ්ඤා ඝානසම්ඵස්සජා සඤ්ඤා ජිව්හාසම්ඵස්සජා සඤ්ඤා කායසම්ඵස්සජා සඤ්ඤා මනොසම්ඵස්සජා සඤ්ඤා, අයං වුච්චති සඤ්ඤා අනාගතා.

22. එහි දූරෙවෙදනා කවර යත් :

අකුශලවෙදනාව කුශලාව්‍යාකෘතවෙදනාවන් කෙරෙන් දුර වෙයි. කුශලාව්‍යාකෘත වෙදනා අකුශලවෙදනායෙන් දුර වෙයි. කුශලවෙදනාව අකුශල–අව්‍යාකෘතවෙදනාවන් කෙරෙන් දුර වෙයි. අකුශල–අව්‍යාකෘතවෙදනා කුශලවෙදනායෙන් දුර වෙයි. අව්‍යාකෘතවෙදනාව කුශලාකුශලවෙදනාවන් කෙරෙන් දුර වෙයි. කුශලාකුශලවෙදනා අව්‍යාකෘතවෙදනායෙන් දුර වෙයි. දුඃඛවෙදනාව සුඛ–උපෙක්ෂාවෙදනාවන් කෙරෙන් දුර වෙයි. සුඛවෙදනාව ද උපෙක්ෂාවෙදනාව ද දුඃඛවෙදනාව කෙරෙන් දුර වෙයි. සුඛවෙදනාව දුඃඛොපෙක්ෂාවෙදනාවන් කෙරෙන් දුර වෙයි. දුඃඛොපෙක්ෂාවෙදනා සුඛවෙදනාව කෙරෙන් දුර වෙයි. උපෙක්ෂාවෙදනාව සුඛදුඃඛවෙදනාවන් කෙරෙන් දුර වෙයි. සුඛදුඃඛවෙදනා උපෙක්ෂාවෙදනායෙන් දුර වෙයි. සමවතට නො සමවන්හුගේ වෙදනාව සමවතට සමවන්හුගේ වෙදනායෙන් දුර වෙයි. සමවතට සමවන්හුගේ වෙදනාව සමවතට නො සමවන්හුගේ වෙදනායෙන් දුර වෙයි. සාස්‍රව වෙදනාව අනාස්‍රවවෙදනායෙන් දුර වෙයි. අනාස්‍රවවෙදනාව සාස්‍රවවෙදනායෙන් දුර වේ. මේ ' දූරෙවෙදනා ' යි කියනු ලැබේ.

23. එහි සන්තිකෙවෙදනා කවර යත් :

අකුශලවෙදනාව අකුශලවෙදනාවට ළඟ වෙයි. කුශලවෙදනාව කුශලවෙදනාවට ළඟ වෙයි. අව්‍යාකෘතවෙදනාව අව්‍යාකෘතවෙදනාවට ළඟ වෙයි. දුඃඛවෙදනාව දුඃඛවෙදනාවට ළඟ වෙයි. සුඛවෙදනාව සුඛවෙදනාවට ළඟ වෙයි. උපෙක්ෂා වෙදනාව උපෙක්ෂාවෙදනාවට ළඟ වෙයි. අසමාපන්නයාගේ වෙදනාව අසමාපන්න යාගේ වෙදනාවට ළඟ වෙයි. සමාපන්නයාගේ වෙදනාව සමාපන්නයාගේ වෙදනාවට ළඟ වෙයි. සාස්‍රවවෙදනාව සාස්‍රවවෙදනාවට ළඟ වෙයි. අනාස්‍රවවෙදනාව අනාස්‍රව වෙදනාවට ළඟ වේ. මේ ' සන්තිකෙවෙදනා ' යි කියනු ලැබේ. ඒ ඒ වෙදනාව නිසා ' දූරෙ සන්තිකෙ වෙදනා ' දතයුතු.

24. එහි සංඥාස්කන්ධය කවරෙ යත් :

අධ්‍යාත්ම වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ යම්කිසි සංඥාවක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ ඒ සියල්ල එක් අයුරෙකින් කැටි කොට හකුළුවා මේ ' සංඥාස්කන්ධ ' යි කියනු ලැබේ.

25. එහි අතීතසංඥා කවර යත් :

ඉක්මගියා වූ නිරුද්ධ වූ පහවැගියා වූ විපරිණත වූ අස්තයට ගියා වූ වෙසෙසින් අස්තයට ගියා වූ ඉපද පහවැගියා වූ අතීත වූ අතීතාංශයෙන් සඞ්ගෘහීත වූ යම් සංඥාවක් වේ ද, එබඳු වූ චක්ඛුසම්ඵස්සයෙන් උපන් සංඥා යැ සොතසම්ඵස්සයෙන් උපන් සංඥා යැ ඝානසම්ඵස්සයෙන් උපන් සංඥා යැ ජිව්හාසම්ඵස්සයෙන් උපන් සංඥා යැ කායසම්ඵස්සයෙන් උපන් සංඥා යැ මනොසම්ඵස්සයෙන් උපන් සංඥා යි. මේ ' අතීතසංඥා ' යි කියනු ලැබේ.

26. එහි අනාගතසංඥා කවර යත් :

තීණි සච්චානි සියා අතීතා, සියා අනාගතා, සියා පච්චුප්පන්නා. නිරොධසච්චං න වත්තබ්බං අතීතන්ති'පි අනාගතන්ති'තිපි පච්චුප්පන්නන්ති'පි.

නිරොධසච්චං අනාරම්මණං. මග්ගසච්චං න වත්තබ්බං අතීතාරම්මණන්ති'පි අනාගතාරම්මණන්ති'පි පච්චුප්පන්නාරම්මණන්ති'පි. ද්වෙ සච්චා සියා අතීතාරම්මණා, සියා අනාගතාරම්මණා, සියා පච්චුප්පන්නාරම්මණා, සියා න වත්තබ්බා අතීතාරම්මණාතිපි අනාගතාරම්මණාතිපි පච්චුප්පන්නාරම්මණාති'පි.

නිරොධසච්චං බහිද්ධා. තීණි සච්චානි සියා අජ්ඣත්තා, සියා බහිද්ධා, සියා අජ්ඣත්තබහිද්ධා.

නිරොධසච්චං අනාරම්මණං. මග්ගසච්චං බහිද්ධාරම්මණං. සමුදයසච්චං සියා අජ්ඣත්තාරම්මණං, සියා බහිද්ධාරම්මණං, සියා අජ්ඣත්ත බහිද්ධාරම්මණං. දුක්ඛසච්චං සියා අජ්ඣත්තාරම්මණං, සියා බහිද්ධාරම්මණං, සියා අජ්ඣත්තබහිද්ධාරම්මණං, සියා න වත්තබ්බං අජ්ඣත්තාරම්මණන්ති'පි බහිද්ධාරම්මණන්ති'පි අජ්ඣත්තබහිද්ධාරම්මණන්ති'පි.

තීණි සච්චානි අනිදස්සනඅප්පටිඝා. දුක්ඛසච්චං සියා සනිදස්සනසප්පටිඝං, සියා අනිදස්සනසප්පටිඝං, සියා අනිදස්සනඅප්පටිඝං.

296. සමුදයසච්චං හෙතු. නිරොධසච්චං න හෙතු. ද්වෙ සච්චා සියා හෙතු, සියා න හෙතු.

ද්වෙ සච්චා සහෙතුකා. නිරොධසච්චං අහෙතුකං. දුක්ඛසච්චං සියා සහෙතුකං, සියා අහෙතුකං.

ද්වෙ සච්චා හෙතුසම්පයුත්තා. නිරොධසච්චං හෙතුවිප්පයුත්තං. දුක්ඛසච්චං සියා හෙතුසම්පයුත්තං, සියා හෙතුවිප්පයුත්තං.

සමුදයසච්චං හෙතු චෙව සහෙතුකඤ්ච. නිරොධසච්චං න වත්තබ්බං හෙතු චෙව සහෙතුකන්ති'පි සහෙතුකඤ්චෙ'ව න ච හෙතූති'පි. මග්ගසච්චං සියා හෙතු චෙව සහෙතුකඤ්ච, සියා සහෙතුකඤ්චෙව න ච හෙතු. දුක්ඛසච්චං සියා හෙතුචෙ'ව සහෙතුකඤ්ච සියා සහෙතුකඤ්චෙව න ච හෙතු, සියා න වත්තබ්බං හෙතුචෙ'ව සහෙතුකන්ති'පි සහෙතුකඤ්චෙව න ච හෙතූති'පි.

සමුදයසච්චං හෙතුචෙ'ව හෙතුසම්පයුත්තඤ්ච. නිරොධසච්චං න වත්තබ්බං හෙතුචෙව හෙතුසම්පයුත්තන්ති'පි හෙතුසම්පයුත්තඤ්චෙව න ච හෙතූති'පි. මග්ගසච්චං සියා හෙතුචෙ'ව හෙතුසම්පයුත්තඤ්ච, සියා හෙතුසම්පයුත්තඤ්චෙ'ව න ච හෙතු. දුක්ඛසච්චං සියා හෙතුචෙ'ව හෙතුසම්පයුත්තඤ්ච, සියා හෙතුසම්පයුත්තඤ්චෙව න ච හෙතු, සියා න වත්තබ්බං හෙතුචෙ'ව හෙතුසම්පයුත්තන්ති'පි. හෙතුසම්පයුත්තඤ්චෙ'ව න ච හෙතූති'පි.

නිරොධසච්චං න හෙතුඅහෙතුකං. සමුදයසච්චං න වත්තබ්බං න හෙතු සහෙතුකන්ති'පි න හෙතු අහෙතුකන්ති'පි. මග්ගසච්චං සියා න හෙතු සහෙතුකං, සියා න වත්තබ්බං න හෙතු සහෙතුකන්ති'පි න හෙතු අහෙතුකන්ති'පි. දුක්ඛසච්චං සියා න හෙතු සහෙතුකං, සියා න හෙතු අහෙතුකං. සියා න වත්තබ්බං න හෙතු සහෙතුකන්ති'පි න හෙතු අහෙතුකන්ති'පි.

සත්‍යයෝ දෙදෙනෙක් උත්පන්න ද වන්නාහ, අනුත්පන්න ද වන්නාහ, උත්පාදීහු යයි නො කියයුත්තාහ. නිරොධසත්‍යය උත්පන්න යි ද අනුත්පන්න යි ද උත්පාදී යයි ද නො කියයුත්තේ ය. දුඃඛසත්‍යය උත්පන්න ද වන්නේ ය, අනුත්පන්න ද වන්නේ ය, උත්පාදී ද වන්නේ යි.

සත්‍යයෝ තිදෙනෙක් අතීත ද වන්නාහ, අනාගත ද වන්නාහ, ප්‍රත්‍යුත්පන්න ද වන්නාහ, නිරොධසත්‍යය අතීත යි ද අනාගත යි ද ප්‍රත්‍යුත්පන්න යි ද නො කියයුත්තේ යි.

නිරොධසත්‍යය අනාලම්බන ය. මාර්ගසත්‍යය අතීතාලම්බන යි ද අනාගතාලම්බන යි ද ප්‍රත්‍යුත්පන්නාලම්බන යි ද නො කියයුත්තේ ය. සත්‍යයෝ දෙදෙනෙක් අතීතාලම්බන ද වන්නාහ, අනාගතාලම්බන ද වන්නාහ, ප්‍රත්‍යුත්පන්නාලම්බන ද වන්නාහ, අතීතාලම්බන යි ද අනාගතාලම්බන යි ද ප්‍රත්‍යුත්පන්නාලම්බන යි ද නො කියයුතු වන්නාහු යි.

නිරොධසත්‍යය බාහිර ය. සත්‍යයෝ තිදෙනෙක් අධ්‍යාත්ම ද වන්නාහ, බාහිර ද වන්නාහ, අධ්‍යාත්මබාහිර ද වන්නාහු යි.

නිරොධසත්‍යය අනාලම්බන ය. මාර්ගසත්‍යය බාහිරාලම්බන ය. සමුදයසත්‍යය අධ්‍යාත්මාලම්බන ද වන්නේ ය, බාහිරාලම්බන ද වන්නේ ය, අධ්‍යාත්මබාහිරාලම්බන ද වන්නේ ය. දුඃඛසත්‍යය අධ්‍යාත්මාලම්බන ද වන්නේ ය, බාහිරාලම්බන ද වන්නේ ය, අධ්‍යාත්මබාහිරාලම්බන ද වන්නේ ය, අධ්‍යාත්මාලම්බන යි ද බාහිරාලම්බන යි ද අධ්‍යත්මබාහිරාලම්බන යි ද නො කියයුතු වන්නේ යි.

සත්‍යයෝ තිදෙනෙක් අනිදර්ශනඅප්‍රතිඝයෝ ය. දුඃඛසත්‍යය සනිදර්ශනසප්‍රතිඝ ද වන්නේ ය. අනිදර්ශනසප්‍රතිඝ ද වන්නේ ය, අනිදර්ශනඅප්‍රතිඝ ද වන්නේ යි.

296. සමුදයසත්‍යය හෙතු වෙයි. නිරොධසත්‍යය හෙතු නො වෙයි. සත්‍යයෝ දෙදෙනෙක් හෙතු ද වන්නාහ, නො ද හෙතු ද වන්නාහු යි.

සත්‍යයෝ දෙදෙනෙක් සහෙතුකයෝ ය. නිරොධසත්‍යය අහෙතුක ය. දුඃඛසත්‍යය සහෙතුක ද වන්නේ ය, අහෙතුක ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් හෙතුසම්ප්‍රයුක්තයෝ ය. නිරොධසත්‍යය හෙතුවිප්‍රයුක්ත ය. දුඃඛසත්‍යය හෙතුසම්ප්‍රයුක්ත ද වන්නේ ය, හෙතුවිප්‍රයුක්ත ද වන්නේ යි.

සමුදයසත්‍යය හෙතු ද වූයේ ම සහෙතුක ද වෙයි. නිරොධසත්‍යය හෙතු ද වූයේ ම සහෙතුක යි ද සහෙතුක ද වූයේ ම නො ද හෙතු යි ද නො කියයුතු වන්නේ ය. මාර්ග සත්‍යය හෙතු ද වූයේ ම සහෙතුක ද වන්නේ ය. සහෙතුක ද වූයේ ම නො ද හෙතු ද වන්නේ ය. දුඃඛසත්‍යය හෙතු ද වූයේ ම සහෙතුක ද වන්නේ ය, සහෙතුක ද වූයේ ම නො ද හෙතු වන්නේ ය, හෙතු ද වූයේ ම සහෙතුක යි ද සහෙතුක ද වූයේ ම නො ද හෙතු යි ද නො කියයුතු වන්නේ යි.

සමුදයසත්‍යය හෙතු ද වූයේ ම හෙතුසම්ප්‍රයුක්ත ද වෙයි. නිරොධසත්‍යය හෙතු ද වූයේ ම හෙතුසම්ප්‍රයුක්ත යි ද හෙතුසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද හෙතු යි ද නො කියයුතු වන්නේ ය. මාර්ගසත්‍යය හෙතු ද වූයේ ම හෙතුසම්ප්‍රයුක්ත ද වන්නේ ය. හෙතු සම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද හෙතු ද වන්නේ ය. දුඃඛසත්‍යය හෙතු ද වූයේ ම හෙතු සම්ප්‍රයුක්ත ද වන්නේ ය, හෙතුසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද හෙතු ද වන්නේ ය, හෙතු ද වූයේ ම හෙතුසම්ප්‍රයුක්ත යි ද හෙතුසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද හෙතු යි ද නො කියයුතු වන්නේ යි.

නිරොධසත්‍යය හෙතු නො වූ අහෙතුක වෙයි. සමුදයසත්‍යය හෙතු නො වූ සහෙතුක යි ද හෙතු නො වූ අහෙතුක යි ද නො කියයුතු ය. මාර්ගසත්‍යය හෙතු නො වූ සහෙතුක ද වන්නේ ය, හෙතු නො වූ සහෙතුක යි ද හෙතු නො වූ අහෙතුක යි ද නො කියයුතු වන්නේ ය. දුඃඛසත්‍යය හෙතු නො වූ සහෙතුක ද වන්නේ ය, හෙතු නො වූ අහෙතුක ද වන්නේ ය, හෙතු නො වූ සහෙතුක යි ද හෙතු නො වූ අහෙතුක යි ද නො කියයුතු වන්නේ යි.

297. තීණි සච්චානි සප්පච්චයා. නිරොධසච්චං අප්පච්චයං.

තීණි සච්චානි සඞ්ඛතා. නිරොධසච්චං අසඞ්ඛතං.

තීණි සච්චානි අනිදස්සනා. දුක්ඛසච්චං සියා සනිදස්සනං, සියා අනිදස්සනං.

තීණි සච්චානි අප්පටිඝා. දුක්ඛසච්චං සියා සප්පටිඝං සියා අප්පටිඝං.

තීණි සච්චානි අරූපානි. දුක්ඛසච්චං සියා රූපං, සියා අරූපං.

ද්වෙ සච්චා ලොකියා. ද්වෙ සච්චා ලොකුත්තරා.

කෙනචි විඤ්ඤෙය්‍යා, කෙනචි න විඤ්ඤෙය්‍යා.

298. සමුදයසච්චං ආසවො. ද්වෙ සච්චා නො ආසවා. දුක්ඛසච්චං සියා ආසවො, සියා නො ආසවො.

ද්වෙ සච්චා සාසවා. ද්වෙ සච්චා අනාසවා.

සමුදයසච්චං ආසවසම්පයුත්තං. ද්වෙ සච්චා ආසවවිප්පයුත්තා. දුක්ඛසච්චං සියා ආසවසම්පයුත්තං, සියා ආසවවිප්පයුත්තං.

සමුදයසච්චං ආසවො චෙව සාසවඤ්ච. ද්වෙ සච්චා න වත්තබ්බා ආසවා චෙව සාසවාති'පි සාසවා චෙව නො ච ආසවාති'පි. දුක්ඛසච්චං සියා ආසවො චෙව සාසවඤ්ච, සියා සාසවඤ්චෙ'ව නො ච ආසවො.

සමුදයසච්චං ආසවො චෙව ආසවසම්පයුත්තඤ්ච. ද්වෙ සච්චා න වත්තබ්බා ආසවා චෙව ආසවසම්පයුත්තාති'පි ආසවසම්පයුත්තා චෙව නො ච ආසවාති'පි. දුක්ඛසච්චං සියා ආසවො චෙව ආසවසම්පයුත්තඤ්ච, සියා ආසවසම්පයුත්තඤ්චෙව නො ච ආසවො, සියා න වත්තබ්බං ආසවො චෙව ආසවසම්පයුත්තන්ති'පි ආසවසම්පයුත්තඤ්චෙ'ව නො ච ආසවොති'පි.

ද්වෙ සච්චා ආසවවිප්පයුත්තඅනාසවා. සමුදයසච්චං න වත්තබ්බං ආසවවිප්පයුත්ත සාසවන්තිපි ආසවවිප්පයුත්තඅනාසවන්තිපි. දුක්ඛසච්චං සියා ආසවවිප්පයුත්තසාසවං, සියා න වත්තබ්බං ආසවවිප්පයුත්තසාසවන්ති'පි ආසවවිප්පයුත්තඅනාසවන්තිපි.

299. සමුදයසච්චං සංයොජනං. ද්වෙ සච්චා නො සංයොජනා. දුක්ඛසච්චං සියා සඤ්ඤොජනං, සියා නො සඤ්ඤොජනං.

ද්වෙ සච්චා සඤ්ඤොජනියා. ද්වෙ සච්චා අසඤ්ඤොජනියා.

සමුදයසච්චං සඤ්ඤොජනසම්පයුත්තං. ද්වෙ සච්චා සඤ්ඤොජනවිප්පයුත්තා. දුක්ඛසච්චං සියා සඤ්ඤොජනසම්පයුත්තං, සියා සඤ්ඤොජනවිප්පයුත්තං.

සමුදයසච්චං සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනියඤ්ච. ද්වෙ සච්චා න වත්තබ්බා සඤ්ඤොජනා චෙව සඤ්ඤොජනියාති'පි සඤ්ඤොජනියා චෙව නො ච සඤ්ඤොජනාති'පි. දුක්ඛසච්චං සියා සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනියඤ්ච, සියා සඤ්ඤොජනියඤ්චෙව නො ච සඤ්ඤොජනං.

297. සත්‍යයෝ තිදෙනෙක් සප්‍රත්‍යයෝ ය. නිරොධසත්‍යය අප්‍රත්‍යය යි.

සත්‍යයෝ තිදෙනෙක් සංඛතයෝ ය. නිරොධසත්‍යය අසංඛත යි.

සත්‍යයෝ තිදෙනෙක් අනිදර්ශනයෝ ය. දුඃඛසත්‍යය සනිදර්ශන ද වන්නේ ය; අනිදර්ශන ද වන්නේ යි.

සත්‍යයෝ තිදෙනෙක් අප්‍රතිඝයෝ ය. දුඃඛසත්‍යය සප්‍රතිඝ ද වන්නේ ය, අප්‍රතිඝ ද වන්නේ යි.

සත්‍යයෝ තිදෙනෙක් අරූපයෝ ය. දුඃඛසත්‍යය රූප ද වන්නේ ය, අරූප ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් ලෞකිකයෝ ය. සත්‍යයෝ දෙදෙනෙක් ලොකොත්තරයෝ යි.

චතුස්සත්‍යයෝ කිසිවිඥානයෙකින් දතයුත්තාහ, කිසිවිඥානයෙකින් නො දතයුත්තාහු යි.

298. සමුදයසත්‍යය ආස්‍රවයෙකි. සත්‍යයෝ දෙදෙනෙක් ආස්‍රවයෝ නො වෙති. දුඃඛසත්‍යය ආස්‍රවයෙක් ද වන්නේ ය, නො ද ආස්‍රවයෙක් ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් ආස්‍රව සහිතයෝ ය. සත්‍යයෝ දෙදෙනෙක් අනාස්‍රවයෝ යි.

සමුදයසත්‍යය ආස්‍රවසම්ප්‍රයුක්ත ය. සත්‍යයෝ දෙදෙනෙක් ආස්‍රවවිප්‍රයුක්තයෝ ය. දුඃඛසත්‍යය ආස්‍රවසම්ප්‍රයුක්ත ද වන්නේ ය, ආස්‍රවවිප්‍රයුක්ත ද වන්නේ යි.

සමුදයසත්‍යය ආස්‍රවයෙක් ද වූයේ ම සාස්‍රව ද වෙයි. සත්‍යයෝ දෙදෙනෙක් ආස්‍රව ද වූ ම සාස්‍රවහ යි ද සාස්‍රව ද වූ ම නො ද ආස්‍රවහ යි ද නො කියයුත්තාහ. දුඃඛසත්‍යය ආස්‍රවයෙක් ද වූයේ ම සාස්‍රව ද වන්නේ ය, සාස්‍රව ද වූයේ ම නො ද ආස්‍රව ද වන්නේ යි.

සමුදයසත්‍යය ආස්‍රව ද වූයේ ම ආස්‍රවසම්ප්‍රයුක්තයෙක් ද වන්නේ ය. සත්‍යයෝ දෙදෙනෙක් ආස්‍රව ද වූවාහු ම ආස්‍රවසම්ප්‍රයුක්තහ යි ද ආස්‍රවසම්ප්‍රයුක්ත ද වූ ම නො ද ආස්‍රවහ යි ද නො කියයුත්තාහ. දුඃඛසත්‍යය ආස්‍රව ද වූයේ ම ආස්‍රවසම්ප්‍රයුක්ත ද වන්නේ ය, ආස්‍රවසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද ආස්‍රව ද වන්නේ ය, ආස්‍රවයෙක් ද වූයේ ම ආස්‍රවසම්ප්‍රයුක්ත යි ද ආස්‍රවසම්ප්‍රයුක්ත ද වූ ම නො ද ආස්‍රවයෙකැ යි ද නො කියයුතු වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් ආස්‍රවවිප්‍රයුක්ත අනාස්‍රවයෝ ය. සමුදයසත්‍යය ආස්‍රවවිප්‍රයුක්තසාස්‍රවයෙකැ යි ද ආස්‍රවවිප්‍රයුක්තඅනාස්‍රවයෙකැ යි ද නො කියයුත්තේ ය, දුඃඛසත්‍යය ආස්‍රවවිප්‍රයුක්තසාස්‍රවයෙක් ද වන්නේ ය. ආස්‍රවවිප්‍රයුක්තසාස්‍රවයෙකැ යි ද ආස්‍රවවිප්‍රයුක්තඅනාස්‍රවයෙකැ යි ද නො කියයුතු වන්නේ යි.

299. සමුදයසත්‍යය සංයොජනයෙකි. සත්‍යයෝ දෙදෙනෙක් සංයොජන නො වන්නාහ. දුඃඛසත්‍යය සංයොජන ද වන්නේ ය, නො ද සංයොජන ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් සංයොජනියයෝ වෙති. සත්‍යයෝ දෙදෙනෙක් අසංයොජනියයෝ වෙත්.

සමුදයසත්‍යය සංයොජනසම්ප්‍රයුක්ත ය. සත්‍යයෝ දෙදෙනෙක් සංයොජනවිප්‍රයුක්තයෝ ය. දුඃඛසත්‍යය සංයොජනසම්ප්‍රයුක්ත ද වන්නේ ය. සංයොජනවිප්‍රයුක්ත ද වන්නේ යි.

සමුදයසත්‍යය සංයොජන ද වූයේ ම සංයොජනිය ද වෙයි. සත්‍යයෝ දෙදෙනෙක් සංයොජන ද වූවාහු ම සංයොජනිය වෙති ද සංයොජනිය ද වූවාහු ම නො ද සංයොජන වෙති ද නො කියයුත්තාහ. දුඃඛසත්‍යය සංයොජන ද වූයේ ම සංයොජනියයෙක් ද වන්නේ ය, සංයොජනිය ද වූයේ ම නො ද සංයොජනයෙක් ද වන්නේ යි.

සමුදයසච්චං සඤ්ඤොජනඤ්චෙ'ව සඤ්ඤොජනසම්පයුත්තඤ්ච. ද්වෙ සච්චා න වත්තබ්බා සඤ්ඤොජනා චෙව සඤ්ඤොජනසම්පයුත්තාති'පි, සඤ්ඤොජනසම්පයුත්තා චෙව නො ච සඤ්ඤොජනාති'පි. දුක්ඛසච්චං සියා සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තඤ්ච, සියා සඤ්ඤොජනසම්පයුත්තඤ්චෙ'ව නො ච සඤ්ඤොජනං, සියා න වත්තබ්බං සඤ්ඤොජනඤ්චෙව සඤ්ඤොජනසම්පයුත්තන්ති'පි, සඤ්ඤොජනසම්පයුත්තඤ්චෙ'ව නො ච සඤ්ඤොජනන්ති'පි.

ද්වෙ සච්චා සඤ්ඤොජනවිප්පයුත්ත අසඤ්ඤොජනියා. සමුදයසච්චං න වත්තබ්බං සඤ්ඤොජනවිප්පයුත්තසඤ්ඤොජනියන්තිපි, සඤ්ඤොජනවිප්පයුත්තඅසඤ්ඤොජනියන්තිපි. දුක්ඛසච්චං සියා සඤ්ඤොජනවිප්පයුත්තසංයොජනියං, සියා න වත්තබ්බං සඤ්ඤොජනවිප්පයුත්තසඤ්ඤොජනියන්ති'පි, සඤ්ඤොජනවිප්පයුත්ත අසඤ්ඤොජනියන්ති'පි.

300. සමුදයසච්චං ගන්ථො. ද්වෙ සච්චා නො ගන්ථා. දුක්ඛසච්චං සියා ගන්ථො, සියා නො ගන්ථො.

ද්වෙ සච්චා ගන්ථනියා. ද්වෙ සච්චා අගන්ථනියා.

ද්වෙ සච්චා ගන්ථවිප්පයුත්තා. ද්වෙ සච්චා සියා ගන්ථසම්පයුත්තා, සියා ගන්ථවිප්පයුත්තා.

සමුදයසච්චං ගන්ථො චෙව ගන්ථනියඤ්ච. ද්වෙ සච්චා න වත්තබ්බා ගන්ථා චෙ'ව ගන්ථනියාති'පි ගන්ථනියා චෙ'ව නො ච ගන්ථාති'පි. දුක්ඛසච්චං සියා ගන්ථො චෙ'ව ගන්ථනියඤ්ච, සියා ගන්ථනියඤ්චෙව නො ච ගන්ථො.

සමුදයසච්චං ගන්ථො චෙව ගන්ථසම්පයුත්තඤ්ච, සියා න වත්තබ්බං ගන්ථො චෙව ගන්ථසම්පයුත්තන්තිපි, ගන්ථසම්පයුත්තඤ්චෙව නො ච ගන්ථොතිපි. ද්වෙ සච්චා න වත්තබ්බා ගන්ථා චෙව ගන්ථසම්පයුත්තාති'පි, ගන්ථසම්පයුත්තා චෙව නො ච ගන්ථාතිපි. දුක්ඛසච්චං සියා ගන්ථො චෙව ගන්ථසම්පයුත්තඤ්ච, සියා ගන්ථසම්පයුත්තඤ්චෙව නො ච ගන්ථො, සියා න වත්තබ්බං ගන්ථො චෙව ගන්ථසම්පයුත්තන්තිපි, ගන්ථසම්පයුත්තඤ්චෙව නො ච ගන්ථොතිපි.

ද්වෙ සච්චා ගන්ථවිප්පයුත්තඅගන්ථනියා. ද්වෙ සච්චා සියා ගන්ථවිප්පයුත්තගන්ථනියා, සියා න වත්තබ්බා ගන්ථවිප්පයුත්තගන්ථනියා තිපි ගන්ථවිප්පයුත්තඅගන්ථනියාතිපි.

301-302-303. සමුදයසච්චං ඔඝො -පෙ- යොගො -පෙ- නීවරණං. ද්වෙ සච්චා නො නීවරණා. දුක්ඛසච්චං සියා නීවරණං, සියා නො නීවරණං.

ද්වෙ සච්චා නීවරණියා. ද්වෙ සච්චා අනීවරණියා.

සමුදයසච්චං නීවරණසම්පයුත්තං. ද්වෙ සච්චා නීවරණවිප්පයුත්තා. දුක්ඛසච්චං සියා නීවරණසම්පයුත්තං, සියා නීවරණවිප්පයුත්තං.

සමුදයසච්චං නීවරණං චෙව නීවරණියඤ්ච. ද්වෙ සච්චා න වත්තබ්බා නීවරණා චෙව නීවරණියාතිපි, නීවරණියා චෙව නො ච නීවරණාතිපි. දුක්ඛසච්චං සියා නීවරණඤ්චෙව නීවරණියඤ්ච, සියා නීවරණියඤ්චෙව නො ච නීවරණං.

සමුදයසත්‍යය සංයොජනයෙක් ද වූයේ ම සංයොජනසම්ප්‍රයුක්ත ද වෙයි. සත්‍යයෝ දෙදෙනෙක් සංයොජන ද වූවාහු ම සංයොජනසම්ප්‍රයුක්තහ යි ද සංයොජනසම්ප්‍රයුක්ත ද වූවාහු ම නො ද සංයොජනහ යි ද නො කියයුත්තාහ. දුඃඛසත්‍යය සංයොජනයෙක් ද වූයේ ම සංයොජනසම්ප්‍රයුක්ත ද වන්නේ ය, සංයොජනසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද සංයොජනයෙක් ද වන්නේ ය, සංයොජන ද වූයේ ම සංයොජනසම්ප්‍රයුක්ත යි ද සංයොජන සම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද සංයොජන යි ද නො කියයුතු වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් සංයොජනවිප්‍රයුක්තඅසංයොජනියයෝ ය. සමුදයසත්‍යය සංයොජනවිප්‍රයුක්තසංයොජනිය යි ද සංයොජනවිප්‍රයුක්තඅසංයොජනිය යි ද නො කිය යුත්තේ ය. දුඃඛසත්‍යය සංයොජනවිප්‍රයුක්ත සංයොජනිය ද වන්නේ ය, සංයොජන විප්‍රයුක්තසංයොජනිය යි ද සංයොජනවිප්‍රයුක්තඅසංයොජනිය යි ද නො කියයුතු වන්නේ යි.

300. සමුදයසත්‍යය ග්‍රන්ථයෙකි. සත්‍යයෝ දෙදෙනෙක් ග්‍රන්ථයෝ නො වෙති. දුඃඛසත්‍යය ග්‍රන්ථයෙක් ද වන්නේ ය, නො ද ග්‍රන්ථයෙක් ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් ග්‍රන්ථනීය වෙති. සත්‍යයෝ දෙදෙනෙක් අග්‍රන්ථනීය වෙත්.

සත්‍යයෝ දෙදෙනෙක් ග්‍රන්ථවිප්‍රයුක්තයෝ ය. සත්‍යයෝ දෙදෙනෙක් ග්‍රන්ථ සම්ප්‍රයුක්ත ද වන්නාහ, ග්‍රන්ථවිප්‍රයුක්ත ද වන්නාහු යි.

සමුදයසත්‍යය ග්‍රන්ථයෙක් ද වූයේ ම ග්‍රන්ථනීය ද වෙයි. සත්‍යයෝ දෙදෙනෙක් ග්‍රන්ථ ද වූවාහු ම ග්‍රන්ථනීය වෙති යි ද ග්‍රන්ථනීය ද වූවාහු ම නොද ග්‍රන්ථ වෙති යි ද නො කිය යුත්තාහ. දුඃඛසත්‍යය ග්‍රන්ථයෙක් ද වූයේ ම ග්‍රන්ථනීය ද වන්නේ ය, ග්‍රන්ථනීය ද වූයේ ම නො ද ග්‍රන්ථයෙක් ද වන්නේ යි.

සමුදයසත්‍යය ග්‍රන්ථයෙක් ද වූයේ ම ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද වෙයි, ග්‍රන්ථයෙක් ද වූයේ ම ග්‍රන්ථසම්ප්‍රයුක්ත යි ද ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද ග්‍රන්ථයෙකැ යි ද නො කියයුතු වන්නේ ය. සත්‍යයෝ දෙදෙනෙක් ග්‍රන්ථ ද වූවාහු ම ග්‍රන්ථසම්ප්‍රයුක්තහ යි ද ග්‍රන්ථ සම්ප්‍රයුක්ත ද වූවාහු ම නො ද ග්‍රන්ථහ යි ද, නො කියයුත්තාහ. දුඃඛසත්‍යය ග්‍රන්ථයෙක් ද වූයේ ම ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද වන්නේ ය, ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද ග්‍රන්ථයෙක් ද වන්නේ ය, ග්‍රන්ථයෙක් ද වූයේ ම ග්‍රන්ථසම්ප්‍රයුක්ත යි ද ග්‍රන්ථසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද ග්‍රන්ථයෙකැ යි ද නො කියයුතු වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් ග්‍රන්ථවිප්‍රයුක්තඅග්‍රන්ථනීය වෙති. සත්‍යයෝ දෙදෙනෙක් ග්‍රන්ථවිප්‍රයුක්ත ග්‍රන්ථනීය ද වන්නාහ, ග්‍රන්ථවිප්‍රයුක්තග්‍රන්ථනීයහ යි ද ග්‍රන්ථවිප්‍රයුක්ත අග්‍රන්ථනීයහ යි ද නො කියයුතු වන්නාහු යි.

301–302–303. සමුදයසත්‍යය ඔඝයෙකි, . . . යොගයෙකි, . . . නීවරණයෙකි, සත්‍යයෝ දෙදෙනෙක් නීවරණයෝ නො වෙති. දුඃඛසත්‍යය නීවරණ ද වන්නේ ය, නීවරණ නො ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් නීවරණීය වෙති. සත්‍යයෝ දෙදෙනෙක් අනීවරණීය වෙත්.

සමුදයසත්‍යය නීවරණසම්ප්‍රයුක්ත ය. සත්‍යයෝ දෙදෙනෙක් නීවරණවිප්‍රයුක්ත යෝ ය. දුඃඛසත්‍යය නීවරණසම්ප්‍රයුක්ත ද වන්නේ ය, නීවරණවිප්‍රයුක්ත ද වන්නේ යි.

සමුදයසත්‍යය නීවරණ ද වූයේ ම නීවරණීය ද වෙයි. සත්‍යයෝ දෙදෙනෙක් නීවරණ ද වූවාහු ම නීවරණීයහ යි ද නීවරණීය ද වූවාහු ම නො ද නීවරණහ යි ද නො කිය යුත්තාහ. දුඃඛසත්‍යය නීවරණ ද වූයේ ම නීවරණීය ද වන්නේ ය, නීවරණීය ද වූයේ ම නො ද නීවරණ ද වන්නේ යි.

සමුදයසච්චං නීවරණඤ්චෙව නීවරණසම්පයුත්තඤ්ච. ද්වෙ සච්චා න වත්තබ්බා නීවරණා චෙව නීවරණසම්පයුත්තා ති'පි, නීවරණසම්පයුත්තා චෙව නො ච නීවරණාතිපි. දුක්ඛසච්චං සියා නීවරණං චෙව නීවරණ සම්පයුත්ත ච, සියා නීවරණසම්පයුත්තං චෙව නො ච නීවරණං, සියා න වත්තබ්බං නීවරණං චෙව නීවරණසම්පයුත්තන්තිපි නීවරණසම්පයුත්තං චෙව නො ච නීවරණන්තිපි.

ද්වෙ සච්චා නීවරණවිප්පයුත්තඅනීවරණියා. සමුදයසච්චං න වත්තබ්බං නීවරණවිප්පයුත්තනීවරණියන්තිපි නීවරණවිප්පයුත්තඅනීවරණියන්ති'පි. දුක්ඛසච්චං සියා නීවරණවිප්පයුත්තනීවරණියං, සියා න වත්තබ්බං නීවරණවිප්පයුත්තනීවරණියන්ති'පි නීවරණවිප්පයුත්තඅනීවරණියන්තිපි.

304. තීණි සච්චානි නො පරාමාසා. දුක්ඛසච්චං සියා පරාමාසො, සියා නො පරාමාසො.

ද්වෙ සච්චා පරාමට්ඨා. ද්වෙ සච්චා අපරාමට්ඨා.

ද්වෙ සච්චා පරාමාසවිප්පයුත්තා. සමුදයසච්චං සියා පරාමාස සම්පයුත්තං, සියා පරාමාසවිප්පයුත්තං. දුක්ඛසච්චං සියා පරාමාස සම්පයුත්තං, සියා පරාමාසවිප්පයුත්තං, සියා න වත්තබ්බං පරාමාස සම්පයුත්තන්ති'පි පරාමාසවිප්පයුත්තන්ති'පි.

සමුදයසච්චං න වත්තබ්බං පරාමාසො චෙව පරාමට්ඨන්ති පරාමට්ඨංචෙව ච නො ච පරාමාසො. ද්වෙ සච්චා න වත්තබ්බා පරාමාසා චෙව පරාමට්ඨාතිපි පරාමට්ඨා චෙව නො ච පරාමාසාති'පි. දුක්ඛසච්චං සියා පරාමාසො චෙව පරාමට්ඨං ච, සියා පරාමට්ඨං චෙව නො ච පරාමාසො.

ද්වෙ සච්චා පරාමාසවිප්පයුත්තඅපරාමට්ඨා. ද්වෙ සච්චා සියා පරාමාසවිප්පයුත්තපරාමට්ඨා, සියා න වත්තබ්බා පරාමාසවිප්පයුත්ත පරාමට්ඨාති'පි පරාමාසවිප්පයුත්ත අපරාමට්ඨාති'පි.

305. ද්වෙ සච්චා සාරම්මණා. නිරොධසච්චං අනාරම්මණං. දුක්ඛසච්චං සියා සාරම්මණං, සියා අනාරම්මණං.

තීණි සච්චානි නො චිත්තා. දුක්ඛසච්චං සියා චිත්තං, සියා නො චිත්තං.

ද්වෙ සච්චා චෙතසිකා. නිරොධසච්චං අචෙතසිකං. දුක්ඛසච්චං සියා චෙතසිකං, සියා අචෙතසිකං.

ද්වෙ සච්චා චිත්තසම්පයුත්තා. නිරොධසච්චං චිත්තවිප්පයුත්තං. දුක්ඛසච්චං සියා චිත්තසම්පයුත්තං, සියා චිත්තවිප්පයුත්තං, සියා න වත්තබ්බං චිත්තෙන සම්පයුත්තන්ති'පි චිත්තෙනවිප්පයුත්තන්ති'පි.

ද්වෙ සච්චා චිත්තසංසට්ඨා. නිරොධසච්චං චිත්තවිසංසට්ඨං. දුක්ඛසච්චං සියා චිත්තසංසට්ඨං, සියා චිත්තවිසංසට්ඨං, සියා න වත්තබ්බං චිත්තෙන සංසට්ඨන්ති'පි, චිත්තෙන විසංසට්ඨන්ති'පි.

සමුදයසත්‍යය නීවරණ ද වූයේ ම නීවරණසම්ප්‍රයුක්ත ද වන්නේ ය. සත්‍යයෝ දෙදෙනෙක් නීවරණ ද වූවාහු ම නීවරණසම්ප්‍රයුක්තහ යි ද නීවරණසම්ප්‍රයුක්ත ද වූවාහු ම නො ද නීවරණහ යි ද නො කියයුත්තාහ. දුඃඛසත්‍යය නීවරණ ද වූයේ ම නීවරණ සම්ප්‍රයුක්ත ද වන්නේ ය, නීවරණසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද නීවරණ ද වන්නේ ය, නීවරණ ද වූයේ ම නීවරණසම්ප්‍රයුක්ත යි ද නීවරණසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද නීවරණ යි ද නො කියයුතු වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් නීවරණවිප්‍රයුක්ත වූ අනීවරණීය වෙති. සමුදයසත්‍යය නීවරණවිප්‍රයුක්තනීවරණීය යි ද නීවරණවිප්‍රයුක්තඅනීවරණීය යි ද නො කියයුත්තේ ය. දුඃඛසත්‍යය නීවරණවිප්‍රයුක්තනීවරණීය ද වන්නේ ය. නීවරණවිප්‍රයුක්තනීවරණීය යි ද නීවරණවිප්‍රයුක්තඅනීවරණීය යි ද නො කියයුතු වන්නේ යි.

304. සත්‍යයෝ තිදෙනෙක් පරාමර්ශයෝ නො වෙති. දුඃඛසත්‍යය පරාමර්ශ ද වන්නේ ය, පරාමර්ශ නො ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් පරාමෘෂ්ටයෝ ය. සත්‍යයෝ දෙදෙනෙක් අපරාමෘෂ්ට යෝ යි.

සත්‍යයෝ දෙදෙනෙක් පරාමර්ශවිප්‍රයුක්තයෝ ය. සමුදයසත්‍යය පරාමර්ශසම්ප්‍රයුක්ත ද වන්නේ ය, පරාමර්ශවිප්‍රයුක්ත ද වන්නේ ය. දුඃඛසත්‍යය පරාමර්ශසම්ප්‍රයුක්ත ද වන්නේ ය, පරාමර්ශවිප්‍රයුක්ත ද වන්නේ ය, පරාමර්ශසම්ප්‍රයුක්ත යි ද පරාමර්ශවිප්‍රයුක්ත යි ද නො කියයුතු වන්නේ යි.

සමුදයසත්‍යය පරාමර්ශ ද වූයේ ම පරාමෘෂ්ට යි නො කියයුත්තේ ය. පරාමෘෂ්ට ද වූයේ ම නො ද පරාමර්ශයෙක් වෙයි. සත්‍යයෝ දෙදෙනෙක් පරාමර්ශ ද වූවාහු ම පරාමෘෂ්ට යි ද පරාමෘෂ්ට ද වූවාහු ම නො ද පරාමර්ශ යි ද නො කියයුත්තාහ. දුඃඛසත්‍යය පරාමර්ශ ද වූයේ ම පරාමෘෂ්ටයෙක් ද වන්නේ ය, පරාමෘෂ්ට ද වූයේ ම නො ද පරාමර්ශයෙක් ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් පරාමර්ශවිප්‍රයුක්තඅපරාමෘෂ්ටයෝ ය. සත්‍යයෝ දෙදෙනෙක් පරාමර්ශවිප්‍රයුක්තපරාමෘෂ්ට ද වන්නාහ, පරාමර්ශවිප්‍රයුක්තපරාමෘෂ්ටහ යි ද පරාමර්ශවිප්‍රයුක්තඅපරාමෘෂ්ටහ යි ද නො කියයුතු වන්නාහු යි.

305. සත්‍යයෝ දෙදෙනෙක් සාලම්බනයෝ ය. නිරොධසත්‍යය අනාලම්බන ය. දුඃඛසත්‍යය සාලම්බන ද වන්නේ ය, අනාලම්බන ද වන්නේ යි.

සත්‍යයෝ තිදෙනෙක් චිත්තයෝ නො වෙති. දුඃඛසත්‍යය චිත්ත ද වන්නේ ය, නො ද චිත්ත ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් චෛතසිකයෝ ය. නිරොධසත්‍යය අචෛතසික ය. දුඃඛ සත්‍යය චෛතසික ද වන්නේ ය, අචෛතසික ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් චිත්තසම්ප්‍රයුක්තයෝ ය. නිරොධසත්‍යය චිත්තවිප්‍රයුක්ත ය. දුඃඛසත්‍යය චිත්තසම්ප්‍රයුක්ත ද වන්නේ ය, චිත්තවිප්‍රයුක්ත ද වන්නේ ය, චිත්තය හා සම්ප්‍රයුක්ත යි ද චිත්තය හා විප්‍රයුක්ත යි ද නො කියයුතු ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් චිත්තසංසෘෂ්ටයෝ ය. නිරොධසත්‍යය චිත්තවිසංසෘෂ්ට ය. දුඃඛසත්‍යය චිත්තසංසෘෂ්ට ද වන්නේ ය, චිත්තවිසංසෘෂ්ට ද වන්නේ ය, චිත්තය හා සංසෘෂ්ට යි ද චිත්තය හා විසංසෘෂ්ට යි ද නො කියයුතු වන්නේ යි.

ද්වෙ සච්චා චිත්තසමුට්ඨානා. නිරොධසච්චං නො චිත්තසමුට්ඨානං. දුක්ඛසච්චං සියා චිත්තසමුට්ඨානං, සියා නො චිත්තසමුට්ඨානං.

ද්වෙ සච්චා චිත්තසහභුනො. නිරොධසච්චං නො චිත්තසහභූ. දුක්ඛසච්චං සියා චිත්තසහභූ, සියා නො චිත්තසහභූ.

ද්වෙ සච්චා චිත්තානුපරිවත්තිනො, නිරොධසච්චං නො චිත්තානුපරිවත්ති. දුක්ඛසච්චං සියා චිත්තානුපරිවත්ති, සියා නො චිත්තානුපරිවත්ති.

ද්වෙ සච්චා චිත්තසංසට්ඨසමුට්ඨානා. නිරොධසච්චං නො චිත්තසංසට්ඨසමුට්ඨානං. දුක්ඛසච්චං සියා චිත්තසංසට්ඨසමුට්ඨානං, සියා නො චිත්තසංසට්ඨසමුට්ඨානං

ද්වෙ සච්චා චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො. නිරොධසච්චං නො චිත්තසංසට්ඨසමුට්ඨානසහභූ. දුක්ඛසච්චං සියා චිත්තසංසට්ඨසමුට්ඨාන සහභූ, සියා නො චිත්තසංසට්ඨසමුට්ඨානසහභූ.

ද්වෙ සච්චා චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො. නිරොධසච්චං නො චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්ති. දුක්ඛසච්චං සියා චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්ති, සියා නො චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්ති.

තීණි සච්චානි බාහිරා. දුක්ඛසච්චං සියා අජ්ඣත්තිකං, සියා බාහිරං.

තීණි සච්චානි නො උපාදා. දුක්ඛසච්චං සියා උපාදා, සියා නො උපාදා.

තීණි සච්චානි අනුපාදින්නා. දුක්ඛසච්චං සියා උපාදින්නං, සියා අනුපාදින්නං.

306. සමුදයසච්චං උපාදානං. ද්වෙ සච්චා නො උපාදානං. දුක්ඛසච්චං සියා උපාදානං, සියා නො උපාදානං.

ද්වෙ සච්චා උපාදානියා. ද්වෙ සච්චා අනුපාදානියා.

ද්වෙ සච්චා උපාදානවිප්පයුත්තා. ද්වෙ සච්චා සියා උපාදානසම්පයුත්තා, සියා උපාදානවිප්පයුත්තා.

සමුදයසච්චං උපාදානං චෙව උපාදානියඤ්ච. ද්වෙ සච්චා න වත්තබ්බා උපාදානා චෙව උපාදානියාතිපි, උපාදානියා චෙව නො ච උපාදානාති'පි. දුක්ඛසච්චං සියා උපාදානං චෙව උපාදානියඤ්ච, සියා උපාදානියං චෙව නො ච උපාදානං.

සමුදයසච්චං සියා උපාදානං චෙව උපාදානසම්පයුත්තඤ්ච, සියා න වත්තබ්බං උපාදානං චෙව උපාදානසම්පයුත්තන්ති'පි, උපාදානසම්පයුත්තඤ්ච නො ච උපාදානන්තිපි. ද්වෙ සච්චා න වත්තබ්බා උපාදානා චෙව උපාදානසම්පයුත්තාතිපි උපාදානසම්පයුත්තා චෙව නො ච උපාදානාතිපි. දුක්ඛසච්චං සියා උපාදානං චෙව උපාදානසම්පයුත්තං ච, සියා උපාදානසම්පයුත්තං චෙව නො ච උපාදානං, සියා න වත්තබ්බං උපාදානං චෙව උපාදානසම්පයුත්තන්තිපි, උපාදානසම්පයුත්තං චෙව නො ච උපාදානන්තිපි.

ද්වෙ සච්චා උපාදානවිප්පයුත්තඅනුපාදානියා, ද්වෙ සච්චා සියා උපාදානවිප්පයුත්තඋපාදානියා, සියා න වත්තබ්බා උපාදානවිප්පයුත්තඋපාදානියාතිපි, උපාදානවිප්පයුත්තඅනුපාදානියාතිපි.

සත්‍යයෝ දෙදෙනෙක් චිත්තසමුත්ථානයෝ ය. නිරොධසත්‍යය චිත්තසමුත්ථාන නො වෙයි. දුඃඛසත්‍යය චිත්තසමුත්ථාන ද වන්නේ ය. චිත්තසමුත්ථාන නො ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් චිත්තසහභූ වන්නාහ. නිරොධසත්‍යය චිත්තසහභූ නො වෙයි. දුඃඛසත්‍යය චිත්තසහභූ ද වන්නේ ය. චිත්ත සහභූ නො ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් චිත්තානුපරිවර්තීහ. නිරොධසත්‍යය චිත්තානුපරිවර්තී නො වෙයි. දුඃඛසත්‍යය චිත්තානුපරිවර්තී ද වන්නේ ය. චිත්තානුපරිවර්තී නො ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් චිත්තසංසෘෂ්ටසමුත්ථානයෝ ය. නිරොධසත්‍යය චිත්ත සංසෘෂ්ටසමුත්ථාන නො වෙයි. දුඃඛසත්‍යය චිත්තසංසෘෂ්ටසමුත්ථාන ද වන්නේ ය, චිත්තසංසෘෂ්ටසමුත්ථාන නො ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූහ. නිරොධසත්‍යය චිත්ත සංසෘෂ්ටසමුත්ථානසහභූ නො වෙයි. දුඃඛසත්‍යය චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූ ද වන්නේ ය, චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූ නො ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්තීහ. නිරොධසත්‍යය චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්තී නො වෙයි. දුඃඛසත්‍යය චිත්තසංසෘෂ්ටසමුත්ථානානු පරිවර්තී ද වන්නේ ය, චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්තී නො ද වන්නේ යි.

සත්‍යයෝ තිදෙනෙක් බාහිරයෝ ය. දුඃඛසත්‍යය ආධ්‍යාත්මික ද වන්නේ ය, බාහිර ද වන්නේ යි.

සත්‍යයෝ තිදෙනෙක් උපාද නො වෙති. දුඃඛසත්‍යය උපාද ද වන්නේ ය, උපාද නො ද වන්නේ යි.

සත්‍යයෝ තිදෙනෙක් අනුපාදින්නයෝ ය. දුඃඛසත්‍යය උපාදින්න ද වන්නේ ය, අනුපාදින්න ද වන්නේ යි.

306. සමුදයසත්‍යය උපාදන වෙයි. සත්‍යයෝ දෙ දෙනෙක් උපාදනයෝ නො වෙති. දුඃඛසත්‍යය උපාදන ද වන්නේ ය, උපාදන නො ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් උපාදනිය වෙති. සත්‍යයෝ දෙදෙනෙක් අනුපාදනිය වෙත්.

සත්‍යයෝ දෙදෙනෙක් උපාදනවිප්‍රයුක්තයෝ ය. සත්‍යයෝ දෙදෙනෙක් උපාදන සම්ප්‍රයුක්ත ද වන්නාහ, උපාදනවිප්‍රයුක්ත ද වන්නාහු යි.

සමුදයසත්‍යය උපාදන ද වූයේ ම උපාදනිය ද වෙයි. සත්‍යයෝ දෙ දෙනෙක් උපාදන ද වූවාහු ම උපාදනිය වෙති ද උපාදනිය ද වූවාහු ම නො ද උපාදන වෙති ද නො කියයුත්තාහ. දුඃඛසත්‍යය උපාදන ද වූයේ ම උපාදනිය ද වන්නේ ය, උපාදනිය ද වූයේ ම නො ද උපාදන ද වන්නේ යි.

සමුදයසත්‍යය උපාදන ද වූයේ ම උපාදනසම්ප්‍රයුක්ත ද වන්නේ ය, උපාදන ද වූයේ ම උපාදනසම්ප්‍රයුක්ත යි ද උපාදනසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද උපාදන යි න නො කියයුතු වන්නේ ය. සත්‍යයෝ දෙ දෙනෙක් උපාදන ද වූවාහු ම උපාදනසම්ප්‍රයුක්තහ යි ද උපාදන සම්ප්‍රයුක්ත ද වූවාහු ම නො ද උපාදනහ යි ද නො කියයුත්තාහ. දුඃඛසත්‍යය උපාදන ද වූයේ ම උපාදනසම්ප්‍රයුක්ත ද වන්නේ ය, උපාදනසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද උපාදන ද වන්නේ ය. උපාදන ද වූයේ ම උපාදනසම්ප්‍රයුක්ත යි ද උපාදනසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද උපාදන යි ද නො කියයුතු වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් උපාදනවිප්‍රයුක්තඅනුපාදනිය වෙති. සත්‍යයෝ දෙදෙනෙක් උපාදනවිප්‍රයුක්තඋපාදනිය ද වන්නාහ, උපාදනවිප්‍රයුක්තඋපාදනිය යි ද උපාදනවිප්‍රයුක්ත අනුපාදනිය යි ද නො කියයුතු වන්නාහු යි.

307. සමුදයසච්චං කිලෙසො. ද්වෙ සච්චා නො කිලෙසා. දුක්ඛසච්චං සියා කිලෙසො, සියා නො කිලෙසො.

ද්වෙ සච්චා සංකිලෙසිකා. ද්වෙ සච්චා අසංකිලෙසිකා.

සමුදයසච්චං සංකිලිට්ඨං. ද්වෙ සච්චා අසංකිලිට්ඨා. දුක්ඛසච්චං සියා සංකිලිට්ඨං, සියා අසංකිලිට්ඨං.

සමුදයසච්චං කිලෙසසම්පයුත්තං. ද්වෙ සච්චා කිලෙසවිප්පයුත්තා. දුක්ඛසච්චං සියා කිලෙසසම්පයුත්තං, සියා කිලෙසවිප්පයුත්තං.

සමුදයසච්චං කිලෙසො චෙව සංකිලෙසිකඤ්ච. ද්වෙ සච්චා න වත්තබ්බා කිලෙසා චෙව සංකිලෙසිකාතිපි සංකිලෙසිකා චෙව නො ච කිලෙසාතිපි. දුක්ඛසච්චං සියා කිලෙසො චෙව සංකිලෙසිකඤ්ච, සියා සංකිලෙසිකං චෙව නො ච කිලෙසො.

සමුදයසච්චං කිලෙසො චෙව සංකිලිට්ඨං ච. ද්වෙ සච්චා න වත්තබ්බා කිලෙසා චෙව සංකිලිට්ඨාතිපි සංකිලිට්ඨාචෙව නො ච කිලෙසාතිපි. දුක්ඛසච්චං සියා කිලෙසො චෙව සංකිලිට්ඨඤ්ච, සියා සංකිලිට්ඨඤ්චෙව නො ච කිලෙසො, සියා න වත්තබ්බං කිලෙසො චෙව සංකිලිට්ඨන්තිපි සංකිලිට්ඨං චෙව නො ච කිලෙසොතිපි.

සමුදයසච්චං කිලෙසො චෙව කිලෙසසම්පයුත්තඤ්ච. ද්වෙ සච්චා න වත්තබ්බා කිලෙසා චෙව කිලෙසසම්පයුත්තාතිපි කිලෙසසම්පයුත්තා චෙව නො ච කිලෙසාතිපි. දුක්ඛසච්චං සියා කිලෙසො චෙව කිලෙසසම්පයුත්තං ච, සියා කිලෙසසම්පයුත්තංචෙව නො ච කිලෙසො, සියා න වත්තබ්බං කිලෙසො චෙව කිලෙසසම්පයුත්තන්තිපි කිලෙසසම්පයුත්තං චෙව නො ච කිලෙසොති'පි.

ද්වෙ සච්චා කිලෙසවිප්පයුත්තඅසංකිලෙසිකා. සමුදයසච්චං න වත්තබ්බං කිලෙසවිප්පයුත්තසංකිලෙසිකන්ති'පි කිලෙසවිප්පයුත්තඅසංකිලෙසිකන්ති'පි. දුක්ඛසච්චං සියා කිලෙසවිප්පයුත්තසංකිලෙසිකං, සියා න වත්තබ්බං කිලෙසවිප්පයුත්තසංකිලෙසිකන්තිපි කිලෙසවිප්පයුත්තඅසංකිලෙසිකන්තිපි.

308. ද්වෙ සච්චා න දස්සනෙන පහාතබ්බා. ද්වෙ සච්චා සියා දස්සනෙන පහාතබ්බා, සියා න දස්සනෙන පහාතබ්බා.

ද්වෙ සච්චා න භාවනාය පහාතබ්බා. ද්වෙ සච්චා සියා භාවනාය පහාතබ්බා, සියා න භාවනාය පහාතබ්බා.

ද්වෙ සච්චා න දස්සනෙන පහාතබ්බහෙතුකා. ද්වෙ සච්චා සියා දස්සනෙන පහාතබ්බහෙතුකා, සියා න දස්සනෙන පහාතබ්බහෙතුකා.

ද්වෙ සච්චා න භාවනාය පහාතබ්බහෙතුකා. ද්වෙ සච්චා සියා භාවනාය පහාතබ්බහෙතුකා, සියා න භාවනාය පහාතබ්බහෙතුකා.

සමුදයසච්චං සවිතක්කං. නිරොධසච්චං අවිතක්කං. ද්වෙ සච්චා සියා සවිතක්කා, සියා අවිතක්කා.

307. සමුදයසත්‍යය ක්ලෙශයෙකි. සත්‍යයෝ දෙදෙනෙක් ක්ලෙශයෝ නො වෙති. දුඃඛසත්‍යය ක්ලෙශයෙක් ද වන්නේ ය, ක්ලෙශයෙක් නො ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් සාංක්ලෙශිකයෝ ය. සත්‍යයෝ දෙදෙනෙක් අසාංක්ලෙශිකයෝ යි.

සමුදයසත්‍යය සංක්ලිෂ්ට ය. සත්‍යයෝ දෙ දෙනෙක් අසංක්ලිෂ්ටයෝ ය, දුඃඛසත්‍යය සංක්ලිෂ්ට ද වන්නේ ය, අසංක්ලිෂ්ට ද වන්නේ යි.

සමුදයසත්‍යය ක්ලෙශසම්ප්‍රයුක්ත ය. සත්‍යයෝ දෙ දෙනෙක් ක්ලෙශවිප්‍රයුක්තයෝ ය. දුඃඛසත්‍යය ක්ලෙශසම්ප්‍රයුක්ත ද වන්නේ ය. ක්ලෙශවිප්‍රයුක්ත ද වන්නේ යි.

සමුදසත්‍යය ක්ලෙශයෙක් ද වූයේ ම සාංක්ලෙශික ද වෙයි. සත්‍යයෝ දෙදෙනෙක් ක්ලෙශ ද වූවාහු ම සාංක්ලෙශිකහ යි ද සාංක්ලෙශික ද වූවාහු ම නො ද කෙලෙශහ යි ද නො කියයුත්තාහ. දුඃඛසත්‍යය ක්ලෙශයෙක් ද වූයේ ම සාංක්ලෙශික ද වන්නේ ය. සාංක්ලෙශික ද වූයේ ම නො ද ක්ලෙශයෙක් ද වන්නේ යි.

සමුදයසත්‍යය ක්ලෙශයෙක් ද වූයේ ම සංක්ලිෂ්ට ද වෙයි. සත්‍යයෝ දෙදෙනෙක් ක්ලෙශ ද වූවාහු ම සංක්ලිෂ්ටහ යි ද සංක්ලිෂ්ට ද වූවාහු ම නො ද ක්ලෙශහ යි ද නො කියයුත්තාහ. දුඃඛසත්‍යය ක්ලෙශයෙක් ද වූයේ ම සංක්ලිෂ්ට ද වන්නේ ය, සංක්ලිෂ්ට ද වූයේ ම නො ද ක්ලෙශයෙක් ද වන්නේ ය, ක්ලෙශයෙක් ද වූයේ ම සංක්ලිෂ්ට යි ද සංක්ලිෂ්ට ද වූයේ ම නො ද ක්ලෙශයෙකැ යි ද නො කියයුතු වන්නේ යි.

සමුදසත්‍යය ක්ලෙශයෙක් ද වූයේ ම ක්ලෙශසම්ප්‍රයුක්ත ද වෙයි. සත්‍යයෝ දෙදෙනෙක් ක්ලෙශ ද වූවාහු ම ක්ලෙශසම්ප්‍රයුක්තහ යි ද ක්ලෙශසම්ප්‍රයුක්ත ද වූවාහු ම නො ද ක්ලෙශහ යි ද නො කියයුත්තාහ. දුඃඛසත්‍යය ක්ලෙශයෙක් ද වූයේ ම ක්ලෙශසම්ප්‍රයුක්ත ද වන්නේ ය, ක්ලෙශසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද ක්ලෙශයෙක් ද වන්නේ ය, ක්ලෙශයෙක් ද වූයේ ම ක්ලෙශසම්ප්‍රයුක්ත යි ද ක්ලෙශසම්ප්‍රයුක්ත ද වූයේ ම නො ද ක්ලෙශයෙකැ යි ද නො කියයුතු වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් ක්ලෙශවිප්‍රයුක්තඅසාංක්ලෙශිකයෝ ය. සමුදයසත්‍යය ක්ලෙශවිප්‍රයුක්තසාංක්ලෙශිකයෙකැ යි ද ක්ලෙශවිප්‍රයුක්තඅසාංක්ලෙශිකයෙකැ යි ද නො කියයුත්තේ ය. දුඃඛසත්‍යය ක්ලෙශවිප්‍රයුක්තසාංක්ලෙශික ද වන්නේ ය, ක්ලෙශවිප්‍රයුක්තසාංක්ලෙශික යි ද ක්ලෙශවිප්‍රයුක්තඅසාංක්ලෙශික යි ද නො කියයුතු වන්නේ යි.

308. සත්‍යයෝ දෙදෙනෙක් දර්ශනයෙන් ප්‍රහාතව්‍යයෝ නො වෙති. සත්‍යයෝ දෙ දෙනෙක් දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ද වන්නාහ, දර්ශනයෙන් ප්‍රහාතව්‍ය නො ද වන්නාහු යි.

සත්‍යයෝ දෙදෙනෙක් භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ නො වෙති. සත්‍යයෝ දෙ දෙනෙක් භාවනායෙන් ප්‍රහාතව්‍ය ද වන්නාහ, භාවනායෙන් ප්‍රහාතව්‍ය නො ද වන්නාහු යි.

සත්‍යයෝ දෙදෙනෙක් දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතුක නො වෙති. සත්‍යයෝ දෙදෙනෙක් දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතුක ද වන්නාහ, දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතුක නො ද වන්නාහු යි.

සත්‍යයෝ දෙදෙනෙක් භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතුක නො වෙති. සත්‍යයෝ දෙදෙනෙක් භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතුක ද වන්නාහ, භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතුක නො ද වන්නාහු යි.

සමුදයසත්‍යය සවිතර්ක ය. නිරොධසත්‍යය අවිතර්ක ය. සත්‍යයෝ දෙදෙනෙක් සවිතර්ක ද වන්නාහ, අවිතර්ක ද වන්නාහු යි.

සමුදය සච්චං සවිචාරං. නිරොධසච්චං අවිචාරං. ද්වෙ සච්චා සියා සවිචාරා, සියා අවිචාරා.

නිරොධසච්චං අප්පීතිකං. තීණි සච්චානි සියා සප්පීතිකා, සියා අප්පීතිකා.

නිරොධසච්චං න පීතිසහගතං. තීණි සච්චානි සියා පීතිසහගතා, සියා න පීතිසහගතා.

නිරොධසච්චං න සුඛසහගතං. තීණි සච්චානි සියා සුඛසහගතා, සියා න සුඛසහගතා.

නිරොධසච්චං න උපෙක්ඛාසහගතං. තීණි සච්චානි සියා උපෙක්ඛාසහගතා, සියා න උපෙක්ඛාසහගතා.

සමුදයසච්චං කාමාවචරං. ද්වෙ සච්චා න කාමාවචරා. දුක්ඛසච්චං සියා කාමාවචරං, සියා න කාමාවචරං.

තීණි සච්චානි න රූපාවචරා. දුක්ඛසච්චං සියා රූපාවචරං, සියා න රූපාවචරං.

තීණි සච්චානි න අරූපාවචරා. දුක්ඛසච්චං සියා අරූපාවචරං, සියා න අරූපාවචරං.

ද්වෙ සච්චා පරියාපන්නා ද්වෙ සච්චා අපරියාපන්නා.

මග්ගසච්චං නිය්‍යානිකං. තීණි සච්චානි අනිය්‍යානිකා.

මග්ගසච්චං නියතං. නිරොධසච්චං අනියතං. ද්වෙ සච්චා සියා නියතා, සියා අනියතා.

ද්වෙ සච්චා සඋත්තරා. ද්වෙ සච්චා අනුත්තරා.

සමුදයසච්චං සරණං. ද්වෙ සච්චා අරණා. දුක්ඛසච්චං සියා සරණං සියා අරණන්ති.

පඤ්හාපුච්ඡකං.

සච්චවිභඞ්ගො නිට්ඨිතො.

සමුදයසත්‍යය සවිචාර ය. නිරොධසත්‍යය අවිචාර ය. සත්‍යයෝ දෙ දෙනෙක් සවිචාර ද වන්නාහ, අවිචාර ද වන්නාහු යි.

නිරොධසත්‍යය අප්‍රීතික ය. සත්‍යයෝ තිදෙනෙක් සප්‍රීතික ද වන්නාහ, අප්‍රීතික ද වන්නාහු යි.

නිරොධසත්‍යය ප්‍රීතිසහගත නො වෙයි. සත්‍යයෝ තිදෙනෙක් ප්‍රීතිසහගත ද වන්නාහ, ප්‍රීතිසහගත නො ද වන්නාහු යි.

නිරොධසත්‍යය සුඛසහගත නො වෙයි. සත්‍යයෝ තිදෙනෙක් සුඛසහගත ද වන්නාහ, සුඛසහගත නො ද වන්නාහු යි.

නිරොධසත්‍යය උපෙක්ෂාසහගත නො වෙයි. සත්‍යයෝ තිදෙනෙක් උපෙක්ෂාසහගත ද වන්නාහ, උපෙක්ෂාසහගත නො ද වන්නාහු යි.

සමුදයසත්‍යය කාමාවචර ය. සත්‍යයෝ දෙ දෙනෙක් කාමාවචර නො වෙති. දුඃඛසත්‍යය කාමාවචර ද වන්නේ ය, කාමාවචර නො ද වන්නේ යි.

සත්‍යයෝ තිදෙනෙක් රූපාවචර නො වෙති. දුඃඛසත්‍යය රූපාවචර ද වන්නේ ය, රූපාවචර නො ද වන්නේ යි.

සත්‍යයෝ තිදෙනෙක් අරූපාවචර නො වෙති. දුඃඛසත්‍යය අරූපාවචර ද වන්නේ ය, අරූපාවචර නො ද වන්නේ යි.

සත්‍යයෝ දෙදෙනෙක් පර්‍යාපන්නයෝ ය. සත්‍යයෝ දෙදෙනෙක් අපර්‍යාපන්නයෝ යි.

මාර්ගසත්‍යය නෛර්‍යාණික ය. සත්‍යයෝ තිදෙනෙක් අනෛර්‍යාණිකයෝ යි.

මාර්ගසත්‍යය නියත ය. නිරොධසත්‍යය අනියත ය. සත්‍යයෝ දෙදෙනෙක් නියත ද වන්නාහ, අනියත ද වන්නාහු යි.

සත්‍යයෝ දෙ දෙනෙක් සඋත්තරයෝ ය. සත්‍යයෝ දෙ දෙනෙක් අනුත්තරයෝ යි.

සමුදයසත්‍යය සරණ ය. සත්‍යයෝ දෙ දෙනෙක් අරණයෝ ය. දුඃඛසත්‍යය සරණ ද වන්නේ ය. අරණ ද වන්නේ ය යි.

පඤ්හපුච්ඡක යි.

සත්‍යවිභඞ්ග නිමි.

5. ඉන්ද්‍රිය විභඞ්ගො

309. බාවීසතින්ද්‍රියානි, චක්ඛුන්ද්‍රියං: සොතින්ද්‍රියං, ඝානින්ද්‍රියං, ජිව්හින්ද්‍රියං, කායින්ද්‍රියං, මනින්ද්‍රියං, ජීවිතින්ද්‍රියං, ඉත්ථින්ද්‍රියං, පුරිසින්ද්‍රියං, සුඛින්ද්‍රියං, දුක්ඛින්ද්‍රියං, සොමනස්සින්ද්‍රියං, දොමනස්සින්ද්‍රියං, උපෙක්ඛින්ද්‍රියං, සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං, අනඤ්ඤා-තඤ්ඤස්සාමීතින්ද්‍රියං, අඤ්ඤින්ද්‍රියං, අඤ්ඤාතාවින්ද්‍රියං.

310. තත්‍ථ කතමං චක්ඛුන්ද්‍රියං : යං චක්ඛු චතුන්නං මහාභූතානං උපාදාය පසාදො -පෙ- සුඤ්ඤො ගාමොපෙසො. ඉදං වුච්චති චක්ඛුන්ද්‍රියං.

311-314. තත්‍ථ කතමං සොතින්ද්‍රියං -පෙ- ඝානින්ද්‍රියං -පෙ- ජිව්හින්ද්‍රියං -පෙ- කායින්ද්‍රියං: යො කායො චතුන්නං මහාභූතානං උපාදාය පසාදො -පෙ- සුඤ්ඤො ගාමො පෙසො. ඉදං වුච්චති කායින්ද්‍රියං.

315. තත්‍ථ කතමං මනින්ද්‍රියං : එකවිධෙන මනින්ද්‍රියං : ඵස්සසම්ප-යුත්තං.

දුවිධෙන මනින්ද්‍රියං : අත්‍ථි සහෙතුකං, අත්‍ථි අහෙතුකං.

තිවිධෙන මනින්ද්‍රියං : අත්‍ථි කුසලං, අත්‍ථි අකුසලං, අත්‍ථි අව්‍යාකතං.

චතුබ්බිධෙන මනින්ද්‍රියං : අත්‍ථි කාමාවචරං, අත්‍ථි රූපාවචරං, අත්‍ථි අරූපාවචරං, අත්‍ථි අපරියාපන්නං.

පඤ්චවිධෙන මනින්ද්‍රියං : අත්‍ථි සුඛින්ද්‍රියසම්පයුත්තං අත්‍ථි දුක්ඛින්ද්‍රිය-සම්පයුත්තං, අත්‍ථි සොමනස්සින්ද්‍රියසම්පයුත්තං, අත්‍ථි දොමනස්සින්ද්‍රිය-සම්පයුත්තං, අත්‍ථි උපෙක්ඛින්ද්‍රියසම්පයුත්තං.

ඡබ්බිධෙන මනින්ද්‍රියං : චක්ඛුවිඤ්ඤාණං, සොතවිඤ්ඤාණං, ඝාන-විඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, කායවිඤ්ඤාණං, මනොවිඤ්ඤාණං. එවං ඡබ්බිධෙන මනින්ද්‍රියං.

සත්තවිධෙන මනින්ද්‍රියං: චක්ඛුවිඤ්ඤාණං -පෙ- කායවිඤ්ඤාණං, මනොධාතු, මනොවිඤ්ඤාණධාතු. එවං සත්තවිධෙන මනින්ද්‍රියං.

අට්ඨවිධෙන මනින්ද්‍රියං: චක්ඛුවිඤ්ඤාණං -පෙ- කායවිඤ්ඤාණං අත්‍ථි සුඛසහගතං, අත්‍ථි දුක්ඛසහගතං, මනොධාතු මනොවිඤ්ඤාණධාතු. එවං අට්ඨවිධෙන මනින්ද්‍රියං.

නවවිධෙන මනින්ද්‍රියං: චක්ඛුවිඤ්ඤාණං -පෙ- කායවිඤ්ඤාණං, මනොධාතු, මනොවිඤ්ඤාණධාතු අත්‍ථි කුසලා, අත්‍ථි අකුසලා, අත්‍ථි අව්‍යාකතා. එවං නවවිධෙන මනින්ද්‍රියං.

දසවිධෙන මනින්ද්‍රියං: චක්ඛුවිඤ්ඤාණං -පෙ- කායවිඤ්ඤාණං අත්‍ථි සුඛසහගතං, අත්‍ථි දුක්ඛසහගතං, මනොධාතු, මනොවිඤ්ඤාණධාතු අත්‍ථි කුසලා, අත්‍ථි අකුසලා, අත්‍ථි අව්‍යාකතා. එවං දසවිධෙන මනින්ද්‍රියං. [යථා විඤ්ඤාණක්ඛන්‍ධෙ තථා විත්‍ථාරෙ] -පෙ- එවං බහුවිධෙන මනින්ද්‍රියං. ඉදං වුච්චති මනින්ද්‍රියං.

5. ඉන්ද්‍රියවිභඞ්ගය

309. ඉන්ද්‍රියයෝ දෙවිසි දෙනෙකි : චක්ඛුන්ද්‍රිය ය, සොතින්ද්‍රිය ය, ඝානින්ද්‍රිය ය, ජිව්හින්ද්‍රිය ය, කායින්ද්‍රිය ය, මනින්ද්‍රිය ය, ජීවිතින්ද්‍රිය ය, ඉත්ථින්ද්‍රිය ය, පුරිසින්ද්‍රිය ය, සුඛින්ද්‍රිය ය, දුක්ඛින්ද්‍රිය ය, සොමනස්සින්ද්‍රිය ය, දෙමනස්සින්ද්‍රිය ය, උපෙක්ඛින්ද්‍රිය ය, සද්ධින්ද්‍රිය ය, විරියින්ද්‍රිය ය, සතින්ද්‍රිය ය, සමාධින්ද්‍රිය ය, පඤ්ඤින්ද්‍රිය ය, අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රිය ය, අඤ්ඤින්ද්‍රිය ය, අඤ්ඤතාවින්ද්‍රිය යි.

310. එහි චක්ඛුන්ද්‍රිය කවරෙ යත් : යම් ඇසෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වේ ද . . . තෙල ' ශූන්‍යග්‍රාම ' නමුදු වේ. මේ චක්ඛුන්ද්‍රිය යි කියනු ලැබේ.

311–314. එහි සොතින්ද්‍රිය කවරෙ යත් : . . . ඝානින්ද්‍රිය . . . ජිව්හින්ද්‍රිය . . . කායින්ද්‍රිය කවරෙ යත් : යම් කයෙක් සතර මහාභූතයන් නිසා උපන් ප්‍රසාදය වේ ද . . . තෙල ශූන්‍යග්‍රාම නමුදු වේ. මේ කායින්ද්‍රිය යි කියනු ලැබේ.

315. එහි මනින්ද්‍රිය කවරෙ යත් : එක් ප්‍රකාරයෙකින් මනින්ද්‍රිය වෙයි. ස්පර්ශය හා සම්ප්‍රයුක්ත වූයේ යි.

ද්විප්‍රකාරයෙකින් මනින්ද්‍රිය වෙයි : සහෙතුකයෙක් ඇත, අහෙතුකයෙක් ඇති.

ත්‍රිප්‍රකාරයෙකින් මනින්ද්‍රිය වෙයි : කුශල වූයෙක් ඇත, අකුශල වූයෙක් ඇත, අව්‍යාකෘත වූයෙක් ඇති.

චතුස්ප්‍රකාරයෙකින් මනින්ද්‍රිය වෙයි : කාමාවචර වූයෙක් ඇත, රූපාවචර වූයෙක් ඇත, අරූපාවචර වූයෙක් ඇත, අපර්‍යාපන්න වූයෙක් ඇති.

පඤ්චප්‍රකාරයෙකින් මනින්ද්‍රිය වෙයි : සුඛින්ද්‍රිය හා සම්ප්‍රයුක්ත වූයෙක් ඇත, දුක්ඛින්ද්‍රිය හා සම්ප්‍රයුක්ත වූයෙක් ඇත, සොමනස්සින්ද්‍රිය හා සම්ප්‍රයුක්ත වූයෙක් ඇත, දෙමනස්සින්ද්‍රිය හා සම්ප්‍රයුක්ත වූයෙක් ඇත, උපෙක්ෂෙන්ද්‍රිය හා සම්ප්‍රයුක්ත වූයෙක් ඇති.

ෂට් ප්‍රකාරයෙකින් මනින්ද්‍රිය වෙයි : චක්ෂුර්විඥාන ය, ශ්‍රොත්‍රවිඥාන ය, ජිහ්වාවිඥාන ය, කායවිඥාන ය, මනොවිඥාන යි. මෙසේ ෂට් ප්‍රකාරයෙන් මනින්ද්‍රිය වේ.

සප්තප්‍රකාරයෙකින් මනින්ද්‍රිය වෙයි : චක්ෂුර්විඥාන ය . . . කායවිඥාන ය මනොධාතු ය මනොවිඥානධාතු යි. මෙසේ සප්තප්‍රකාරයෙන් මනින්ද්‍රිය වේ.

අෂ්ටප්‍රකාරයෙකින් මනින්ද්‍රිය වෙයි : චක්ෂුර්විඥාන ය. . . කායවිඥානය සුඛසහගත වූයෙක් ඇත, දුඃඛසහගත වූයෙක් ඇත, මනොධාතු ය, මනොවිඥානධාතු යි. මෙසේ අෂ්ටප්‍රකාරයෙන් මනින්ද්‍රිය වේ.

නවප්‍රකාරයෙකින් මනින්ද්‍රිය වෙයි : චක්ෂුර්විඥාන ය . . . කායවිඥාන ය, මනොධාතු ය, මනොවිඥානධාතුව කුශල වූයෙක් ඇත, අකුශල වූයෙක් ඇත, අව්‍යාකෘත වූයෙක් ඇති. මෙසේ නවප්‍රකාරයෙන් මනින්ද්‍රිය වේ.

දශප්‍රකාරයෙකින් මනින්ද්‍රිය වෙයි : චක්ෂුර්විඥාන ය . . . කායවිඥානය සුඛසහගත වූයෙක් ඇත, දුඃඛසහගත වූයෙක් ඇත, මනොධාතු ය, මනොවිඥානධාතුව කුශල වූයෙක් ඇත, අකුශල වූයෙක් ඇත, අව්‍යාකෘත වූයෙක් ඇති. මෙසේ දශප්‍රකාරයෙන් මනින්ද්‍රිය වේ. (විස්තරය විඥානස්කන්ධය මෙනි) . . . මෙසේ බහුප්‍රකාරයෙන් මනින්ද්‍රිය වේ. මේ මනින්ද්‍රිය යි කියනු ලැබේ.

316. තත්ථ කතමං ජීවිතින්ද්‍රියං: ජීවිතින්ද්‍රියං දුවිධෙන: අත්ථි රූපජීවිතින්ද්‍රියං, අත්ථි අරූපජීවිතින්ද්‍රියං.

තත්ථ කතමං රූපජීවිතින්ද්‍රියං: යො තෙසං රූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං, ඉදං වුච්චති රූපජීවිතින්ද්‍රියං.

තත්ථ කතමං අරූපජීවිතින්ද්‍රියං: යො තෙසං අරූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං, ඉදං වුච්චති අරූපජීවිතින්ද්‍රියං. ඉදං වුච්චති ජීවිතින්ද්‍රියං.

317. තත්ථ කතමං ඉත්ථින්ද්‍රියං: යං ඉත්ථියා ඉත්ථිලිඞ්ගං ඉත්ථිනිමිත්තං ඉත්ථිකුත්තං ඉත්ථාකප්පො ඉත්ථත්තං ඉත්ථිභාවො, ඉදං වුච්චති ඉත්ථින්ද්‍රියං.

318. තත්ථ කතමං පුරිසින්ද්‍රියං: යං පුරිසස්ස පුරිසලිඞ්ගං පුරිසනිමිත්තං පුරිසකුත්තං පුරිසාකප්පො පුරිසත්තං පුරිසභාවො, ඉදං වුච්චති පුරිසින්ද්‍රියං.

319. තත්ථ කතමං සුඛින්ද්‍රියං: යං කායිකං සාතං කායිකං සුඛං කායසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං කායසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං වුච්චති සුඛින්ද්‍රියං.

320. තත්ථ කතමං දුක්ඛින්ද්‍රියං: යං කායිකං අසාතං කායිකං දුක්ඛං කායසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං කායසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, ඉදං වුච්චති දුක්ඛින්ද්‍රියං.

321. තත්ථ කතමං සොමනස්සින්ද්‍රියං: යං චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං වුච්චති සොමනස්සින්ද්‍රියං.

322. තත්ථ කතමං දොමනස්සින්ද්‍රියං: යං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං චෙතො සම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං චෙතො සම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, ඉදං වුච්චති දොමනස්සින්ද්‍රියං.

323 තත්ථ කතමං උපෙක්ඛින්ද්‍රියං: යං චෙතසිකං නෙවසාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා, ඉදං වුච්චති උපෙක්ඛින්ද්‍රියං.

324. තත්ථ කතමං සද්ධින්ද්‍රියං: යා සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො සද්ධා සද්ධින්ද්‍රියං සද්ධාබලං, ඉදං වුච්චති සද්ධින්ද්‍රියං.

325. තත්ථ කතමං විරියින්ද්‍රියං: යො චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ඨිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං, ඉදං වුච්චති විරියින්ද්‍රියං.

316. එහි ජීවිතින්ද්‍රිය කවරෙ යත් : ද්විප්‍රකාරයෙකින් ජීවිතින්ද්‍රිය වෙයි : රූප ජීවිතෙන්ද්‍රියයෙක් ඇත, අරූපජීවිතෙන්ද්‍රියයෙක් ඇත.

එහි රූපජීවිතෙන්ද්‍රිය කවරෙ යත් : ඒ රූපී ධර්මයන්ගේ යම් ආයුෂයෙක් සිටීමෙක් යැපීමෙක් යැපෙන අයුරෙක් ඉරියව් පැවැත්මෙක් වැටුමෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතෙන්ද්‍රියයෙක් වේ ද, මේ රූපජීවිතෙන්ද්‍රිය යි කියනු ලැබේ.

එහි අරූපජීවිතෙන්ද්‍රිය කවරෙ යත් : ඒ අරූපීධර්මයන්ගේ යම් ආයුෂයෙක් සිටීමෙක් යැපීමෙක් යැපෙන අයුරෙක් ඉරියව් පැවැත්මෙක් වර්තනයෙක් පාලනයෙක් ජීවිතයෙක් ජීවිතෙන්ද්‍රියයෙක් වේ ද, මේ අරූපජීවිතෙන්ද්‍රිය යි කියනු ලැබේ. මේ ජීවිතෙන්ද්‍රිය යි කියනු ලැබේ.

317. එහි ස්ත්‍රීන්ද්‍රිය කවරෙ යත් : ස්ත්‍රිය පිළිබඳ වූ යම් ස්ත්‍රීලිඞ්ගයෙක් ස්ත්‍රීනිමිත්ත යෙක් ස්ත්‍රීක්‍රියායෙක් ස්ත්‍රීආකල්පයෙක් ස්ත්‍රීත්වයෙක් ස්ත්‍රීභාවයෙක් වේ ද, මේ ස්ත්‍රීන්ද්‍රිය යි කියනු ලැබේ.

318. එහි පුරුෂෙන්ද්‍රිය කවරෙ යත් : පුරුෂයා පිළිබඳ යම් පුරුෂලිඞ්ගයෙක් පුරුෂ නිමිත්තයෙක් පුරුෂකෘත්‍යයෙක් පුරුෂාකල්පයෙක් පුරුෂත්වයෙක් පුරුෂභාවයෙක් වේ ද, මේ පුරුෂෙන්ද්‍රිය යි කියනු ලැබේ.

319. එහි සුඛින්ද්‍රිය කවරෙ යත් : යම් කායික වූ මිහිරෙක් කායිකසුඛයෙක් කාය සංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදයිතයෙක් කායසංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදනා වක් වේ ද, මේ සුඛින්ද්‍රිය යි කියනු ලැබේ.

320. එහි දුක්ඛින්ද්‍රිය කවරෙ යත් : යම් කායික වූ නො මිහිරෙක් කායික වූ දුඃඛයෙක් කායසංස්පර්ශයෙන් උපන් නො මිහිරි වූ දුක් වූ වෙදයිතයෙක් කායසංස්පර්ශයෙන් උපන් නො මිහිරි වූ දුක් වූ වෙදනාවක් වේ ද, මේ දුක්ඛින්ද්‍රිය යි කියනු ලැබේ.

321. එහි සොමනස්සින්ද්‍රිය කවරෙ යත්: යම් චෛතසික වූ සාතයෙක් චෛතසික වූ සුඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් සාතසුඛවෙදනාවක් වේ ද, මේ සොමනස්සින්ද්‍රිය යි කියනු ලැබේ.

322. එහි දෙමනස්සින්ද්‍රිය කවරෙ යත් : යම් චෛතසික වූ අසාතයෙක් චෛතසික වූ දුඃඛයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් අසාත වූ දුඃඛ වූ වෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් අසාත වූ දුඃඛ වූ වෙදනායෙක් වේ ද, මේ දෙමනස්සින්ද්‍රිය යි කියනු ලැබේ.

323. එහි උපෙක්ඛින්ද්‍රිය කවරෙ යත් : යම් චෛතසික වූ නො ම සාත වූ අසාත නො වූ වෙදනායෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් නො දුක් නො සුව වෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් නො දුක් නො සුව වෙදනායෙක් වේ ද, මේ උපෙක්ඛින්ද්‍රිය යි කියනු ලැබේ.

324. එහි සද්ධින්ද්‍රිය කවරෙ යත් : යම් හැදහීමෙක් හදහන අයුරෙක් (ගුණයෙහි) බැස ගැනීමෙක් අධිකප්‍රසාදයෙක් ශ්‍රද්ධාවක් ශ්‍රද්ධෙන්ද්‍රියයෙක් ශ්‍රද්ධාබලයෙක් වේ ද, මේ සද්ධින්ද්‍රිය යි කියනු ලැබේ.

325. එහි විරියින්ද්‍රිය කවරෙ යත් : යම් චෛතසික වූ වීර්‍ය්‍යාරම්භයෙක් (කුසීත බැවින් නික්මීමෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් අධිමාත්‍ර උත්සාහයෙක් ථාමයෙක් (කුශලසන්තානය) ධැරීමෙක් නො ලිහිල් පරාක්‍රම ඇති බවෙක් නො තැබූ (කුශල) ඡන්ද ඇති බවෙක් නො තැබූ (වීර්‍ය්‍ය) ධුර ඇති බවෙක් වීර්‍ය්‍ය දැඩි කොට ගැනීමෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් වේ ද, මේ වීර්‍ය්‍යින්ද්‍රිය යි කියනු ලැබේ.

326. තත්ථ කතමං සතින්ද්‍රියං: යා සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අසම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති, ඉදං වුච්චති සතින්ද්‍රියං.

327. තත්ථ කතමං සමාධින්ද්‍රියං: යා චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි, ඉදං වුච්චති සමාධින්ද්‍රියං.

328. තත්ථ කතමං පඤ්ඤින්ද්‍රියං: යා පඤ්ඤා පජානනා විචයො පවිචයො -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති පඤ්ඤින්ද්‍රියං.

329. තත්ථ කතමං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං: යා තෙසං ධම්මානං අනඤ්ඤාතානං අදිට්ඨානං අප්පත්තානං අවිදිතානං අසච්ඡිකතානං සච්ඡිකිරියාය පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, ඉදං වුච්චති අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං.

330. තත්ථ කතමං අඤ්ඤින්ද්‍රියං: යා තෙසං ධම්මානං ඤාතානං දිට්ඨානං පත්තානං විදිතානං සච්ඡිකතානං සච්ඡිකිරියාය පඤ්ඤා පජානනා —පෙ— අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචය-සම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, ඉදං වුච්චති අඤ්ඤින්ද්‍රියං.

331. තත්ථ කතමං අඤ්ඤාතාවින්ද්‍රියං: යා තෙසං ධම්මානං අඤ්ඤාතාවීනං දිට්ඨානං පත්තානං විදිතානං සච්ඡිකතානං සච්ඡිකිරියාය පඤ්ඤා පජානනා —පෙ— අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචය-සම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං, ඉදං වුච්චති අඤ්ඤාතාවින්ද්‍රියං.

අභිධම්මභාජනියං.

---

332. බාවීසතින්ද්‍රියානි, චක්ඛුන්ද්‍රියං: සොතින්ද්‍රියං, ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං, මනින්ද්‍රියං, ජීවිතින්ද්‍රියං, ඉත්ථින්ද්‍රියං, පුරිසින්ද්‍රියං, සුඛින්ද්‍රියං, දුක්ඛින්ද්‍රියං, සොමනස්සින්ද්‍රියං, දොමනස්සින්ද්‍රියං, උපෙක්ඛින්ද්‍රියං, සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං, අනඤ්ඤාතඤ්ඤස්සා-මීතින්ද්‍රියං, අඤ්ඤින්ද්‍රියං, අඤ්ඤාතාවින්ද්‍රියං.

333. බාවීසතීනං ඉන්ද්‍රියානං කති කුසලා, කති අකුසලා, කති අව්‍යාකතා, -පෙ- කති සරණා, කති අරණා:

දසින්ද්‍රියා අව්‍යාකතා. දොමනස්සින්ද්‍රියං අකුසලං. අනඤ්ඤාතඤ්ඤස්සා-මීතින්ද්‍රියං කුසලං. චත්තාරින්ද්‍රියා සියා කුසලා, සියා අව්‍යාකතා. ඡ ඉන්ද්‍රියා සියා කුසලා, සියා අකුසලා, සියා අව්‍යාකතා.

326. එහි සතින්ද්‍රිය කවරෙ යත් : යම් ස්මෘතියක් අනුස්මෘතියක් ප්‍රතිස්මෘතියක් ස්මෘති සංඛ්‍යාත සරණතායෙක් ධරන බවෙක් (අරමුණෙහි) බැසගැනීමෙක් නො මුළා වන බවෙක් ස්මෘතියක් ස්මෘතීන්ද්‍රියයෙක් ස්මෘතිබලයෙක් සම්‍යක්ස්මෘතියක් වේ ද, මේ සතින්ද්‍රිය යි කියනු ලැබේ.

327. එහි සමාධින්ද්‍රිය කවරෙ යත් : චිත්තයාගේ යම් සිටීමෙක් මොනොවට සිටීමෙක් බැසගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුළසිත ඇති බවෙක් ශමථයෙක් සමාධින්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක් සමාධියෙක් වේ ද, මේ සමාධින්ද්‍රිය යි කියනු ලැබේ.

328. එහි පඤ්ඤින්ද්‍රිය කවරෙ යත් : යම් ප්‍රඥවක් පජානනාකාරයෙක් විමසීමෙක් ප්‍රකර්ෂයෙන් විමසීමෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද, මේ පඤ්ඤින්ද්‍රිය යි කියනු ලැබේ.

329. එහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය කවරෙ යත් : නො දත් නො දුටු නො පැමිණි (නුවණින්) ප්‍රකට නො කළ ප්‍රත්‍යක්ෂ නො කළ ඒ ධර්මයන් සාක්ෂාත් කරනු පිණිස මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ යම් ප්‍රඥවක් පජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය යි කියනු ලැබේ.

330. එහි අඤ්ඤින්ද්‍රිය කවරෙ යත් : දන්නා ලද දක්නා ලද පැමිණි ප්‍රකට කළ ප්‍රත්‍යක්ෂ කළ ඒ ධර්මයන් සාක්ෂාත් කරනු පිණිස මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ යම් ප්‍රඥවක් පජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ අඤ්ඤින්ද්‍රිය යි කියනු ලැබේ.

331. එහි අඤ්ඤාතාවින්ද්‍රිය කවරෙ යත් : දැනසිටි දක්නා ලද අධිගමය කළ ප්‍රකට කළ ප්‍රත්‍යක්ෂ කළ ඒ ධර්මයන් සාක්ෂාත් කරනු පිණිස මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ යම් ප්‍රඥවක් ප්‍රජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් වේ ද, මේ අඤ්ඤාතාවින්ද්‍රිය යි කියනු ලැබේ.

අභිධර්මභාජනීය යි.

---

332. ඉන්ද්‍රියයෝ දෙ විස්සෙකි : චක්ඛුන්ද්‍රිය ය, සොතින්ද්‍රිය ය, ඝානින්ද්‍රිය ය, ජිව්හාඉන්ද්‍රිය ය, කායින්ද්‍රිය ය, මනින්ද්‍රිය ය, ජීවිතින්ද්‍රිය ය, ඉත්ථින්ද්‍රිය ය, පුරිසින්ද්‍රිය ය, සුඛින්ද්‍රිය ය, දුක්ඛින්ද්‍රිය ය, සොමනස්සින්ද්‍රිය ය, දෙමනස්සින්ද්‍රිය ය, උපෙක්ඛින්ද්‍රිය ය, සද්ධින්ද්‍රිය ය, විරියින්ද්‍රිය ය, සතින්ද්‍රිය ය, සමාධින්ද්‍රිය ය, පඤ්ඤින්ද්‍රිය ය, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය ය, අඤ්ඤින්ද්‍රිය ය, අඤ්ඤාතාවින්ද්‍රිය යි.

333. දෙවිසි ඉන්ද්‍රියයන් අතුරෙහි කුශලයෝ කෙතෙක් ද අකුශලයෝ කෙතෙක් ද අව්‍යාකෘතයෝ කෙතෙක් ද . . . සරණයෝ කෙතෙක් ද අරණයෝ කෙතෙක් ද යත් :

ඉන්ද්‍රියයෝ දස දෙනෙක් අව්‍යාකෘත වෙති, දෙමනස්සින්ද්‍රියය අකුශල ය, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියය කුශල ය. ඉන්ද්‍රියයෝ සතර දෙනෙක් කුශලයෝ ද වන්නාහ, අව්‍යාකෘත ද වන්නාහ. ඉන්ද්‍රියයෝ ස දෙනෙක් කුශල ද වන්නාහ, අකුශල ද වන්නාහ, අව්‍යාකෘත ද වන්නාහු යි.

ද්වාදසින්ද්‍රියා න වත්තබ්බා සුඛාය වෙදනාය සම්පයුත්තාතිපි දුක්ඛාය වෙදනාය සම්පයුත්තාතිපි, අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තාතිපි. ඡ ඉන්ද්‍රියා සියා සුඛාය වෙදනාය සම්පයුත්තා, සියා අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා. තීණින්ද්‍රියා සියා සුඛාය වෙදනාය සම්පයුත්තා, සියා දුක්ඛාය වෙදනාය සම්පයුත්තා, සියා අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා. ජීවිතින්ද්‍රියං සියා සුඛාය වෙදනාය සම්පයුත්තං, සියා දුක්ඛාය වෙදනාය සම්පයුත්තං, සියා අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තං, සියා න වත්තබ්බං සුඛාය වෙදනාය සම්පයුත්තන්ති'පි දුක්ඛාය වෙදනාය සම්පයුත්තන්ති'පි, අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තන්ති'පි.

සත්තින්ද්‍රියා නෙව විපාක න විපාකධම්මධම්මා. තීණින්ද්‍රියා විපාකා. ද්වින්ද්‍රියා විපාකධම්මධම්මා. අඤ්ඤින්ද්‍රියං සියා විපාකං, සියා විපාකධම්මධම්මං. නවින්ද්‍රියා සියා විපාකා, සියා විපාකධම්මධම්මා, සියා නෙව විපාක න විපාකධම්මධම්මා.

නවින්ද්‍රියා උපාදින්නුපාදානියා. දොමනස්සින්ද්‍රියං අනුපාදින්නුපාදානියං. තීණින්ද්‍රියා අනුපාදින්න අනුපාදානියා. නවින්ද්‍රියා සියා උපාදින්නුපාදානියා, සියා අනුපාදින්නුපාදානියා, සියා අනුපාදින්නඅනුපාදානියා.

නවින්ද්‍රියා අසංකිලිට්ඨසංකිලෙසිකා. දොමනස්සින්ද්‍රියං සංකිලිට්ඨසංකිලෙසිකං. තීණින්ද්‍රියා අසංකිලිට්ඨඅසංකිලෙසිකා. තීණින්ද්‍රියා සියා අසංකිලිට්ඨසංකිලෙසිකා, සියා අසංකිලිට්ඨසංකිලෙසිකා, සියා අසංකිලිට්ඨඅසංකිලෙසිකා. ඡ ඉන්ද්‍රියා සියා සංකිලිට්ඨසංකිලෙසිකා, සියා අසංකිලිට්ඨසංකිලෙසිකා, සියා අසංකිලිට්ඨඅසංකිලෙසිකා.

නවින්ද්‍රියා අවිතක්කඅවිචාරා. දොමනස්සින්ද්‍රියං සවිතක්කසවිචාරං. උපෙක්ඛින්ද්‍රියං සියා සවිතක්කසවිචාරං, සියා අවිතක්කඅවිචාරං. එකාදසින්ද්‍රියා සියා සවිතක්කසවිචාරා. සියා අවිතක්කවිචාරමත්තා, සියා අවිතක්කඅවිචාරා.

එකාදසින්ද්‍රියා න වත්තබ්බා පීතිසහගතාති'පි සුඛසහගතාති'පි උපෙක්ඛාසහගතාති'පි. සොමනස්සින්ද්‍රියං සියා පීතිසහගතං, න සුඛසහගතං, න උපෙක්ඛාසහගතං, සියා න වත්තබ්බං පීතිසහගතන්ති. ඡ ඉන්ද්‍රියා සියා පීතිසහගතා, සියා සුඛසහගතා, සියා උපෙක්ඛාසහගතා. චත්තාරින්ද්‍රියා සියා පීතිසහගතා, සියා සුඛසහගතා, සියා උපෙක්ඛාසහගතා, සියා න වත්තබ්බා පීතිසහගතාති'පි සුඛසහගතාති'පි උපෙක්ඛාසහගතාති'පි.

පණ්ණරසින්ද්‍රියා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා. දොමනස්සින්ද්‍රියං සියා දස්සනෙන පහාතබ්බං, සියා භාවනාය පහාතබ්බං. ඡ ඉන්ද්‍රියා සියා දස්සනෙන පහාතබ්බා, සියා භාවනාය පහාතබ්බා, සියා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා.

පණ්ණරසින්ද්‍රියා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා. දොමනස්සින්ද්‍රියං සියා දස්සනෙන පහාතබ්බහෙතුකං, සියා භාවනාය පහාතබ්බහෙතුකං. ඡ ඉන්ද්‍රියා සියා දස්සනෙන පහාතබ්බහෙතුකා, සියා භාවනාය පහාතබ්බහෙතුකා, සියා නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා.

ඉන්ද්‍රියයෝ දෙළොස් දෙනෙක් සුඛවෙදනාව හා සම්ප්‍රයුක්තහ යි ද දුඃඛවෙදනාව හා සම්ප්‍රයුක්තහ යි ද උපෙක්ෂාවෙදනාව හා සම්ප්‍රයුක්තහ යි ද නො කියයුත්තාහ. ඉන්ද්‍රියයෝ ස දෙනෙක් සුඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නාහ, උපෙක්ෂාවෙදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නාහ. ඉන්ද්‍රියයෝ තිදෙනෙක් සුඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නාහ, දුඃඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නාහ, උපෙක්ෂාවෙදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නාහු ය. ජීවිතෙන්ද්‍රියය සුඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නේ ය, දුඃඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නේ ය, උපෙක්ෂාවෙදනාව හා සම්ප්‍රයුක්ත ද වන්නේ ය, සුඛවෙදනාව හා සම්ප්‍රයුක්ත යි ද දුඃඛවෙදනාව හා සම්ප්‍රයුක්ත යි ද උපෙක්ෂාවෙදනාව හා සම්ප්‍රයුක්ත යි ද නො කියයුතු ද වන්නේ යි.

ඉන්ද්‍රියයෝ සත් දෙනෙක් නො ම විපාක වූ විපාකස්වභාවධර්ම නො වූවාහු ය. ඉන්ද්‍රියයෝ තිදෙනෙක් විපාකයෝ වෙති. ඉන්ද්‍රියයෝ දෙදෙනෙක් විපාකස්වභාවධර්මයෝ ය. අඤ්ඤින්ද්‍රියය විපාක ද වන්නේ ය, විපාකස්වභාවධර්ම ද වන්නේ ය. ඉන්ද්‍රියයෝ නව දෙනෙක් විපාක ද වන්නාහ, විපාකස්වභාවධර්ම ද වන්නාහ, නො ම විපාක වූ නො ද විපාකස්වභාවධර්ම ද වන්නාහු යි.

ඉන්ද්‍රියයෝ නව දෙනෙක් උපාදින්නොපාදනිය වෙති. දෙමනස්සින්ද්‍රියය අනුපාදින්නොපාදනිය ය. ඉන්ද්‍රියයෝ තිදෙනෙක් අනුපාදින්නඅනුපාදනිය වෙති. ඉන්ද්‍රියයෝ නව දෙනෙක් උපාදින්නොපාදනිය ද වන්නාහ, අනුපාදින්නොපාදනිය ද වන්නාහ, අනුපාදින්නඅනුපාදනිය ද වන්නාහු යි.

ඉන්ද්‍රියයෝ නව දෙනෙක් අසංක්ලිෂ්ටසාංක්ලෙශික වෙති. දෙමනස්සින්ද්‍රියය සංක්ලිෂ්ටසාංක්ලෙශික ය. ඉන්ද්‍රියයෝ තිදෙනෙක් අසංක්ලිෂ්ටඅසාංක්ලෙශික වෙති. ඉන්ද්‍රියයෝ තිදෙනෙක් අසංක්ලිෂ්ටසාංක්ලෙශික ද වන්නාහ, අසංක්ලිෂ්ට අසාංක්ලෙශික ද වන්නාහ. ඉන්ද්‍රියයෝ සදෙනෙක් සංක්ලිෂ්ටසාංක්ලෙශික ද වන්නාහ, අසංක්ලිෂ්ටසාංක්ලෙශික ද වන්නාහ, අසංක්ලිෂ්ට අසාංක්ලෙශික ද වන්නාහු යි.

ඉන්ද්‍රියයෝ නව දෙනෙක් අවිතර්කඅවිචාර වෙති. දෙමනස්සින්ද්‍රියය සවිතර්ක සවිචාර ය. උපෙක්ෂෙන්ද්‍රියය සවිතර්කසවිචාර ද වන්නේ ය, අවිතර්කඅවිචාර ද වන්නේ ය. ඉන්ද්‍රියයෝ එකොළොසෙක් සවිතර්කසවිචාර ද වන්නාහ, අවිතර්ක විචාරමාත්‍ර ද වන්නාහ, අවිතර්කඅවිචාර ද වන්නාහු යි.

එකොළොස් ඉන්ද්‍රිය කෙනෙක් ප්‍රීතිසහගතහ යි ද සුඛසහගතහ යි ද උපෙක්ෂාසහගතහ යි ද නො කියයුත්තාහ. සොමනස්සින්ද්‍රියය ප්‍රීතිසහගත වන්නේය. සුඛසහගත නො වෙයි උපෙක්ෂාසහගත නො වෙයි, ප්‍රීතිසහගත යි නො කියයුතු ද වන්නේ ය. ඉන්ද්‍රියයෝ සදෙනෙක් ප්‍රීතිසහගත ද වන්නාහ, සුඛසහගත ද වන්නාහ, උපෙක්ෂාසහගත ද වන්නාහ. ඉන්ද්‍රියයෝ සතර දෙනෙක් ප්‍රීතිසහගත ද වන්නාහ, සුඛසහගත ද වන්නාහ, උපෙක්ෂාසහගත ද වන්නාහ, ප්‍රීතිසහගතහ යි ද සුඛසහගතහ යි ද, උපෙක්ෂාසහගතහ යි ද නො කියයුතු ද වන්නාහු යි.

පසළොස් ඉන්ද්‍රිය කෙනෙක් නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ ය. දෙමනස්සින්ද්‍රිය දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ද වන්නේ ය, භාවනායෙන් ප්‍රහාතව්‍ය ද වන්නේ ය. ඉන්ද්‍රියයෝ සදෙනෙක් දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ද වන්නාහ, භාවනායෙන් ප්‍රහාතව්‍ය ද වන්නාහ, නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යයෝ ද වන්නාහු යි.

පසළොස් ඉන්ද්‍රිය කෙනෙක් නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇත්තාහ. දෙමනස්සින්ද්‍රිය දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතුක ද වන්නේ ය, භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතුක ද වන්නේ ය. ඉන්ද්‍රියයෝ සදෙනෙක් දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හෙතුක ද වන්නාහ, භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතුක ද වන්නාහ, නො ම දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතුක ද වන්නාහු යි.

දසින්ද්‍රියා නෙව ආචයගාමී නාපචයගාමිනො. දොමනස්සින්ද්‍රියං ආචයගාමි. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අපචයගාමි. අඤ්ඤින්ද්‍රියං සියා අපචයගාමි, සියා නෙවාචයගාමි නාපචයගාමි. නවින්ද්‍රියා සියා ආචයගාමිනො, සියා අපචයගාමිනො, සියා නෙව ආචයගාමී නාපචයගාමිනො.

දසින්ද්‍රියා නෙව සෙක්ඛා නාසෙක්ඛා. ද්වින්ද්‍රියා සෙක්ඛා. අඤ්ඤාතාවින්ද්‍රියං අසෙක්ඛං. නවින්ද්‍රියා සියා සෙක්ඛා, සියා අසෙක්ඛා, සියා නෙව සෙක්ඛා නාසෙක්ඛා.

දසින්ද්‍රියා පරිත්තා. තීණින්ද්‍රියා අප්පමාණා. නවින්ද්‍රියා සියා පරිත්තා, සියා මහග්ගතා, සියා අප්පමාණා.

සත්තින්ද්‍රියා අනාරම්මණා. ද්වින්ද්‍රියා පරිත්තාරම්මණා. තීණින්ද්‍රියා අප්පමාණාරම්මණා. දොමනස්සින්ද්‍රියං සියා පරිත්තාරම්මණං, සියා මහග්ගතාරම්මණං, න අප්පමාණාරම්මණං. සියා න වත්තබ්බං පරිත්තාරම්මණන්ති'පි මහග්ගතාරම්මණන්ති'පි. නවින්ද්‍රියා සියා පරිත්තාරම්මණා, සියා මහග්ගතාරම්මණා, සියා අප්පමාණාරම්මණා, සියා න වත්තබ්බා පරිත්තාරම්මණාති'පි මහග්ගතාරම්මණාති'පි අප්පමාණාරම්මණාති'පි.

නවින්ද්‍රියා මජ්ඣිමා. දොමනස්සින්ද්‍රියං හීනං. තීණින්ද්‍රියා පණීතා. තීණින්ද්‍රියා සියා මජ්ඣිමා, සියා පණීතා. ඡ ඉන්ද්‍රියා සියා හීනා, සියා මජ්ඣිමා, සියා පණීතා.

දසින්ද්‍රියා අනියතා. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං සම්මත්තනියතං. චත්තාරින්ද්‍රියා සියා සම්මත්තනියතා, සියා අනියතා. දොමනස්සින්ද්‍රියං සියා මිච්ඡත්තනියතං, සියා අනියතං. ඡ ඉන්ද්‍රියා සියා මිච්ඡත්තනියතා, සියා සම්මත්තනියතා, සියා අනියතා.

451. කතමෙ ධම්මා අව්‍යාකතා: යස්මිං සමයෙ අකුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකං සොතවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං සද්දාරම්මණං -පෙ- ඝානවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං ගන්ධාරම්මණං -පෙ- ජිව්හාවිඤ්ඤාණං උප්පන්නං හොති උපෙක්ඛාසහගතං රසාරම්මණං -පෙ- කායවිඤ්ඤාණං උප්පන්නං හොති දුක්ඛසහගතං ඵොට්ඨබ්බාරම්මණං. තස්මිං සමයෙ අකුසලමූලපච්චයා සඞ්ඛාරෙ, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමං, නාම පච්චයා ඡට්ඨායතනං, ඡට්ඨායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

තත්‍ථ කතමො අකුසලමූලපච්චයා සඞ්ඛාරෙ: යා චෙතනා සඤ්චෙතනා චෙතයිතත්තං අයං වුච්චති අකුසලමූලපච්චයා සඞ්ඛාරෙ -පෙ- තත්‍ථ කතමා ඵස්සපච්චයා වෙදනා: යං කායිකං අසාතං කායිකං දුක්ඛං කායසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං කායසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා. අයං වුච්චති ඵස්සපච්චයා වෙදනා.

තත්‍ථ කතමො වෙදනාපච්චයා භවො: ඨපෙත්වා වෙදනං සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො. අයං වුච්චති වෙදනාපච්චයා භවො -පෙ- තෙන වුච්චති 'එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතී'ති.

එහි කුශලමූලප්‍රත්‍යයෙන් සංස්කාර කවරෙ යත් : යම් චෙතනාවක් සඤ්චෙතනාවක් චෙතයිත බවෙක් වේ ද, මේ ' කුශලමූලප්‍රත්‍යයෙන් සංස්කාර ' යි කියනු ලැබේ. . . . ' එවමෙතෙසං ධම්මානං සමුදයො හොති ' යනු : මෙසේ මේ ධර්මයන්ගේ සඞ්ගතිය වෙයි, සමාගමය වෙයි, සමොධානය වෙයි, පහළවීම වේ. එයින් කියනු ලැබෙයි ' එවමෙතෙසං ධම්මානං සමුදයො හොති ' යි.

කුසලවිපාකමූලකය නිමි.

කුසලමූලක විපාකනිර්දෙශ යි.

---

450. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක අකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් රූපාලම්බන වූ උපෙක්ෂාසහගතවිපාකචක්ෂුර්විඥානය උපදනේ වේ ද, එසමයෙහි අකුශලමූලප්‍රත්‍යයෙන් සංස්කාරය වෙයි, සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වෙයි, විඥානප්‍රත්‍යයෙන් නාමය වෙයි, නාමප්‍රත්‍යයෙන් ෂෂ්ඨායතනය වෙයි, ෂෂ්ඨායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වෙයි, ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනාව වෙයි, වෙදනාප්‍රත්‍යයෙන් භවය වෙයි, භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි, ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ. මෙසේ මේ සියලු දුඃඛරාශිහුගේ සමුදය වේ.

එහි අකුශලමූලප්‍රත්‍යයෙන් සංස්කාර කවරෙ යත් : යම් චෙතනාවක් සඤ්චෙතනාවක් සිතන ලද බවෙක් වේ ද, මේ ' අකුශලමූලප්‍රත්‍යයෙන් සංස්කාර ' යි කියනු ලැබේ. . . . එයින් කියනු ලැබෙයි ' එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති ' යි.

451. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක අකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් විපාක වූ ශබ්දාලම්බන වූ උපෙක්ෂාසහගත ශ්‍රොත්‍රවිඥානය උපදනේ වේ ද, . . . ගන්ධාලම්බන වූ උපෙක්ෂාසහගත ඝ්‍රාණවිඥානය උපදනේ වේ ද, . . . රසාලම්බන වූ උපෙක්ෂාසහගත ජිහ්වාවිඥානය උපදනේ වේ ද, . . . ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වූ දුඃඛසහගත කායවිඥානය උපදනේ වේ ද, එසමයෙහි අකුශලමූලප්‍රත්‍යයෙන් සංස්කාරය වෙයි, සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වෙයි, විඥානප්‍රත්‍යයෙන් නාමය වෙයි, නාමප්‍රත්‍යයෙන් ෂෂ්ඨායතනය වෙයි, ෂෂ්ඨායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය වෙයි, ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනාව වෙයි, වෙදනාප්‍රත්‍යයෙන් භවය වෙයි, භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි, ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ.

එහි අකුශලමූලප්‍රත්‍යයෙන් සංස්කාර කවරෙ යත් : යම් චෙතනාවක් සඤ්චෙතනාවක් සිතන ලද බවෙක් වේ ද, මේ ' අකුශලමූලප්‍රත්‍යයෙන් සංස්කාර ' යි කියනු ලැබේ. . . .

එහි ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනා කවරෙ යත් : යම් අසාතයෙක් කායික දුඃඛයෙක් කායසම්ඵස්සයෙන් උපන් අසාත–දුඃඛවෙදයිතයෙක් කායසම්ඵස්සයෙන් උපන් අසාත–දුඃඛවෙදනාවක් වේ ද, මේ ' ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනා ' යි කියනු ලැබේ.

එහි වෙදනාප්‍රත්‍යයෙන් භවය කවරෙ යත්: වෙදනාව තබා සංඥාස්කන්ධ ය, සංස්කාර ස්කන්ධ ය, විඥානස්කන්ධ යි. මේ ' වෙදනාප්‍රත්‍යයෙන් භව ' යි කියනු ලැබේ. . . . එයින් කියනු ලැබෙයි ' එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති ' යි.

452. කතමෙ ධම්මා අව්‍යාකතා: යස්මිං සමයෙ අකුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකා මනොධාතු උප්පන්නා හොති රූපාරම්මණං වා -පෙ- ඵොට්ඨබ්බාරම්මණං වා, යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ අකුසලමූලපච්චයා සඞ්ඛාරෙ, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමං, නාමපච්චයා ඡට්ඨායතනං, ඡට්ඨායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා අධිමොක්ඛො, අධිමොක්ඛපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං -පෙ- තෙන වුච්චති 'එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතී'ති.

453. කතමෙ ධම්මා අව්‍යාකතා: යස්මිං සමයෙ අකුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා විපාකා මනොවිඤ්ඤාණධාතු උප්පන්නා හොති උපෙක්ඛාසහගතා රූපාරම්මණං වා -පෙ- ධම්මාරම්මණං වා, යං යං වා පනාරබ්භ, තස්මිං සමයෙ අකුසලමූලපච්චයා සඞ්ඛාරෙ, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමං, නාමපච්චයා ඡට්ඨායතනං, ඡට්ඨායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා අධිමොක්ඛො, අධිමොක්ඛපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

තත්ථ කතමෙ අකුසලමූලපච්චයා සඞ්ඛාරෙ: යා චෙතනා සඤ්චෙතනා චෙතයිතත්තං, අයං වුච්චති අකුසලමූලපච්චයා සඞ්ඛාරෙ.

තත්ථ කතමං සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං: යං චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු. ඉදං වුච්චති සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං.

තත්ථ කතමං විඤ්ඤාණපච්චයා නාමං: වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො. ඉදං වුච්චති විඤ්ඤාණපච්චයා නාමං.

තත්ථ කතමං නාමපච්චයා ඡට්ඨායතනං: යං චිත්තං මනො මානසං -පෙ- තජ්ජාමනොවිඤ්ඤාණධාතු. ඉදං වුච්චති නාමපච්චයා ඡට්ඨායතනං.

තත්ථ කතමො ඡට්ඨායතනපච්චයා ඵස්සො: යො ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං. අයං වුච්චති ඡට්ඨායතනපච්චයා ඵස්සො.

තත්ථ කතමා ඵස්සපච්චයා වෙදනා: යං චෙතසිකං නෙව සාතං නාසාතං චෙතොසම්ඵස්සජං අදුක්ඛමසුඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා අදුක්ඛමසුඛා වෙදනා. අයං වුච්චති ඵස්සපච්චයා වෙදනා

තත්ථ කතමො වෙදනාපච්චයා අධිමොක්ඛො: යො චිත්තස්ස අධිමොක්ඛො අධිමුච්චනා තදධිමුත්තතා. අයං වුච්චති වෙදනාපච්චයා අධිමොක්ඛො.

තත්ථ කතමො අධිමොක්ඛපච්චයා භවො: ඨපෙත්වා අධිමොක්ඛං වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො. අයං වුච්චති අධිමොක්ඛපච්චයා භවො.

තත්ථ කතමා භවපච්චයා ජාති: යා තෙසං ධම්මානං ජාති සඤ්ජාති නිබ්බත්ති අභිනිබ්බත්ති පාතුභාවො. අයං වුච්චති භවපච්චයා ජාති.

452. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක අකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් රූපාලම්බන වේවයි. . . . ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි, යළි යම් යම් අරමුණක් හෝ ඇරබැ විපාකමනොධාතුව උපදනේ වේ ද, එසමයෙහි අකුශලමූලප්‍රත්‍යයෙන් සංස්කාරය වෙයි, සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වෙයි, විඥානප්‍රත්‍යයෙන් නාමය වෙයි, නාමප්‍රත්‍යයෙන් ෂෂ්ඨායතනය වෙයි, ෂෂ්ඨායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනාව වෙයි, වෙදනාප්‍රත්‍යයෙන් අධිමොක්ෂය වෙයි, අධිමොක්ෂ ප්‍රත්‍යයෙන් භවය වෙයි, භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි, ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ. . . . එයින් කියනු ලැබෙයි ' එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති ' යි.

453. අව්‍යාකෘතධර්මයෝ කවරහ යත් : යම් කලෙක අකුශලකර්මය කළ බැවින් රැස් කළ බැවින් රූපාලම්බන වේවයි . . . ධර්මාලම්බන වේවයි යළි යම් යම් අරමුණක් හෝ ඇරබැ විපාකමනොවිඥානධාතුව උපදනේ වේ ද, එසමයෙහි අකුශලමූලප්‍රත්‍යයෙන් සංස්කාරය වෙයි, සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වෙයි, විඥානප්‍රත්‍යයෙන් නාමය වෙයි, නාමප්‍රත්‍යයෙන් ෂෂ්ඨායතනය වෙයි, ෂෂ්ඨායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය වෙයි, ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනාව වෙයි, වෙදනාප්‍රත්‍යයෙන් අධිමොක්ෂය වෙයි, අධිමොක්ෂප්‍රත්‍යයෙන් භවය වෙයි, භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි, ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ. මෙසේ මේ සියලු දුඃඛස්කන්ධයාගේ සමුදය වේ.

එහි අකුශලමූලප්‍රත්‍යයෙන් සංස්කාර කවරෙ යත් : යම් චෙතනාවක් සඤ්චෙතනාවක් සිතන ලද බවෙක් වේ ද, මේ ' අකුශලමූලප්‍රත්‍යයෙන් සංස්කාර ' යි කියනු ලැබේ.

එහි සංස්කාරප්‍රත්‍යයෙන් විඥාන කවරෙ යත් : යම් සිතෙක් මනසෙක් මානසයෙක් . . . තදනුරූපමනොවිඥානධාතුවක් වේ ද, මේ ' සංස්කාර ප්‍රත්‍යයෙන් විඥාන ' යි කියනු ලැබේ.

එහි විඥානප්‍රත්‍යයෙන් නාම කවරෙ යත් : වෙදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ යි. මේ ' විඥානප්‍රත්‍යයෙන් නාම ' යි කියනු ලැබේ.

එහි නාමප්‍රත්‍යයෙන් ෂෂ්ඨායතන කවරෙ යත් : යම් චිත්තයෙක් මනසෙක් මානස යෙක් . . . තදනුරූපමනොවිඥානධාතුවක් වේ ද, මේ ' නාමප්‍රත්‍යයෙන් ෂෂ්ඨායතන ' යි කියනු ලැබේ.

එහි ෂෂ්ඨායතනප්‍රත්‍යයෙන් ස්පර්ශ කවරෙ යත් : යම් ස්පර්ශයෙක් ස්පර්ශාකාරයෙක් මොනොවට ස්පර්ශ කරන අයුරෙක් ස්පර්ශ කළ බවෙක් වේ ද, මේ ' ෂෂ්ඨායතනප්‍රත්‍යයෙන් ස්පර්ශ ' යි කියනු ලැබේ.

එහි ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනා කවර යත් : යම් චෛතසික වූ නො ම මිහිරි වූ අමිහිරි නො වූ චෙතොසම්ඵස්සයෙන් උපන් උපෙක්ෂාවෙදයිතයෙක් චෙතොසම්ඵස්ස යෙන් උපන් උපෙක්ෂාවෙදනාවක් වේ ද මේ ' ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනා ' යි කියනු ලැබේ.

එහි වෙදනාප්‍රත්‍යයෙන් අධිමොක්ෂ කවරෙ යත් : චිත්තයාගේ යම් අධිමොක්ෂ යෙක් අධිමොක්ෂාකාරයෙක් ආලම්බනයෙහි අධිමුක්ත බවෙක් වේ ද, මේ ' වෙදනා ප්‍රත්‍යයෙන් අධිමොක්ෂ ' යි කියනු ලැබේ.

එහි අධිමොක්ෂප්‍රත්‍යයෙන් භව කවරෙ යත් : අධිමොක්ෂය තබා වෙදනාස්කන්ධ ය, සංඥාස්කන්ධ ය, සංස්කාරස්කන්ධ ය, විඥානස්කන්ධ යි. මේ ' අධිමොක්ෂප්‍රත්‍යයෙන් භව ' යි කියනු ලැබේ.

එහි භවප්‍රත්‍යයෙන් ජාති කවර යත් : ඒ (අරූපී) ධර්මයන්ගේ යම් නිපැද්මෙක් වෙසෙසින් නිපැද්මෙක් හටගැන්මෙක් වෙසෙසින් හටගැන්මෙක් පහළවීමෙක් වේ ද, මේ ' භවප්‍රත්‍යයෙන් ජාති ' යි කියනු ලැබේ

තත්ථ කතමං ජාතිපච්චයා ජරාමරණං: අත්ථි ජරා, අත්ථි මරණං. තත්ථ කතමා ජරා: යා තෙසං ධම්මානං ජරා ජීරණතා ආයුනො සංහානි. අයං වුච්චති ජරා. තත්ථ කතමං මරණං: යො තෙසං ධම්මානං ඛයො වයො භෙදො පරිභෙදො අනිච්චතා අන්තරධානං. ඉදං වුච්චති මරණං. ඉති අයඤ්ච ජරා ඉදඤ්ච මරණං. ඉදං වුච්චති ජාතිපච්චයා ජරාමරණං.

‘එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතී’ති එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සඞ්ගති හොති, සමාගමො හොති, සමොධානං හොති, පාතුභාවො හොති. තෙන වුච්චති ‘එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතී’ති.

අකුසලවිපාකමූලකං නිට්ඨිතං.

අභිධම්මභාජනියං නිට්ඨිතං.

පටිච්චසමුප්පාදවිභඞ්ගො නිට්ඨිතො ඡට්ඨො.

සීහළ පොත්ථකෙසු:

කුසලාකුසලා සොළසිකා සමූලා තෙසං පච්චයා
තෙසං විපාකා සංවඩ්ඪිතා – තෙහි සඞ්ඛාරපච්චයා

පඨමචතුක්කකුසල – අවිජ්ජා තස්ස පච්චයා
එකනාලො විපාකස්මිං – තෙහි කුසලාකුසලමූලකා

විචිකිච්ඡා දසවිඤ්ඤාණෙ – අධිමොක්ඛො න ලබ්භති.
අහෙතුකෙ වා කුසලෙ – පසාදෙ නුපලබ්භති.

එහි ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ කවරෙ යත් : ජරාවක් ඇත, මරණයෙක් ඇති. එහි ජරා කවර යත් : ඒ අරූපිධර්මයන්ගේ යම් ජරාවක් දිරන බවෙක් ආයුෂයාගේ පිරිහීමෙක් වේ ද, මේ ' ජරා ' යි කියනු ලැබේ. එහි මරණ කවරෙ යත්: ඒ අරූපිධර්මයන්ගේ යම් ක්ෂයවීමෙක් ව්‍යයවීමෙක් බිඳීමෙක් හාත්පසින් බිඳීමෙක් අනිත්‍ය බවෙක් අතුරුදහන් වීමෙක් වේ ද, මේ ' මරණ ' යි කියනු ලැබේ. මෙසේ මේ ජරාව ද මේ මරණය ද යි මේ ' ජරාමරණ ' යි කියනු ලැබේ.

'එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති ' යනු : මෙසේ මේ සියලු දුඃඛස්කන්ධයාගේ සඞ්ගතිය වෙයි, සමාගමය වෙයි, සමවධානය වෙයි, ප්‍රාදුර්භාවය වේ. එයින් කියනු ලැබෙයි ' එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති ' යි.

අකුශලවිපාකමූලකය නිමි.

අභිධර්මභාජනිය නිමි.

ප්‍රතීත්‍යසමුත්පාදවිභඞ්ගය නිමි.

---

7. සතිපට්ඨානවිභඞ්ගො

454. චත්තාරො සතිපට්ඨානා : ඉධ භික්ඛු අජ්ඣත්තං කායෙ කායානුපස්සී විහරති, බහිද්ධා කායෙ කායානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා කායෙ කායානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අජ්ඣත්තං වෙදනාසු වෙදනානුපස්සී විහරති, බහිද්ධා වෙදනාසු වෙදනානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අජ්ඣත්තං චිත්තෙ චිත්තානුපස්සී විහරති, බහිද්ධා චිත්තෙ චිත්තානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා චිත්තෙ චිත්තානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අජ්ඣත්තං ධම්මෙසු ධම්මානුපස්සී විහරති, බහිද්ධා ධම්මෙසු ධම්මානුපස්සී විහරති, අජ්ඣත්තබහිද්ධා ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

455. කථඤ්ච භික්ඛු අජ්ඣත්තං කායෙ කායානුපස්සී විහරති: ඉධ භික්ඛු අජ්ඣත්තං කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති : අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො, මංසං නහාරු අට්ඨී අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තං. සො තං නිමිත්තං ආසෙවති, භාවෙති, බහුලීකරොති, ස්වාවත්ථිතං වවත්ථපෙති. සො තං නිමිත්තං ආසෙවිත්වා භාවෙත්වා බහුලීකරිත්වා ස්වාවත්ථිතං වවත්ථපෙත්වා බහිද්ධා කායෙ චිත්තං උපසංහරති.

කථඤ්ච, භික්ඛු බහිද්ධා කායෙ කායානුපස්සී විහරති: ඉධ භික්ඛු බහිද්ධා කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති: අත්ථිස්ස කායෙ[1] කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨී අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තං. සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරොති ස්වාවත්ථිතං වවත්ථපෙති. සො තං නිමිත්තං ආසෙවිත්වා භාවෙත්වා බහුලීකරිත්වා ස්වාවත්ථිතං වවත්ථපෙත්වා අජ්ඣත්තබහිද්ධා කායෙ චිත්තං උපසංහරති.

1. අත්ථි ඉමස්මිං කායෙ – සීමු.

7. සතිපට්ඨානවිභඞ්ගය

454. සතිපට්ඨානයෝ සතර දෙනෙකි : මේ සස්නෙහි මහණ කෙලෙස් තවන වීර්‍ය ඇත්තේ සම්‍යග්ඥාන ඇත්තේ ස්මෘතිමත් වූයේ කාය සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාව හා දෙම්නස දුරු කොට තමාගේ කයෙහි කය අනුව බලමින් වෙසෙයි, මෙරමාගේ කයෙහි කය අනුව බලමින් වෙසෙයි, කලෙක තමාගේ කයෙහි ද කලෙක මෙරමාගේ කයෙහි ද කය අනුව බලමින් වෙසෙයි. කෙලෙස් තවන වැර ඇතියේ සම්‍යග්ඥාන ඇතියේ ස්මෘතිමත් වූයේ වෙදනා සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාව හා දෙම්නස දුරු කොට තමාගේ වෙදනාවන්හි වෙදනාව අනුව බලමින් වෙසෙයි, මෙරමාගේ වෙදනාවන්හි වෙදනා අනුව බලමින් වෙසෙයි, කලෙක තමාගේ වෙදනාවන්හි ද කලෙක මෙරමාගේ වෙදනාවන්හි ද වෙදනා අනුව බලමින් වෙසෙයි, කෙලෙස් තවන වැර ඇතියේ සම්‍යග්ඥාන ඇතියේ ස්මෘතිමත් වූයේ චිත්ත සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාව හා දෙම්නස දුරු කොට තමාගේ චිත්තයෙහි සිත අනුව බලමින් වෙසෙයි, මෙරමාගේ චිත්තයෙහි සිත අනුව බලමින් වෙසෙයි, තමාගේ සිත්හි ද මෙරමාගේ සිත්හි ද සිත අනුව බලමින් වෙසෙයි, කෙලෙස් තවන වැර ඇතියේ සම්‍යග්ඥාන ඇතියේ ස්මෘතිමත් වූයේ (නීවරණාදි) ධර්ම සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාව හා දෙම්නස දුරු කොට තමාගේ (නීවරණාදි) ධර්මයන්හි ධර්මය අනුව බලමින් වෙසෙයි, මෙරමාගේ (නීවරණාදි) ධර්මයන්හි ධර්මය අනුව බලමින් වෙසෙයි, තමා හා මෙරමාගේ (නීවරණාදි) ධර්මයන්හි ධර්මය අනුව බලමින් වෙසේ.

455. කිසෙයින් මහණ තෙමෙ තමාගේ කයෙහි කය අනුව බලමින් වෙසේ ද යත් : මේ සස්නෙහි මහණ පාතෙලෙන් උඩ කෙසගින් යට (සරසැ) සිවි හිම් කොට ඇති තමාගේ කය නන්වැදෑරුම් අසුචි පිරුණක් කොට ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි : මේ කයෙහි කෙස් ඇත, ලොම් – නිය – දත් – සිවි – මස් – නහර – ඇට – ඇටමිදුළු – වකුගඩ – හදවත – අක්මාව – දලබුව – බඩදිව – පෙණහලු – අතුණු – අතුණුබහන – නො පැසුණු අහර – පැසුණු අහර – පිත – සෙම – පූයා – ලෙහෙ – සෝදිය – මේදතෙල් – කඳුළු – වුරුණුතෙල් – කෙළ – මුකුණු – සඳමිදුළු – සුලුදිය ඇති. හෙතෙම ඒ කමටහන්නිමිත්ත ඇසුරු කෙරෙයි, වඩයි, පුනපුනා වඩයි, මොනොවට නිශ්චය කෙරෙයි. හෙතෙම ඒ නිමිත්ත අසුරු කොට වඩා බහුල කොට මැනැවින් නිශ්චය කොට මෙරමාගේ කයෙහි (තමාගේ) සිත එළවයි.

කිසෙයින් මහණ මෙරමාගේ කයෙහි කය පුනපුනා බලමින් වෙසේ ද යත්: මේ සස්නෙහි මහණ පාතෙලෙන් උඩ කෙසගින් යට සිවිපිරියත් කොට ඇති මෙරමාගේ කය නන්වැදෑරුම් අසුචි පිරුණක් කොට ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි: මේ කයෙහි කෙස් ඇත, ලොම් – නිය – දත් – සිවි – මස් – නහර – ඇට – ඇටමිදුළු – වකුගඩ – හදවත – අක්මාව – දලබුව – බඩදිව – පෙණහලු – අතුණු – අතුණුබහන – නො පැසුණු අහර – පැසුණු අහර – පිත – සෙම – පූයා – ලෙහෙ – සෝදිය – මේදතෙල් – කඳුළු – වුරුණු තෙල් – කෙළ – මුකුණු – සඳමිදුළු – සුලුදිය ඇත. හෙතෙම ඒ කමටහන්නිමිත්ත ආසෙවන කෙරෙයි, වඩයි, පුනපුනා වඩයි, මොනොවට නිශ්චය කෙරෙයි, හෙතෙම ඒ නිමිත්ත ආසෙවන කොට, වඩා, පුනපුනා වඩා, මැනැවින් නිශ්චය කොට තමා හා මෙරමාගේ කයෙහි (තමාගේ) සිත එළවයි.

කථඤ්ච භික්ඛු අජ්ඣත්තබහිද්ධා කායෙ කායානුපස්සී විහරති: ඉධ භික්ඛු අජ්ඣත්තබහිද්ධා කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති. අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං න්හාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තං. එවං භික්ඛු අජ්ඣත්තබහිද්ධා කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

456. අනුපස්සී'ති තත්ථ කතමා අනුපස්සනා: යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති අනුපස්සනා. ඉමාය අනුපස්සනාය උපෙතො හොති සමුපෙතො උපගතො[1] සමුපගතො[2] උපපන්නො සමුපපන්නො[3] සමන්නාගතො. තෙන වුච්චති අනුපස්සී'ති.

'විහරතී'ති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති චරති විහරති. තෙන වුච්චති විහරතී'ති.

'ආතාපී'ති තත්ථ කතමං ආතප්පං[4]: යො චෙතසිකො විරියාරම්භො -පෙ- සම්මාවායාමො, ඉදං වුච්චති ආතප්පං.[4] ඉමිනා ආතප්පෙන උපෙතො හොති සමුපෙතො උපගතො[1] සමුපගතො[2] උපපන්නො සමුපපන්නො[3] සමන්නාගතො. තෙන වුච්චති ආතාපී'ති.

'සම්පජානො'ති තත්ථ කතමං සම්පජඤ්ඤං: යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති සම්පජඤ්ඤං. ඉමිනා සම්පජඤ්ඤෙන උපෙතො හොති සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො. තෙන වුච්චති සම්පජානො'ති.

'සතිමා'ති තත්ථ කතමා සති: යා සති අනුස්සති -පෙ- සම්මාසති අයං වුච්චති සති. ඉමාය සතියා උපෙතො හොති සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො. තෙන වුච්චති සතිමා'ති.

'විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්ස'න්ති තත්ථ කතමො ලොකො: ස්වෙ'ව කායො ලොකො, පඤ්ච'පි උපාදානක්ඛන්ධා ලොකො. අයං වුච්චති ලොකො.

තත්ථ කතමා අභිජ්ඣා: යො රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො. අයං වුච්චති අභිජ්ඣා.

1. උපාගතො - සිරිමු, මජසං.
2. සමුපාගතො - සිරිමු, මජසං.
3. සමපන්නො - සිරිමු, මජසං.
4. {ආතාපං - සිරිමු.
ආතාපො - මජසං.

කිසෙයින් මහණ අධ්‍යාත්ම වූ ද බාහිර වූ ද කයෙහි කායානුපස්සී ව වෙසේ ද යත් : මෙ සස්නෙහි මහණ පාතෙලෙන් උඩ කෙසගින් යට සිවිපිරියත් කොට ඇති අධ්‍යාත්ම වූ ද බාහිර වූ ද කය නන්වැදෑරුම් අසුචි පිරුණක් කොට ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි : මෙ කයෙහි කෙස් ඇත, ලොම් – නිය – දත් – සිවි – මස් – නහර – ඇට – ඇටමිදුළු – වකුගඩ – හදවත – අක්මාව – දලබුව – බඩදිව – පෙණහලු – අතුණු – අතුණුබහන – නො පැසුණු අහර – පැසුණු අහර – පිත – සෙම – පූයා – ලෙහෙ – සෝදිය – මේදතෙල් – කඳුළු – වුරුණු තෙල් – කෙළ – මුකුණු – සඳමිදුළු – සුලුදිය ඇති. මෙසෙයින් මහණ කෙලෙස් තවන වැර ඇතියේ සම්‍යග්ඥාන ඇතියේ ස්මෘතිමත් වූයේ කාය සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාව හා දෙම්නස දුරු කොට කලෙක තමාගේ කයෙහි කලෙක මෙරමාගේ කයෙහි කායානුපස්සී ව වෙසේ.

456. අනුපස්සී යනු : එහි අනුපස්සනා කවර යත් : යම් ප්‍රඥවක් පජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද, මේ ' අනුපස්සනා ' යි කියනු ලැබේ. මේ අනුපස්සනායෙන් යුක්ත වූයේ සමුපෙත වූයේ එළඹ සිටියේ මොනොවට එළඹ සිටියේ නො වෙන් වූයේ පිරිපුන් වූයේ සමන්විත වූයේ යි. එහෙයින් ' අනුපස්සී ' යි කියනු ලැබේ.

විහරති යනු : ඉරියවු පවත්වයි, ඉරියවු උපදවයි, ඉරියවු රකියි, යපනය කෙරෙයි, යාපනය කෙරෙයි, හැසිරෙයි, වෙසෙයි, එහෙයින් ' විහරති ' යි කියනු ලැබේ.

ආතාපී යනු : එහි ආතප්ප කවරෙ යත් : යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයෙක් . . . සම්‍යග්ව්‍යායාමයෙක් වේ ද, මේ ' ආතප්ප ' යි කියනු ලැබේ. මේ ආතප්පයෙන් යුක්ත වූයේ සමුපෙත වූයේ එළඹ සිටියේ මොනොවට එළඹ සිටියේ නො වෙන් වූයේ පිරිපුන් වූයේ සමන්විත වූයේ යි. එහෙයින් ' ආතාපී ' යි කියනු ලැබේ.

සම්පජානො යනු : එහි ' සම්පජඤ්ඤ ' කවරෙ යත් : යම් ප්‍රඥවක් පජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද, මේ ' සම්පජඤ්ඤ 'යි කියනු ලැබේ. මේ ' සම්පජඤ්ඤයෙන් ' යුක්ත වූයේ සමුපෙත වූයේ එළඹ සිටියේ මොනොවට එළඹ සිටියේ නො වෙන් වූයේ පරිපූර්ණ වූයේ සමන්වාගත වූයේ යි. එහෙයින් ' සම්පජාන ' යි කියනු ලැබේ.

සතිමා යනු : එහි ' සති ' කවර යත් : යම් ස්මෘතියක් අනුස්මෘතියක් . . . සම්‍යක් ස්මෘතියක් වේ ද, මේ ' සති ' යි කියනු ලැබේ. මේ සතියෙන් උපෙත වූයේ සමුපෙත වූයේ එළඹ සිටියේ මොනොවට එළඹ සිටියේ නො වෙන් වූයේ පරිපූර්ණ වූයේ සමන්වාගත වූයේ යි. එහෙයින් ' සතිමා ' යි කියනු ලැබේ.

විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං යනු : එහි ' ලොක ' කවරෙ යත් : එ ම කය ලොක යැ, පඤ්චොපාදනස්කන්ධයෝ ද ලොක යැ, මේ ' ලොක ' යි කියනු ලැබේ.

එහි ' අභිජ්ඣා ' කවර යත් : යම් රාගයෙක් බලවත් රාගයෙක් . . . චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' අභිජ්ඣා ' යි කියනු ලැබේ.

තත්ථ කතමං දොමනස්සං: යං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං චෙතොසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, ඉදං වුච්චති දොමනස්සං. ඉති අයඤ්ච අභිජ්ඣා ඉදඤ්ච දොමනස්සං, ඉමම්හි ලොකෙ විනීතා හොන්ති පටිවිනීතා සන්තා සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථංගතා අප්පිතා බ්‍යප්පිතා සොසිතා විසොසිතා බ්‍යන්තීකතා. තෙන වුච්චති විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා-දොමනස්ස'න්ති.

කායානුපස්සනා නිද්දෙසො.

---

457. කථඤ්ච භික්ඛු අජ්ඣත්තං වෙදනාසු වෙදනානුපස්සී විහරති: ඉධ භික්ඛු සුඛං වෙදනං වෙදියමානො[1] සුඛං වෙදනං වෙදියාමී'ති පජානාති. දුක්ඛං වෙදනං වෙදියමානො දුක්ඛං වෙදනං වෙදියාමී'ති පජානාති. අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානො අදුක්ඛමසුඛං වෙදනං වෙදියාමී'ති[2] පජානාති. සාමිසං වා සුඛං වෙදනං වෙදියමානො සාමිසං සුඛං වෙදනං වෙදියාමී'ති පජානාති. නිරාමිසං වා සුඛං වෙදනං වෙදියමානො නිරාමිසං සුඛං වෙදනං වෙදියාමී'ති පජානාති. සාමිසං වා දුක්ඛං වෙදනං වෙදියමානො සාමිසං දුක්ඛං වෙදනං වෙදියාමී'ති පජානාති. නිරාමිසං වා දුක්ඛං වෙදනං වෙදියමානො නිරාමිසං දුක්ඛං වෙදනං වෙදියාමී'ති පජානාති. සාමිසං වා අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානො සාමිසං අදුක්ඛමසුඛං වෙදනං වෙදියාමී'ති පජානාති. නිරාමිසං වා අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානො නිරාමිසං අදුක්ඛමසුඛං වෙදනං වෙදියාමී'ති පජානාති. සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරෙති ස්වාවත්ථිතං වවත්ථපෙති. සො තං නිමිත්තං ආසෙවිත්වා භාවෙත්වා බහුලීකරිත්වා ස්වාවත්ථිතං වවත්ථපෙත්වා බහිද්ධා වෙදනාසු චිත්තං උපසංහරති.

කථඤ්ච භික්ඛු බහිද්ධා වෙදනාසු වෙදනානුපස්සී විහරති: ඉධ භික්ඛු සුඛං වෙදනං වෙදියමානං සුඛං වෙදනං වෙදියතී'ති පජානාති. දුක්ඛං වෙදනං වෙදියමානං දුක්ඛං වෙදනං වෙදියතී'ති පජානාති. අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානං අදුක්ඛමසුඛං වෙදනං වෙදියතී'ති පජානාති. සාමිසං වා සුඛං වෙදනං වෙදියමානං සාමිසං සුඛං වෙදනං වෙදියතී'ති පජානාති. නිරාමිසං වා සුඛං වෙදනං වෙදියමානං නිරාමිසං සුඛං වෙදනං වෙදියතී'ති පජානාති. සාමිසං වා දුක්ඛං වෙදනං වෙදියමානං සාමිසං දුක්ඛං වෙදනං වෙදියතී'ති පජානාති. නිරාමිසං වා දුක්ඛං වෙදනං වෙදියමානං නිරාමිසං දුක්ඛං වෙදනං වෙදියතී'ති පජානාති. සාමිසං වා අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානං සාමිසං අදුක්ඛමසුඛං වෙදනං වෙදියතී'ති පජානාති. නිරාමිසං වා අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානං නිරාමිසං අදුක්ඛමසුඛං වෙදනං වෙදියතී'ති පජානාති. සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරෙති ස්වාවත්ථිතං වවත්ථපෙති. සො තං නිමිත්තං ආසෙවිත්වා භාවෙත්වා බහුලීකරිත්වා ස්වාවත්ථිතං වවත්ථපෙත්වා අජ්ඣත්තබහිද්ධා වෙදනාසු චිත්තං උපසංහරති.

---

1. වෙදයමානො – සිරිමු, මජසං. 2. වෙදයාමීති සිරිමු.

එහි ' දෞමනස්ස ' කවරේ යත් : යම් චෛතසික වූ අසාතයෙක් චෛතසික දුඃඛයෙක් චෙතොසම්ඵස්සජ වූ අසාත වූ දුඃඛ වූ වෙදයිතයෙක් චෙතොසම්ඵස්සජ වූ අසාතදුඃඛ වෙදනාවක් වේ ද, මේ ' දෞමනස්ස ' යි කියනු ලැබේ. මෙසේ මේ අභිධ්‍යාව ද මේ දෙම්නස ද මේ කායසඞ්ඛ්‍යාත ලොකයෙහි දුරු කරන ලද්දාහු වෙසෙසින් දුරු කරන ලද්දාහු සන්හුන්නාහු සන්හිඳුවන ලද්දාහු ව්‍යුපශම කරන ලද්දාහු නිරොධසඞ්ඛ්‍යාත අස්තයට ගියාහු අතිශයින් අස්තයට ගියාහු නසන ලද්දාහු වෙසෙසින් නසන ලද්දාහු වියළන ලද්දාහු මොනොවට වියළන ලද්දාහු විගතාන්ත කරන ලද්දාහු වෙත්. එහෙයින් ' විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං ' යි කියනු ලැබේ.

කායානුපස්සනානිර්දේශ යි.

---

457. කිසෙයින් මහණ තමා පිළිබඳ වෙදනාවන්හි වෙදනානුදර්ශී ව වෙසේ ද යත් : මෙ සස්නෙහි මහණ (කායික වූ හෝ චෛතසික වූ හෝ) සුඛවෙදනාව විඳිනුයේ ' සුඛ වෙදනාව විඳිමි ' දනගනි, දුඃඛවෙදනාව විඳිනුයේ ' දුඃඛවෙදනාව විඳිමි ' දනගනි, උපෙක්ෂා වෙදනාව විඳිනුයේ ' උපෙක්ෂාවෙදනාව විඳිමි ' දනගනි, සාමිස (පඤ්චකාමගුණ නිශ්‍රිත) වූ හෝ සුඛවෙදනාව විඳිනුයේ ' සාමිසසුඛවෙදනාව විඳිමි ' දනගනි, නිරාමිස වූ හෝ සුඛවෙදනාව විඳිනුයේ ' නිරාමිසසුඛවෙදනාව විඳිමි ' දනගනි, සාමිස වූ හෝ දුඃඛවෙදනාව විඳිනුයේ ' සාමිසදුඃඛවෙදනාව විඳිමි ' දනගනි, නිරාමිස වූ හෝ දුඃඛවෙදනාව විඳිනුයේ ' නිරාමිසදුඃඛවෙදනාව විඳිමි ' දනගනි, සාමිස වූ හෝ අදුක්ඛමසුඛවෙදනාව විඳිනුයේ ' සාමිසඅදුක්ඛමසුඛවෙදනාව විඳිමි ' දනගනි, නිරාමිස වූ හෝ අදුක්ඛමසුඛවෙදනාව විඳිනුයේ ' නිරාමිස වූ අදුක්ඛමසුඛ වෙදනාව විඳිමි ' දනගනි. හෙතෙම ඒ වෙදනා නිමිත්ත ආසෙවන කෙරෙයි, වඩයි, බහුල කෙරෙයි, මොනොවට නිශ්චය කෙරෙයි. හෙතෙම ඒ නිමිත්ත ආසෙවන, භාවන, බහුලීකරණය කොට මැනැවින් නිශ්චය කොට මෙරමා පිළිබඳ වෙදනාවන්හි සිත එළවයි.

කිසෙයින් මහණ මෙරමා පිළිබඳ වෙදනාවන්හි වෙදනානුදර්ශී ව වෙසේ ද යත් : මෙ සස්නෙහි මහණ තෙමෙ සුඛවෙදනාව විඳින්නහු ' සුඛවෙදනාව විඳී ' යයි දනගනි. දුඃඛවෙදනාව විඳින්නහු ' දුඃඛවෙදනාව විඳී ' යයි දනගනි, අදුක්ඛමසුඛවෙදනාව විඳින්නහු ' අදුක්ඛමසුඛවෙදනාව විඳී ' යයි දනගනි, සාමිස වූ හෝ සුඛවෙදනාව විඳින්නහු ' සාමිස සුඛවෙදනාව විඳී ' යයි දනගනි, නිරාමිස වූ හෝ සුඛවෙදනාව විඳින්නහු ' නිරාමිස සුඛවෙදනාව විඳී ' යයි දනගනි, සාමිස වූ හෝ දුඃඛවෙදනාව විඳින්නහු ' සාමිසදුඃඛ වෙදනාව විඳී ' යයි දනගනි, නිරාමිස වූ හෝ දුඃඛවෙදනාව විඳින්නහු ' නිරාමිසදුඃඛ වෙදනාව විඳී ' යයි දනගනි, සාමිස වූ හෝ අදුක්ඛමසුඛවෙදනාව විඳින්නහු ' සාමිස වූ අදුක්ඛමසුඛවෙදනාව විඳී ' යයි දනගනි, නිරාමිස වූ හෝ අදුක්ඛමසුඛවෙදනාව විඳින්නහු ' නිරාමිසඅදුක්ඛමසුඛවෙදනාව විඳී ' යයි දනගනි. හෙතෙම ඒ (වෙදනා) නිමිත්ත සෙවනය කෙරෙයි, වඩයි, පුනපුනා වඩයි, මොනොවට නිශ්චය කෙරෙයි. හෙතෙම ඒ නිමිත්ත සෙවනය කොට වඩා පුනපුනා වඩා මැනැවින් නිශ්චය කොට තමාගේ ද මෙරමාගේ ද වෙදනාවන්හි සිත එළවයි.

කථං ච භික්ඛු අජ්ඣත්තබහිද්ධා වෙදනාසු වෙදනානුපස්සී විහරති: ඉධ භික්ඛු සුඛං වෙදනං සුඛා වෙදනා'ති පජානාති. දුක්ඛං වෙදනං දුක්ඛා වෙදනා'ති පජානාති. අදුක්ඛමසුඛං වෙදනං අදුක්ඛමසුඛා වෙදනා'ති පජානාති. සාමිසං වා සුඛං වෙදනං සාමිසා සුඛා වෙදනා'ති පජානාති. නිරාමිසං වා සුඛං වෙදනං නිරාමිසා සුඛා වෙදනා'ති පජානාති. සාමිසං වා දුක්ඛං වෙදනං සාමිසා දුක්ඛා වෙදනා'ති පජානාති. නිරාමිසං වා දුක්ඛං වෙදනං නිරාමිසා දුක්ඛා වෙදනා'ති පජානාති සාමිසං වා අදුක්ඛමසුඛං වෙදනං සාමිසා අදුක්ඛමසුඛා වෙදනා'ති පජානාති. නිරාමිසං වා අදුක්ඛමසුඛං වෙදනං නිරාමිසා අදුක්ඛමසුඛා වෙදනාති පජානාති. එවං භික්ඛු අජ්ඣත්තබහිද්ධා වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

458. අනුපස්සී'ති -පෙ- විහරතී'ති -පෙ- ආතාපී'ති -පෙ- සම්පජානො'ති -පෙ- සතිමා'ති -පෙ- විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සන්ති. තත්ථ කතමො ලොකො: සා'ව වෙදනා ලොකො, පඤ්චපි උපාදානක්ඛන්ධා ලොකො. අයං වුච්චති ලොකො.

තත්ථ කතමා අභිජ්ඣා: යො රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො. අයං වුච්චති අභිජ්ඣා. තත්ථ කතමං දොමනස්සං: යං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං චෙතොසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා. ඉදං වුච්චති දොමනස්සං. ඉති අයඤ්ච අභිජ්ඣා ඉදඤ්ච දොමනස්සං, ඉමම්හි ලොකෙ විනීතා හොන්ති පටිවිනීතා සන්තා සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා බ්‍යප්පිතා සොසිතා විසොසිතා බ්‍යන්තීකතා තෙන වුච්චති විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සන්ති.

වෙදනානුපස්සනා නිද්දෙසො.

---

459. කථඤ්ච භික්ඛු අජ්ඣත්තං චිත්තෙ චිත්තානුපස්සී විහරති: ඉධ භික්ඛු සරාගං වා චිත්තං සරාගං මෙ චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං මෙ චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං මෙ චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං මෙ චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං මෙ චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං මෙ චිත්තන්ති පජානාති. සංඛිත්තං වා චිත්තං සංඛිත්තං මෙ චිත්තන්ති පජානාති. වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං මෙ චිත්තන්ති පජානාති. මහග්ගතං වා චිත්තං මහග්ගතං මෙ චිත්තන්ති පජානාති. අමහග්ගතං වා චිත්තං අමහග්ගතං මෙ චිත්තන්ති පජානාති. සඋත්තරං වා චිත්තං සඋත්තරං මෙ චිත්තන්ති පජානාති අනුත්තරං වා චිත්තං අනුත්තරං මෙ චිත්තන්ති පජානාති. සමාහිතං වා චිත්තං සමාහිතං මෙ චිත්තන්ති පජානාති. අසමාහිතං වා චිත්තං අසමාහිතං මෙ චිත්තන්ති පජානාති. විමුත්තං වා චිත්තං විමුත්තං මෙ චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං මෙ චිත්තන්ති පජානාති. සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරොති ස්වාවත්ථිතං වවත්ථපෙති. සො තං නිමිත්තං ආසෙවිත්වා භාවෙත්වා බහුලීකරිත්වා ස්වාවත්ථිතං වවත්ථපෙත්වා බහිද්ධා චිත්තෙ චිත්තං උපසංහරති.

කිසෙයින් මහණ අජ්ඣත්තබහිද්ධාවෙදනාවන්හි වෙදනානුදර්ශී ව වෙසේ ද යත් : මෙ සස්නෙහි මහණ තෙම සුඛවෙදනාව ' සුඛවෙදනා ' යි දැනගනී, දුඃඛවෙදනාව ' දුඃඛවෙදනා ' යි දැනගනී, අදුක්ඛමසුඛවෙදනාව ' අදුක්ඛමසුඛවෙදනා ' යි දැනගනී, සාමිස වූ හෝ සුඛවෙදනාව ' සාමිසසුඛවෙදනා ' යි දැනගනී, නිරාමිස වූ හෝ සුඛවෙදනාව ' නිරාමිස සුඛවෙදනා ' යි දැනගනී, සාමිස වූ හෝ දුඃඛවෙදනාව ' සාමිසදුඃඛවෙදනා ' යි දැනගනී, නිරාමිස වූ හෝ දුඃඛවෙදනාව ' නිරාමිසදුඃඛවෙදනා ' යි දැනගනී, සාමිස වූ හෝ අදුක්ඛම සුඛවෙදනාව ' සාමිස වූ අදුක්ඛමසුඛවෙදනා ' යි දැනගනී, නිරාමිස වූ හෝ අදුක්ඛමසුඛ වෙදනාව ' නිරාමිසඅදුක්ඛමසුඛවෙදනා ' යි දැනගනී. මෙසේ මහණ තෙම කෙලෙස් තවන වැර ඇතියේ සම්‍යග්ඥාන ඇතියේ ස්මෘතිමත් වූයේ වෙදනා සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාව හා දෞර්මනස දුරු කොට තමාගේ ද මෙරමාගේ ද වෙදනාවන්හි වෙදනානුදර්ශී ව වෙසේ.

458. අනුපස්සී යනු : . . . විහරති යනු : . . . ආතාපී යනු : . . . සම්පජානො යනු : . . . සතිමා යනු : . . . විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං යනු : එහි ලොකය කවර යත් : ඒ වෙදනාව ම ලොක නමි. පඤ්චොපාදානස්කන්ධයෝ ද ලොක නමි. මේ 'ලොක ' යි කියනු ලැබේ.

එහි ' අභිධ්‍යා ' කවර යත් : යම් රාගයෙක් බලවත් රාගයෙක් . . . චිත්තයාගේ බලවත් රාගයෙක් වේ ද, මේ ' අභිධ්‍යා ' යි කියනු ලැබේ.

එහි ' දෞර්මනස්ස ' කවරෙ යත් : යම් චෛතසික වූ අසාතයෙක් චෛතසික වූ දුඃඛයෙක් චෙතොසම්ඵස්සජ අසාතදුඃඛවෙදයිතයෙක් චෙතොසම්ඵස්සජ අසාතදුඃඛවෙදනායෙක් වේ ද, මේ ' දෞර්මනස්ස ' යි කියනු ලැබේ. මෙසේ මේ අභිධ්‍යාව ද මේ දෞර්මනස ද මේ වෙදනා ලොකයෙහි බැහැර කරන ලද්දහු වෙසෙසින් බැහැර කරන ලද්දහු සන්හිඳුනාහු සන්හිඳුවන ලද්දහු ව්‍යුපශම කරන ලද්දහු නිරොධ සඞ්ඛ්‍යාත අස්තයට ගියාහු අතිශයින් අස්තයට ගියාහු නසන ලද්දහු වෙසෙසින් නසන ලද්දහු වියළන ලද්දහු වෙසෙසින් වියළන ලද්දහු විගතාන්ත කරන ලද්දහු වෙත්. එහෙයින් ' විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දෙමනස්සං ' යි කියනු ලැබේ.

වෙදනානුපස්සනා නිර්දේශ යි.

---

459. කිසෙයින් මහණ තමාගේ චිත්තයෙහි චිත්තානුදර්ශී ව වෙසේ ද යත් : මෙ සස්නෙහි මහණ තෙම රාග සහිත වූ හෝ චිත්තය ' මාගේ චිත්තය රාග සහිත ය ' යි දැනගනී. වීතරාග වූ හෝ සිත ' මාගේ සිත වීතරාග ය ' යි දැනගනී, සදෙස වූ හෝ සිත ' මාගේ සිත සදෙස ය ' යි දැනගනී, වීතදෙස වූ හෝ සිත ' මාගේ සිත වීතදෙස ය ' යි දැනගනී, මොහ සහිත වූ හෝ සිත ' මාගේ සිත මොහ සහිත ය ' යි හෝ දැනගනී, විගත මොහ වූ හෝ සිත ' මාගේ සිත වීතමොහ ය ' යි දැනගනී, (ථිනමිද්ධ වශයෙන්) හැකුළුණු හෝ සිත ' මාගේ සිත හැකිළුණු ' යි දැනගනී, (උද්ධච්ච වශයෙන්) විසුරුණු වූ හෝ සිත ' මාගේ සිත විසිරිණු ' යි දැනගනී, මහද්ගත වූ හෝ සිත ' මාගේ සිත මහද්ගත ය ' යි දැනගනී, අමහද්ගත වූ හෝ සිත ' මාගේ සිත අමහද්ගත ය ' යි දැනගනී, සඋත්තර වූ හෝ සිත ' මාගේ සිත සඋත්තර ය ' යි දැනගනී, අනුත්තර වූ හෝ සිත ' මාගේ සිත අනුත්තර ය ' යි දැනගනී, සමාධියට පැමිණියා වූ හෝ සිත ' මාගේ සිත සමාහිත ය ' යි දැනගනී, අසමාහිත වූ හෝ සිත ' මාගේ සිත අසමාහිත ය ' යි දැනගනී, (තදඞ්ග විෂ්කම්භණ විසින්) විමුක්ත වූ හෝ සිත ' මාගේ සිත විමුක්ත ය ' යි දැනගනී, අවිමුක්ත වූ හෝ සිත ' මාගේ සිත අවිමුක්ත ය ' යි දැනගනී. හෙතෙම ඒ (භාවනා) නිමිත්ත ආසෙවනය කෙරෙයි, භාවනා කෙරෙයි, පුනපුනා වඩයි, මොනොවට නිශ්චය කෙරෙයි. හෙතෙම ඒ නිමිත්ත ආසෙවනය කොට භාවනා කොට පුනපුනා වඩා මැනැවින් නිශ්චය කොට මෙරමාගේ සිත්හි (තමාගේ) සිත එළවයි.

කථඤ්ච භික්ඛු බහිද්ධා චිත්තෙ චිත්තානුපස්සී විහරති: ඉධ භික්ඛු සරාගං වාස්ස චිත්තං සරාගමස්ස චිත්තන්ති පජානාති. වීතරාගං වාස්ස චිත්තං වීතරාගමස්ස චිත්තන්ති පජානාති. සදොසං වාස්ස චිත්තං සදොසමස්ස චිත්තන්ති පජානාති. වීතදොසං වාස්ස චිත්තං වීතදොසමස්ස චිත්තන්ති පජානාති සමොහං වාස්ස චිත්තං සමොහමස්ස චිත්තන්ති පජානාති. වීතමොහං වාස්ස චිත්තං වීතමොහමස්ස චිත්තන්ති පජානාති. සංඛිත්තං වාස්ස චිත්තං සංඛිත්තමස්ස චිත්තන්ති පජානාති. වික්ඛිත්තං වාස්ස චිත්තං වික්ඛිත්තමස්ස චිත්තන්ති පජානාති. මහග්ගතං වාස්ස චිත්තං මහග්ගතමස්ස චිත්තන්ති පජානාති. අමහග්ගතං වාස්ස චිත්තං අමහග්ගතමස්ස චිත්තන්ති පජානාති. සඋත්තරං වාස්ස චිත්තං සඋත්තරමස්ස චිත්තන්ති පජානාති. අනුත්තරං වාස්ස චිත්තං අනුත්තරමස්ස චිත්තන්ති පජානාති. සමාහිතං වාස්ස චිත්තං සමාහිතමස්ස චිත්තන්ති පජානාති අසමාහිතං වා'ස්ස චිත්තං අසමාහිතම'ස්ස චිත්තන්ති පජානාති. විමුත්තං වා'ස්ස චිත්තං විමුත්තමස්ස චිත්තන්ති පජානාති අවිමුත්තං වා'ස්ස චිත්තං අවිමුත්තමස්ස චිත්තන්ති පජානාති. සො තං නිමිත්තං ආසෙවති, භාවෙති, බහුලීකරොති, ස්වාවත්ථිතං වවත්ථපෙති. සො තං නිමිත්තං ආසෙවිත්වා භාවෙත්වා බහුලීකරිත්වා ස්වාවත්ථිතං වවත්ථපෙත්වා අජ්ඣත්තබහිද්ධා චිත්තෙ චිත්තං උපසංහරති.

කථඤ්ච භික්ඛු අජ්ඣත්තබහිද්ධා චිත්තෙ චිත්තානුපස්සී විහරති: ඉධ භික්ඛු සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සංඛිත්තං වා චිත්තං සංඛිත්තං චිත්තන්ති පජානාති. වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති. අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති. සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති. අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති. සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති. අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති. එවං භික්ඛු අජ්ඣත්තබහිද්ධා චිත්තෙ චිත්තානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

460. අනුපස්සී'ති -පෙ- විහරතී'ති -පෙ- ආතාපී'ති -පෙ- සම්පජානො'ති -පෙ- සතිමා'ති -පෙ- විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සන්ති. තත්ථ කතමො ලොකො: තං යෙව චිත්තං ලොකො, පඤ්ච'පි උපාදානක්ඛන්ධා ලොකො.

තත්ථ කතමා අභිජ්ඣා: යො රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො. අයං වුච්චති අභිජ්ඣා.

කිසෙයින් මහණ මෙරමාගේ සිත්හි චිත්තානුදර්ශී ව වෙසේ ද යත් : මෙ සස්නෙහි මහණ තෙම සරාග වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත සරාග ' යයි දනගනී, වීතරාග වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත වීතරාග ' යයි දනගනී, සදෙස වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත සදෙස ' යයි දනගනී, වීතදෙස වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත වීතදෙස ' යයි දනගනී, සමොහ වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත සමොහ ' යයි දනගනී, වීතමොහ වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත වීතමොහ ' යයි දනගනී, සංක්ෂිප්ත වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත සංක්ෂිප්ත ' යයි දනගනී, වික්ෂිප්ත වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත වික්ෂිප්ත ' යයි දනගනී, මහද්ගත වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත මහද්ගත ' යයි දනගනී, අමහද්ගත වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත අමහද්ගත ' යයි දනගනී, සඋත්තර වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත සඋත්තර ' යයි දනගනී, අනුත්තර වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත අනුත්තර ' යයි දනගනී, සමාහිත වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත සමාහිත ' යයි දනගනී, අසමාහිත වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත අසමාහිත ' යයි දනගනී, අවිමුක්ත වූ හෝ ඔහුගේ සිත ' ඔහුගේ සිත අවිමුක්ත ' යයි දනගනී. හෙතෙම ඒ නිමිත්ත අසෙවනය කෙරෙයි, භාවනා කෙරෙයි, පුනපුනා වඩයි, මොනොවට නිශ්චය කෙරෙයි. හෙතෙම ඒ නිමිත්ත ආසෙවනය කොට භාවනා කොට බහුල කොට මැනැවින් නිශ්චය කොට අධ්‍යාත්මබාහිරචිත්තයෙහි සිත එළවයි.

කිසෙයින් මහණ කලෙකැ තමාගේ ද කලෙකැ මෙරමාගේ ද සිත්හි චිත්තානුදර්ශී ව වෙසේ ද යත් : මෙ සස්නෙහි මහණ සරාග වූ හෝ සිත ' සරාගසිතැ ' යි දනගනී. වීතරාග වූ හෝ සිත ' වීතරාගසිතැ ' යි දනගනී. සදෙස වූ හෝ සිත ' සදෙස සිතැ ' යි දනගනී. වීතදෙස වූ හෝ සිත ' වීතදෙස සිතැ ' යි දනගනී. සමොහ වූ හෝ සිත ' සමොහ සිතැ ' යි දනගනී. වීතමොහ වූ හෝ සිත ' වීතමොහ සිතැ ' යි දනගනී. හැකුළුණු හෝ සිත ' හැකුළුණු සිතැ ' යි දනගනී. විසුරුණු හෝ සිත විසුරුණු සිතැ ' යි දනගනී. මහද්ගත වූ හෝ සිත ' මහද්ගත සිතැ ' යි දනගනී. මහද්ගත නො වූ හෝ සිත ' මහද්ගත නො වූ සිතැ ' යි දනගනී. සඋත්තර වූ හෝ සිත ' සඋත්තර සිතැ ' යි දනගනී. අනුත්තර වූ හෝ සිත ' අනුත්තර සිතැ ' යි දනගනී. සමාහිත වූ හෝ සිත ' සමාහිත සිතැ ' යි දනගනී. අසමාහිත වූ හෝ සිත ' අසමාහිත සිතැ ' යි දනගනී. විමුක්ත වූ හෝ සිත ' විමුක්ත සිතැ ' යි දනගනී. අවිමුක්ත වූ හෝ සිත ' අවිමුක්ත සිතැ ' යි දනගනී. මෙසෙයින් මහණ කෙලෙස් තවන වැර ඇති ව සම්‍යග්ඥාන ඇති වැ සිහි ඇති ව චිත්ත සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාව හා දොම්නස දුරු කොට තමාගේ හා මෙරමාගේ සිත්හි සිත අනුව නුවණින් බලමින් වෙසේ.

460. අනුපස්සී යනු : . . . විහරති යනු : . . . ආතාපී යනු : . . . සම්පජානො යනු : . . . සතිමා යනු : . . . විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං යනු : එහි ලොක කවරෙ යත් : එ ම චිත්තය ' ලොක ' වෙයි. පඤ්චොපාදනස්කන්ධයෝ ම ලොක යි.

එහි ' අභිධ්‍යා ' කවර යත් : යම් රාගයෙක් බලවත් රාගයෙක් . . . චිත්තයාගේ ඇල්මෙක් වේ ද, මේ ' අභිධ්‍යා ' යි කියනු ලැබේ.

තත්ථ කතමං දොමනස්සං: යං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං චෙතොසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා. ඉදං වුච්චති දොමනස්සං. ඉති අයඤ්ච අභිජ්ඣා ඉදඤ්ච දොමනස්සං ඉමම්හි ලොකෙ විනීතා හොන්ති පටිවිනීතා සන්තා සමිතා වූපසන්තා අත්ථඞ්ගතා අබ්භත්ථඞ්ගතා අප්පිතා බ්‍යප්පිතා සොසිතා විසොසිතා බ්‍යන්තීකතා. තෙන වුච්චති විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සන්ති.

චිත්තානුපස්සනානිද්දෙසො.

---

461. කථඤ්ච භික්ඛු අජ්ඣත්තං ධම්මෙසු ධම්මානුපස්සී විහරති: ඉධ භික්ඛු සන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං අත්ථි මෙ අජ්ඣත්තං කාමච්ඡන්දො'ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං නත්ථි මෙ අජ්ඣත්තං කාමච්ඡන්දො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස උප්පාදො හොති. තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස කාමච්ඡන්දස්ස පහානං හොති. තඤ්ච පජානාති. යථා ච පහීනස්ස කාමච්ඡන්දස්ස ආයතිං අනුප්පාදො හොති තඤ්ච පජානාති.

සන්තං වා අජ්ඣත්තං ව්‍යාපාදං -පෙ- සන්තං වා අජ්ඣත්තං ථීනමිද්ධං -පෙ- සන්තං වා අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චං-පෙ-සන්තං වා අජ්ඣත්තං විචිකිච්ඡා අත්ථි මෙ අජ්ඣත්තං විචිකිච්ඡා'ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං විචිකිච්ඡං නත්ථි මෙ අජ්ඣත්තං විචිකිච්ඡා'ති පජානාති. යථා ච අනුප්පන්නාය විචිකිච්ඡාය උප්පාදො හොති තඤ්ච පජානාති. යථා ච උප්පන්නාය විචිකිච්ඡාය පහානං හොති තඤ්ච පජානාති. යථා ච පහීනාය විචිකිච්ඡාය ආයතිං අනුප්පාදො හොති තඤ්ච පජානාති.

462. සන්තං වා අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගං අත්ථි මෙ අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගං නත්ථි මෙ අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හොති තඤ්ච පජානාති.

සන්තං වා අජ්ඣත්තං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා අජ්ඣත්තං විරියසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා අජ්ඣත්තං පීතිසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා අජ්ඣත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා අජ්ඣත්තං සමාධිසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං අත්ථි මෙ අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගොති පජානාති. අසන්තං වා අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං නත්ථි මෙ අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හොති. තඤ්ච පජානාති. සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරොති ස්වාවත්ථිතං වවත්ථපෙති. සො තං නිමිත්තං ආසෙවිත්වා භාවෙත්වා බහුලීකරිත්වා ස්වාවත්ථිතං වවත්ථපෙත්වා බහිද්ධා ධම්මෙසු චිත්තං උපසංහරති.

එහි ' දෙමනස්ස ' කවරේ යත් : යම් චෛතසික අසාතයෙක් චෛතසික දුඃඛයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් අසාත-දුඃඛවෙදයිතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් අසාත-දුඃඛවෙදනාවක් වේ ද, මේ ' දෙමනස්ස ' යි කියනු ලැබේ. මෙසේ මේ අභිධ්‍යාව ද මේ දෙම්නස ද මේ චිත්ත සඞ්ඛ්‍යාත ලොකයෙහි බැහැර කරන ලද්දාහු වෙසෙසින් බැහැර කරන ලද්දාහු සන්හිඳුණාහු සන්හිඳුවන ලද්දාහු ව්‍යුපශම කරන ලද්දාහු නිරොධ සඞ්ඛ්‍යාත අස්තයට ගියාහු අතිශයින් අස්තයට ගියාහු නසන ලද්දාහු වෙසසින් නසන ලද්දාහු වියළන ලද්දාහු වෙසෙසින් වියළන ලද්දාහු විගතාන්ත කරන ලද්දාහු වෙත්. එහෙයින් ' විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං ' යි කියනු ලැබේ.

චිත්තානුපස්සනා නිර්දේශ යි.

---

461. කිසෙයින් මහණ තමාගේ (නීවරණාදි) ධර්මයන්හි ධර්මානුදර්ශී ව වෙසේ ද යත් : මෙ සස්නෙහි මහණ අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ කාමච්ඡන්ද නීවරණය ' මාගේ අධ්‍යාත්මයෙහි කාමච්ඡන්දනීවරණය ඇතැ ' යි දැනගනී. අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ කාමච්ඡන්දය ' මාගේ අධ්‍යාත්මයෙහි කාමච්ඡන්දය නැතැ ' යි දැනගනී. නූපන් කාමච්ඡන්දයාගේ ඉපැද්ම යම් කරුණෙකින් වේ නම්, එය ද දැනගනී. උපන් කාමච්ඡන්දයාගේ ප්‍රහාණය යම් කරුණෙකින් වේ නම් එය ද දැනගනී. ප්‍රහීණ වූ කාමච්ඡන්දයාගේ මතු නො ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එකරුණ ද දැනගනී.

අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ ව්‍යාපාද නීවරණය . . . අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ ථීනමිද්ධනීවරණය . . . අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ උද්ධච්චකුක්කුච්ච නීවරණය . . . අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ විචිකිච්ඡානීවරණය ' මාගේ අධ්‍යාත්මයෙහි විචිකිච්ඡානීවරණය ඇතැ ' යි දැනගනී. අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ විචිකිච්ඡානීවරණය ' මාගේ අධ්‍යාත්මයෙහි විචිකිච්ඡානීවරණය නැතැ ' යි දැනගනී. නූපන් විචිකිච්ඡානීවරණයාගේ ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එ කරුණ ද දැනගනී. උපන් විචිකිච්ඡානීවරණයාගේ ප්‍රහාණය යම් කරුණෙකින් වේ නම් එ කරුණ ද දැනගනී. ප්‍රහීණ වූ විචිකිච්ඡානීවරණයාගේ මතු නො ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එ කරුණ ද දැනගනී.

462. අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය ' මාගේ අධ්‍යාත්මයෙහි ස්මෘතිසම්බොධ්‍යඞ්ගය ඇතැ ' යි දැනගනී. අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය ' මාගේ අධ්‍යාත්මයෙහි ස්මෘතිසම්බොධ්‍යඞ්ගය නැතැ ' යි දැනගනී. නූපන් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයාගේ උත්පාදය, යම් කරුණෙකින් වේ නම් එය ද දැනගනී. උපන් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයාගේ භාවනායෙන් පරිපූර්ණ වීම යම් කරුණෙකින් වේ නම් එය ද දැනගනී.

අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය . . . අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ වීර්‍යසම්බොධ්‍යඞ්ගය . . . අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය . . . අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය . . . අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ සමාධිසම්බොධ්‍යඞ්ගය . . . අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය ' මාගේ අධ්‍යාත්මයෙහි උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය ඇතැ ' යි දැනගනී. අද්ධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය ' මාගේ අධ්‍යාත්මයෙහි උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය නැතැ ' යි දැනගනී. නූපන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එය ද දැනගනී. උපන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ භාවනායෙන් පරිපූර්ණ වීම යම් කරුණෙකින් වේ නම් එය ද දැනගනී. හෙතෙම ඒ ධර්මනිමිත්ත ආසෙවනය කෙරෙයි, භාවනා කෙරෙයි, බහුල කෙරෙයි, මොනොවට නිශ්චය කෙරේ. හෙතෙම ඒ නිමිත්ත ආසෙවනය කොට භාවනා කොට පුනපුනා වඩා මැනැවින් නිශ්චය කොට බාහිරධර්මයන්හි සිත එළවයි.

463 කථඤ්ච භික්ඛු බහිද්ධා ධම්මෙසු ධම්මානුපස්සී විහරති: ඉධ භික්ඛු සන්තං වා'ස්ස කාමච්ඡන්දං අත්ථි'ස්ස කාමච්ඡන්දො'ති පජානාති. අසන්තං වාස්ස කාමච්ඡන්දං නත්ථිස්ස කාමච්ඡන්දො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස කාමච්ඡන්දස්ස පහානං හොති තඤ්ච පජානාති. යථා ච පහීනස්ස කාමච්ඡන්දස්ස ආයතිං අනුප්පාදො හොති තඤ්ච පජානාති.

සන්තං වාස්ස ව්‍යාපාදං -පෙ- සන්තං වා'ස්ස ථීනමිද්ධං -පෙ- සන්තං වා'ස්ස උද්ධච්චකුක්කුච්චං -පෙ- සන්තං වා'ස්ස විචිකිච්ඡං අත්ථි'ස්ස විචිකිච්ඡා'ති පජානාති, අසන්තං වා'ස්ස විචිකිච්ඡං නත්ථි'ස්ස විචිකිච්ඡා'ති පජානාති. යථා ච අනුප්පන්නාය විචිකිච්ඡාය උප්පාදො හොති තඤ්ච පජානාති. යථා ච උප්පන්නාය විචිකිච්ඡාය පහානං හොති තඤ්ච පජානාති යථා ච පහීනාය විචිකිච්ඡාය ආයතිං අනුප්පාදො හොති තඤ්ච පජානාති.

සන්තං වා'ස්ස සතිසම්බොජ්ඣඞ්ගං අත්ථි'ස්ස සතිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. අසන්තං වා'ස්ස සතිසම්බොජ්ඣඞ්ගං නත්ථි'ස්ස සතිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හොති තඤ්ච පජානාති. සන්තං වා'ස්ස ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා'ස්ස වීරියසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා'ස්ස පීතිසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා'ස්ස පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා'ස්ස සමාධිසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා'ස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං අත්ථි'ස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. අසන්තං වා'ස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං නත්ථි'ස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හොති තඤ්ච පජානාති. සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරොති ස්වාවත්ථිතං වවත්ථපෙති, සො තං නිමිත්තං ආසෙවිත්වා භාවෙත්වා බහුලීකරිත්වා ස්වාවත්ථිතං වවත්ථපෙත්වා අජ්ඣත්තබහිද්ධා ධම්මෙසු චිත්තං උපසංහරති.

464. කථඤ්ච භික්ඛු අජ්ඣත්තබහිද්ධා ධම්මෙසු ධම්මානුපස්සී විහරති: ඉධ භික්ඛු සන්තං වා කාමච්ඡන්දං අත්ථි කාමච්ඡන්දො'ති පජානාති. අසන්තං වා කාමච්ඡන්දං නත්ථි කාමච්ඡන්දො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස කාමච්ඡන්දස්ස පහානං හොති තඤ්ච පජානාති. යථා ච පහීනස්ස කාමච්ඡන්දස්ස ආයතිං අනුප්පාදො හොති තඤ්ච පජානාති.

සන්තං වා ව්‍යාපාදං -පෙ- සන්තං වා ථීනමිද්ධං -පෙ- සන්තං වා උද්ධච්චකුක්කුච්චං -පෙ- සන්තං වා විචිකිච්ඡං අත්ථි විචිකිච්ඡා'ති පජානාති. අසන්තං වා විචිකිච්ඡං නත්ථි විචිකිච්ඡා'ති පජානාති. යථා ච අනුප්පන්නාය විචිකිච්ඡාය උප්පාදො හොති තං ච පජානාති. යථා ච උප්පන්නාය විචිකිච්ඡාය පහානං හොති තඤ්ච පජානාති, යථා ච පහීනාය විචිකිච්ඡාය ආයතිං අනුප්පාදො හොති තං ච පජානාති.

463. කිසෙයින් මහණ මෙරමාගේ (නීවරණාදි) ධර්මයන්හි ධර්මය අනුව බලමින් වෙසේ ද යත්: මෙ සස්නෙහි මහණ තෙම විද්‍යමාන වූ හෝ ඔහුගේ කාමච්ඡන්දය 'ඔහුගේ කාමච්ඡන්දය ඇතැ' යි දනගනී. අවිද්‍යමාන වූ හෝ ඔහුගේ කාමච්ඡන්දය 'ඔහුගේ කාමච්ඡන්දය නැතැ' යි දනගනී. නූපන් කාමච්ඡන්දයාගේ ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එ කරුණ ද දනගනී. උපන් කාමච්ඡන්දයාගේ ප්‍රහාණය යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී. ප්‍රහීණ වූ කාමච්ඡන්දයාගේ මතු නො ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී.

විද්‍යමාන වූ හෝ ඔහුගේ ව්‍යාපාදනීවරණය . . . විද්‍යමාන වූ හෝ ඔහුගේ ථීනමිද්ධ නීවරණය . . . විද්‍යමාන වූ හෝ ඔහුගේ උද්ධච්චකුක්කුච්චනීවරණය . . . විද්‍යමාන වූ හෝ ඔහුගේ විචිකිච්ඡානීවරණය 'ඔහුගේ විචිකිච්ඡානීවරණය ඇතැ' යි දනගනී. අවිද්‍ය මාන වූ හෝ ඔහුගේ විචිකිච්ඡානීවරණය ඔහුගේ විචිකිච්ඡානීවරණය නැතැ'යි දනගනී. නූපන් විචිකිත්සාවගේ ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී. උපන් විචිකිත්සාවගේ ප්‍රහාණය යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී. ප්‍රහීණ විචිකිත්සාවගේ මතු නො ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී.

විද්‍යමාන වූ හෝ ඔහුගේ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය 'ඔහුගේ ස්මෘතිසම්බොධ්‍යඞ් ගය ඇතැ' යි දනගනී. අවිද්‍යමාන වූ හෝ ඔහුගේ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය 'ඔහුගේ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය නැතැ' යි දනගනී. නූපන් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයාගේ ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී. උපන් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයාගේ භාවනායෙන් පරිපූර්ණ වීම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී.

විද්‍යමාන වූ හෝ ඔහුගේ ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය . . . විද්‍යමාන වූ හෝ ඔහුගේ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය . . . විද්‍යමාන වූ හෝ ඔහුගේ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය . . . විද්‍යමාන වූ හෝ ඔහුගේ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය . . . විද්‍යමාන වූ හෝ ඔහුගේ සමාධිසම්බොධ්‍යඞ්ගය . . . විද්‍යමාන වූ හෝ ඔහුගේ උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය 'ඔහුගේ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය ඇතැ' යි දනගනී. අවිද්‍යමාන වූ හෝ ඔහුගේ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය 'ඔහුගේ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය නැතැ' යි දනගනී. නූපන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී. උපන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ භාවනායෙන් පරිපූර්ණ වීම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී, හෙතෙම ඒ ධර්මනිමිත්ත ආසෙවනය කෙරෙයි, භාවනා කෙරෙයි, පුනපුනා වඩයි, මොනොවට නිශ්චය කෙරේ. හෙතෙම ඒ නිමිත්ත ආසෙවනය කොට භාවනා කොට පුනපුනා වඩා මැනැවින් නිශ්චය කොට තමාගේ හා මෙරමාගේ (නීවරණාදි) ධර්මයන්හි සිත එළවයි.

464. කිසෙයින් මහණ කලෙකැ තමාගේ ද කලෙකැ මෙරමාගේ ද (නීවරණාදි) ධර්මයන්හි ධර්මානුදර්ශී ව වෙසේ ද යත්: මෙ සස්නෙහි මහණ තෙම විද්‍යමාන වූ හෝ කාමච්ඡන්දය 'කාමච්ඡන්දය ඇතැ' යි දනගනී. අවිද්‍යමාන වූ හෝ කාමච්ඡන්දය 'කාමච්ඡන්දය නැතැ' යි දනගනී. නූපන් කාමච්ඡන්දයාගේ ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී. උපන් කාමච්ඡන්දයාගේ ප්‍රහාණය යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී. ප්‍රහීණ වූ කාමච්ඡන්දයාගේ මතු නො ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී.

විද්‍යමාන වූ හෝ ව්‍යාපාදය . . . විද්‍යමාන වූ හෝ ථීනමිද්ධය . . . විද්‍යමාන වූ හෝ උද්ධච්චකුක්කුච්චය . . . විද්‍යමාන වූ හෝ විචිකිත්සාව 'විචිකිත්සාව ඇතැ' යි දනගනී. අවිද්‍යමාන වූ හෝ විචිකිත්සාව 'විචිකිත්සාව නැතැ' යි දනගනී. නූපන් විචිකිත්සාව ගේ ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී. උපන් විචිකිත්සාව ගේ ප්‍රහාණය යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී. ප්‍රහීණ වූ විචිකිත්සාවගේ මතු නො ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී.

465. සන්තං වා සතිසම්බොජ්ඣඞ්ගං අත්ථි සතිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති, අසන්තං වා සතිසම්බොජ්ඣඞ්ගං නත්ථි සතිසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. යථා ච අනුප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හොති තඤ්ච පජානාති

සන්තං වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා විරියසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා පීතිසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා සමාධිසම්බොජ්ඣඞ්ගං -පෙ- සන්තං වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං අත්ථි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො'ති පජානාති. අසන්තං වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං නත්ථි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො'ති පජානාති, යථා ච අනුප්පන්නස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හොති තඤ්ච පජානාති එවං භික්ඛු අජ්ඣත්තබහිද්ධා ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

466. අනුපස්සී'ති තත්ථ කතමා අනුපස්සනා: යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, අයං වුච්චති අනුපස්සනා. ඉමාය අනුපස්සනාය උපෙතො හොති සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො. තෙන වුච්චති අනුපස්සීති.

විහරතී'ති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති චරති විහරති. තෙන වුච්චති විහරතී'ති.

ආතාපී'ති. තත්ථ කතමං ආතප්පං: යො චෙතසිකො විරියාරම්භො -පෙ- සම්මාවායාමො, ඉදං වුච්චති ආතප්පං. ඉමිනා ආතප්පෙන උපෙතො හොති -පෙ- සමන්නාගතො. තෙන වුච්චති ආතාපී'ති.

සම්පජානො'ති තත්ථ කතමං සම්පජඤ්ඤං: යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති සම්පජඤ්ඤං. ඉමිනා සම්පජඤ්ඤෙන උපෙතො හොති සමුපෙතො -පෙ- සමන්නාගතො තෙන වුච්චති සම්පජානො'ති.

සතිමා'ති තත්ථ කතමා සති: යා සති අනුස්සති -පෙ- සම්මාසති. අයං වුච්චති සති. ඉමාය සතියා උපෙතො හොති සමුපෙතො -පෙ- සමන්නාගතො. තෙන වුච්චති සතිමා'ති.

විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්ස'න්ති. තත්ථ කතමො ලොකො: තෙ'ව ධම්මා ලොකො, පඤ්ච'පි උපාදානක්ඛන්ධා ලොකො. අයං වුච්චති ලොකො.

තත්ථ කතමා අභිජ්ඣා: යො රාගො සාරාගො -පෙ- චිත්තස්ස සාරාගො. අයං වුච්චති අභිජ්ඣා.

465. විද්‍යමාන වූ හෝ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය 'ස්මෘතිසම්බොධ්‍යඞ්ගය ඇතැ' යි දනගනී. අවිද්‍යමාන වූ හෝ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය 'ස්මෘතිසම්බොධ්‍යඞ්ගය නැතැ' යි දනගනී. නූපන් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයාගේ ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී. උපන් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයාගේ භාවනායෙන් පරිපූර්ණ වීම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී.

විද්‍යමාන වූ හෝ ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය . . . විද්‍යමාන වූ හෝ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය . . . විද්‍යමාන වූ හෝ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය . . . විද්‍යමාන වූ හෝ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය . . . විද්‍යමාන වූ හෝ සමාධිසම්බොධ්‍යඞ්ගය . . . විද්‍යමාන වූ හෝ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය 'උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය ඇතැ' යි දනගනී. අවිද්‍යමාන වූ හෝ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය 'උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය නැතැ' යි දනගනී. නූපන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ ඉපැද්ම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී. උපන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ භාවනායෙන් පරිපූර්ණ වීම යම් කරුණෙකින් වේ නම් එය ද දනගනී. මෙසෙයින් මහණ තෙම කෙලෙස් තවන වැර ඇති ව සම්‍යග්ඥාන ඇති ව සිහි ඇති ව ධර්ම සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාව හා දෙම්නස දුරු කොට තමාගේ හා මෙරමාගේ (නීවරණාදි) ධර්මයන්හි ධර්මානුදර්ශී ව වෙසේ.

466. 'අනුපස්සී' යනු : එහි 'අනුපස්සනා' කවර යත් : යම් ප්‍රඥවක් ප්‍රජානනාකාර යෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද, මේ 'අනුපස්සනා' යි කියනු ලැබේ. මේ අනුපස්සනායෙන් යුක්ත වූයේ සමුපෙත වූයේ එළඹසිටියේ මොනොවට එළඹසිටියේ නො වෙන් වූයේ පිරිපුන් වූයේ සමන්විත වූයේ වේ. එහෙයින් 'අනුපස්සී' යි කියනු ලැබේ.

'විහරති' යනු : ඉරියවු පවත්වයි, ඉරියවු උපදවයි, ඉරියවු රකියි, යපනය කෙරෙයි, යාපනය කෙරෙයි, හැසිරෙයි, වෙසෙයි. එහෙයින් 'විහරති' යි කියනු ලැබේ.

'ආතාපී' යනු : එහි 'ආතප්ප' කවරෙ යත් : යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයෙක් . . ., සම්‍යග්ව්‍යායාමයෙක් වේ ද, මේ 'ආතප්ප' යි කියනු ලැබේ. මේ ආතප්පයෙන් යුක්ත වූයේ . . . සමන්වාගත වූයේ වෙයි. එහෙයින් 'ආතාපී' යි කියනු ලැබේ.

'සම්පජානො' යනු : එහි 'සම්පජඤ්ඤ' කවරෙ යත් : යම් ප්‍රඥවක් ප්‍රජානනාකාර යෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද, මේ 'සම්පජඤ්ඤ' යි කියනු ලැබේ. මේ සම්පජඤ්ඤයෙන් යුක්ත වූයේ සමුපෙත වූයේ . . . සමන්වාගත වූයේ වෙයි. එහෙයින් 'සම්පජාන' යි කියනු ලැබේ.

'සතිමා' යනු : එහි 'සති' කවර යත් : යම් ස්මෘතියක් අනුස්මෘතියක් . . . සම්‍යක්ස්මෘතියක් වේ ද, මේ 'සති' යි කියනු ලැබේ. මේ සතියෙන් යුක්ත වූයේ සමුපෙත වූයේ . . . සමන්වාගත වූයේ වෙයි. එහෙයින් 'සතිමා' යි කියනු ලැබේ.

